සැ. යු. -2009.06.19 දින පළ වූ අංක 1,607 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,608 - 2009 ජූනි මස 26 වැනි සිකුරාදා - 2009.06.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | රජයේ නිවේදන ... ... ... | 842 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 832 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 838 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 842 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 838 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 849 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - දේශමාන්‍ය රවීන්ද්‍ර වනිගසේකර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2009, පෙබරවාරි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ලංකා නේවර් ලවින් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2009 අප්‍රේල් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා ජාත්‍යන්තර සහයෝගිතා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2009 අප්‍රේල් මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජූලි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ජූනි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 190

DRF/RECT/44(VIII).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

**නිල ස්ථිර කිරීම**

1. පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිණියගේ නිලය, 2007 අප්‍රේල් මස 20 වැනි දින සිට ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ජෙනරල් හෙල්මාලි ඉන්දිරා ගීතාන්ජලී විජේරත්න, යූඑස්පී

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්පී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

06-487

---

2009 අංක 191

DRF/21/RECT/2747.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2008 නොවැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමතර කර ඇත.

බ්‍රිගේඩියර් කටුවපිටියගේ සරත් ප්‍රනාන්දු, ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී (නි/50786)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

06-551

---

2009 අංක 192

DRF/RECT/1105/ AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිණිය, 2008 ඔක්තෝබර් මස 18 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමතර කර ඇත.

කර්නල් අගම්පොඩි චල්සි උදුලා ක්‍රිෂ්ණරත්න (නි/60040)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

06-547

---

2009 අංක 193

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

2008 ජනවාරි මස 01 වැනි දින සිට ලුතිතන් කර්නල් වශයෙන්

නි/3065 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) වයිකේ අබේරත්න බණ්ඩා
නි/3047 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එම්එම්යූ මුණසිංහ
නි/3063 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එන්කේ වක්කුඹුර
නි/3127 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එම්ආර්යූ ගුණවර්ධන
නි/3145 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ජේඑම්අයි අධිකාරි
නි/3136 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එම්එල්එම් නිමල්
නි/3048 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එස්එල් ද ලැනරෝල්
නි/3124 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එස්ජේඑස්ටී ධර්මපාල

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009,
කොළඹ දී ය.

06-485

2009 අංක 194

DRF/21/RECT/2739.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2008 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමතර කර ඇත.

ලුතිතන් කර්නල් වික්‍රමරත්න කොඩිප්පිලි ආරච්චි පටබැඳිගේ ජනක් අබේසිංහ, ශ්‍රීලයුපොදුසේබ (නි/60335)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

06-550

---

2009 අංක 195

DRF/21/RECT/2745.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2008 දෙසැම්බර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් කර්නල් විතානලාගේ ශාන්ත පුෂ්පකුමාර් ද මෙල් කරෙ (නි/60173)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2008 දෙසැම්බර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් කර්නල් විතානලාගේ ශාන්ත පුෂ්පකුමාර් ද මෙල්, කරෙ (නි/60173)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 28 දින,
කොළඹ දී ය.

06-519

---

2009 අංක 196

DRF/21/RECT/2736.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2008 මාර්තු මස 10 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (තාවකාලික මේජර්) ෂමින්ද රත්සර විජේතුංග, ආර්එස්පී ගරෙ (නි/62314)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2008 මාර්තු මස 11 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ෂමින්ද රත්සර විජේතුංග, ආර්එස්පී ගරෙ (නි/62314)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

06-518

2009 අංක 197

DRF/21/RECT/2734.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2008 අගෝස්තු මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත ෴

කපිතන් (තාවකාලික මේජර්) විතාන පතිරනගේ රනලාල් සම්පත් විතාන, ශ්‍රීලංසිරෙ (නි/61814)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2008 අගෝස්තු මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමතර කර ඇත.

මේජර් විතාන පතිරනගේ රනලාල් සම්පත් විතාන, ශ්‍රීලංසිරෙ (නි/61814)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

06-546

---

2009 අංක 198

DRF/RECT/580(V) AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීම

1. පහත නම් සඳහන් නිලධාරින්ගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ ෴

(අ) කපිතන් සකලසූරිය අප්පුහාමිලාගේ අජිත් සුසන්ත සකලසූරිය, ගරෙ (නි/64884) - 2008 සැප්තැම්බර් මස 04 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම.

(ආ) කපිතන් සමින්ද තිරානගම, ශ්‍රීලංසිරෙ (නි/65235) - 2008 සැප්තැම්බර් මස 02 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

06-514

---

2009 අංක 199

DRF/21/RECT/2731.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2008 සැප්තැම්බර් මස 04 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (තාවකාලික මේජර්) සේනානායක අමරසිංහ මොහොට්ටි අප්පුහාමිලාගේ මනුප්‍රිය හරණ සේනානායක ආර්ඩබ්පී පීඑස්සී ශ්‍රීලංසිරෙ (නි/61357)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2008 සැප්තැම්බර් මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් සේනානායක අමරසිංහ මොහොට්ටි අප්පුහාමිලාගේ මනුප්‍රිය හරණ සේනානායක ආර්ඩබ්පී පීඑස්සී ශ්‍රීලංසිරෙ (නි/61357)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් 16 වැනි දින,
කොළඹ දී ය.

06-521

2009 අංක 200

DRF/21/RECT/2730.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරි 2008 සැප්තැම්බර් මස 15 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම 1981 විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ 33 වගන්තිය යටතේ අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (තාවකාලික මේජර්) පොන්නිම්බදුගේ පැට්‍රික් බිමල් ප්‍රිශාන්ත පෙරේරා ශ්‍රීලයුයුබ (නි/61093)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් 16 වැනි දින,
කොළඹ දී ය.

06-522

---

DRF/21/RECT/2746.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2006 ජූලි මස 11 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් දමින්ද තාරක සල්ගාදු, ශ්‍රීලයුපොදුසේබ (නි/65770)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

06-517

2009 අංක 201

DRF/21/RECT/2754.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරි 2008 අප්‍රේල් මස 25 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමතර කර ඇත.

කපිතන් මේකල ප්‍රසාද් මහදිවුල්වැව, ශ්‍රීලසසබ (නි/63171)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

06-548

---

2009 අංක 202

DRF/RECT/495.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අන්තර් ඒකක මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2008 ජූනි මස 02 දින සිට කමාන්ඩෝ රෙජිමේන්තුව වෙතින් ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තුව වෙත මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් වීරකෝන් මුදියන්සේලාගේ පරාක්‍රම ප්‍රභාත් වීරකෝන් - ගැමුණු හේවා බළඇණිය

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

06-488/3

2009 අංක 203

DRF/21/RECT/2732.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2008 සැප්තැම්බර් මස 11 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) යක්දෙහි ආරච්චිගේ ලක්ෂ්මන් සූරියබණ්ඩාර ශ්‍රීලවියාඉ (නි/63774)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2008 සැප්තැම්බර් මස 11 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) යක්දෙහි ආරච්චිගේ ලක්ෂ්මන් සූරියබණ්ඩාර ශ්‍රීලවියාඉ (නි/63774)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් 16 වැනි දින,
කොළඹ දී ය.

06-520

---

DRF/21/RECT/2729.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම් සඳහන් නිලධාරී 2008 නොවැම්බර් මස 15 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික කපිතන් හේරත් මුදියන්සේලාගේ නලින් චමින්ද විජේරත්න, ශ්‍රීලංසිරෙ (නි/64702)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

06-516

---

2009 අංක 204

DRF/21/RECT/2741.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2008 මාර්තු මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (උපකරණ පාලක) පත්තිනියා දූරගේ සරත් සුමනසිරි, ගරෙ (නි/64383)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

06-552

---

2009 අංක 205

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම

2007 ඔක්තෝබර් මස 01 වෙනි දින සිට ලුතිනන් වශයෙන්

නි/6063 2/ලුතිතන් ආර්පීඑන් චන්ද්‍රසේකර

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය,
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009,
කොළඹ දී ය.

06-486

---

2009 අංක 206

DRF/21/RECT/2742.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2008 අගෝස්තු මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමතර කර ඇත.

ලුතිතන් (උපකරණ පාලක) රණසිංහ ආරච්චිගේ උපාලි පෙරේරා, ශ්‍රීලපාභ (නි/64381)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2008 අගෝස්තු මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමතර කර ඇත.

ලුතිතන් (උපකරණ පාලක) රණසිංහ ආරච්චිගේ උපාලි පෙරේරා, ශ්‍රීලපාභ (නි/64381)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

06-515

2009 අංක 207

DRF/RECT/495.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අන්තර් රෙජිමේන්තු මාරුවීමක්

පහත නම සඳහන් නිලධාරී 2008 ජුලි මස 08 වන දින සිට ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමී බලකායේ සිට ශ්‍රී ලංකා රයිෆල් බලකාය වෙත අන්තර් රෙජිමේන්තු මාරුවීම් අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජයසිංහ කන්කානම්ලාගේ නලින් සමීර ජයසිංහ ශ්‍රීලයුපුබ (නි/3682)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් 29 වැනි දින,
කොළඹ දී ය.

06-488/1

---

2009 අංක 208

DRF/RECT/495.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අන්තර් රෙජිමේන්තු මාරුවීමක්

පහත නම සඳහන් නිලධාරී 2008 අගෝස්තු මස 04 වැනි දින සිට ශ්‍රී ලංකා යුද හමුදා සිංහ රෙජිමේන්තුවේ සිට සන්නද්ධ බුද්ධි බලකාය වෙත අන්තර් රෙජිමේන්තු මාරුවීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමතර කර ඇත.

මේජර් රණසිංහ ආරච්චිගේ ජානක ගුණසේකර, ශ්‍රීලංසිරෙ (නි/3572)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

06-549

2009 අංක 209

DRF/RECT/495.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අන්තර් රෙජිමේන්තු මාරුවීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 නොවැම්බර් මස 30 දින සිට ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ සිට සන්නද්ධ බුද්ධි බළකාය (ස්වේච්ඡා) වෙත අන්තර් රෙජිමේන්තු මාරුවීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

තාවකාලික මේජර් රොහී බර්තෝලමියුස් ශ්‍රීලංජාආබමු (නි/3597)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

06-488/2

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 210

අමාත්‍ය මණ්ඩල විසින් පහත සඳහන් පත්වීම කර ඇත :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ඒ. ජී. ධර්මදාස මහතා 2008 දෙසැම්බර් මස 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වශයෙන්.

06-468

## වෙනත් පත්කිරීම් ආදිය

2009 අංක 211

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

ගුවන් හමුදාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලයට උසස් කෙරේ :

ෆ්ලයිං ඔෆිසර් හේනෙගම මුතුකුමාරනගේ රජනි (02092) පරිපාලන/රෙජී - 2003.09.01 ;
ෆ්ලයිං ඔෆිසර් නාගොඩ විතානගේ සරත් (02204) පාරිපාලන/රෙජී - 2004.12.30 ;
ෆ්ලයිං ඔෆිසර් පොල්ගම්පොලගේ ජයන්ත කුමාර පොල්ගම්පොල (02376) පරිපාලන/රෙජී - 2005.07.12 ;
ෆ්ලයිං ඔෆිසර් කොඩිතුවක්කු කංකානම්ගේ ජීවන විමුක්ති (02175) උපකරණ - 2005.12.02 ;
ෆ්ලයිං ඔෆිසර් කසදොරුගේ නුවන් පියුශාන් පෙරේරා (02214) පාරිපාලන/රෙජී - 2005.12.02 ;
ෆ්ලයිං ඔෆිසර් පනික්ක මුදියන්සෙලාගේ නුවන් සුදාරක කුලතුංග (02266) පාරිපාලන/රෙජී - 2005.12.02 ;
ෆ්ලයිං ඔෆිසර් ජයන්ත වානක මානවඩු (02289) පරිපාලන/රෙජී - 2005.12.02 ;
ෆ්ලයිං ඔෆිසර් කැකුලගේ දොන් මුදිත තුෂාර ගුණරත්න (02290) පරිපාලන/රෙජී - 2005.12.02 ;
ෆ්ලයිං ඔෆිසර් ජයසූරිය මහතෙල්ගේ ලක්ශාන්ත ප්‍රදීප් පීරිස් (02306) කාර්මි/ඉංජී - 2005.12.02 ;
ෆ්ලයිං ඔෆිසර් මහීපාල මුදලිගේ ජිනේන්ද්‍ර විජයරත්න (02308) කාර්මි/සංඥා - 2005.12.02 ;
ෆ්ලයිං ඔෆිසර් දිනෙත් එරන්ද හීගනගේ (02322) කාර්මි/සංඥා - 2006.02.08 ;
ෆ්ලයිං ඔෆිසර් දමින්ද රඹුක්වැල්ල (02337) නි. පො. රා. - 2006.03.22 ;
ෆ්ලයිං ඔෆිසර් ශමිල් නිරෝෂන් කිරිවැල්ල (02328) කාර්මි/ඉංජී - 2006.03.22 ;
ෆ්ලයිං ඔෆිසර් සමන්ද මරක්කල අසංක රොෂාන් සිල්වා (02340) කාර්මි/ඉංජී - 2006.03.22 ;
ෆ්ලයිං ඔෆිසර් බිලින්ගහමුල ගෙදර අතුල ප්‍රේමචන්ද්‍ර (02215) පරිපාලන/රෙජී - 2006.04.28 ;
ෆ්ලයිං ඔෆිසර් හේරත් මුදියන්සෙලාගේ ලලිත් සමීර ලංකාතිලක (02330) කාර්මි/සංඥා - 2006.05.10 ;
ෆ්ලයිං ඔෆිසර් ලලිත් සපුමල් ජයවීර (02324) උපකරණ - 2006.05.10 ;
ෆ්ලයිං ඔෆිසර් රත්නායක මුදියන්සෙලාගේ අසංක උදය රත්නායක (02339) නි. පො. රා. - 2006.05.10 ;
ෆ්ලයිං ඔෆිසර් ගයාන් සංජය පෙරේරා කහඳවලආරච්චි (02326) පරිපාලන - 2006.05.10 ;
ෆ්ලයිං ඔෆිසර් චමින්ද සම්පත් පියසුන්දර (02334) පරිපාලන/රෙජී - 2006.06.27 ;
ෆ්ලයිං ඔෆිසර් කපුගම හීගනගේ ලලිත් ක්‍රිශාන්ත කපුගම (02327) නි. පො. රා. - 2006.06.27 ;
ෆ්ලයිං ඔෆිසර් පාදුක්කගේ අමිත් ප්‍රසන්න ප්‍රියදර්ශන (02336) උපකරණ - 2006.06.27 ;
ෆ්ලයිං ඔෆිසර් ද සිල්වා මාලිත සජීව රංගොඩගේ (02338) කාර්මි/ඉංජී - 2006.06.27 ;
ෆ්ලයිං ඔෆිසර් වික්‍රමසිංහ මුදියන්සෙලාගේ දිශාන්ත තෙන්නකෝන් බණ්ඩාර (02320) පරිපාලන/රෙජී - 2006.06.27 ;
ෆ්ලයිං ඔෆිසර් ගොතටුව ගෙදර චින්තක ප්‍රසන්න ගුණරත්න (02335) නි. පො. රා. - 2006.06.27 ;
ෆ්ලයිං ඔෆිසර් ප්‍රියංක රාජගුරු හේරත් (02323) නි. පො. රා. - 2006.06.27 ;

ෆ්ලයිං ඔෆිසර් දොන් ලශංක අසිත මානගේ (02331) කාර්මි/ඉංජි - 2006.06.27 ;

ෆ්ලයිං ඔෆිසර් ප්‍රභාත් ශ්‍රී විජය මොල්ලිගොඩ (02332) පරිපාලන/රෙජි - 2006.06.27 ;

ෆ්ලයිං ඔෆිසර් ජයසිංහ මුදියන්සෙලාගේ සනත් චන්ද්‍රන බණ්ඩාර (02319) පරිපාලන/රෙජි - 2006.06.27 ;

ෆ්ලයිං ඔෆිසර් දොන් චන්දන පුෂ්පකුමාර මුණසිංහ (02333) පරිපාලන/රෙජි - 2006.06.27 ;

ෆ්ලයිං ඔෆිසර් රංකොත් ගෙදර ජනක ප්‍රසාද් කොටින්කඩුව (02329) පරිපාලන/රෙජි - 2006.06.27 ;

ෆ්ලයිං ඔෆිසර් මැදගමගේ දිහාන් රාජිත ප්‍රනාන්දු (02345) නි. පො. රා. - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් ගුරුගල්ගොඩ මුදියන්සෙලාගේ ඉන්දික ප්‍රේමදාස (02346) නි. පො. රා. - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් වත්සල විරාජ් කරුණාරත්න වීරමන් (02347) නි. පො. රා. - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් මෙත්තසිංහ ආරච්චිගේ රෙහාන් ඇන්ටන් ප්‍රනාන්දු (02348) නි. පො. රා. - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් මුතුකුට්ටි ආරච්චිගේ සුරංග හේශාල් (02349) කාර්මි/සංඥා - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් ප්‍රමුදිත ලියන ගුණවර්ධන (02350) කාර්මි/සංඥා - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් ඉජේෂ් චන්ද්‍රතිලක (02351) කාර්මි/සංඥා - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් මන දේවගේ නන්දන ප්‍රසාද් අමරජීව (02352) කාර්මි/සංඥා - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් තඹදිය ලිලාන් චම්පික ජයසිංහ (02353) උපකරණ - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් රඹුක්කනගේ ජානක ප්‍රියශාන්ත (02354) උපකරණ - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් ලියනආරච්චිගේ දොන් විකෂිත් ලලින්ද (02355) උපකරණ - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් හන්තාන ආරච්චිලාගේ නාලක නලින් බණ්ඩාර ඇටිපොල (02356) උපකරණ - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් දොන් සූරියාරච්චි චමින්ද ප්‍රසාද් විජේසිංහ (02357) උපකරණ - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් කීරකංකානම්ගේ ජානක සුරේෂ් ප්‍රනාන්දු (02358) පරිපාලන - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් ගුරුසිංහ චතුර ජයනාත් වික්‍රමසිංහ (02359) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් අසේල ජූඩ් රංගන කුරුවිටආරච්චි (02360) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් මොහමඩ් තවුෆික් මොහමඩ් සෆ්රාස්ක් (02361) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් වික්‍රම ආරච්චිගේ ප්‍රභාත් මංජුල (02362) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් ගුරුසිංහ දේවගේ දිනේෂ් පුෂ්ප කුමාර හතුරුසිංහ (02363) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් චානක නිලන්ත කරවිට (02365) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් කෝනාර මුදියන්සෙලාගේ කණිෂ්ක බණ්ඩාර ජයසේකර (02366) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් අමිල සුමාල් කරුණාරත්න (02367) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් බුද්ධික ප්‍රසාද් විදානපතිරණ (02368) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් හරගලය වත්තෙගෙදර ප්‍රියංක මංජුල වත්තෙගෙදර (02369) පරිපාලන/රෙජි - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් නිශාන්ත ප්‍රියදර්ශන උඩගෙදර (02370) මෙහෙයුම්/ගුවන් - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් එදිරිසූරිය මොහොටට්ටිගේ තරංග ධනුෂ්ක ද සේරම් (02371) මෙහෙයුම්/ගුවන් - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් දොඩන්ගොඩ ලියනගේ ජානක රුවන් කුමාර (02372) මෙහෙයුම්/ගුවන් - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් සෝබන හන්දි ගයාන් තරංග සිල්වා (02373) මෙහෙයුම්/ගුවන් - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් වැවකුඹුර ගෙදර නලින් දර්ශික වැවකුඹුර (02374) මෙහෙයුම්/ගුවන් - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් අත්තිංඥ මරක්කල යසංක චින්තන ද සිල්වා (02375) මෙහෙයුම්/ගුවන් - 2006.07.20 ;

ෆ්ලයිං ඔෆිසර් ලසිත යසංග වික්‍රම සෙනෙවිරත්න (02486) නි. පො. රා. - 2007.08.24 ;

ෆ්ලයිං ඔෆිසර් මාලක මිහිර ධර්මවීර (02518) කාර්මි/සංඥා - 2008.01.06 ;

ෆ්ලයිං ඔෆිසර් කාරියප්පෙරුම අතුකෝරලගේ දොන් දුමිදු තිලක් කාරියප්පෙරුම (02519) ගු. තො. නි. - 2008.01.06 ;

ෆ්ලයිං ඔෆිසර් කහඳ කෝරලගේ හර්ෂ රවීන්ද්‍ර (02467) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් ලේකම්වසම් සම්පත් ප්‍රියදර්ශන සිරිවර්ධන (02458) කාර්මි/ඉංජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් විට්ටච්චි කෝරාලලාගේ දොන් චාමර එරික් අධිකාරම් (02459) කාර්මි/සංඥා - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් පියුහිත්නගේ දොන් තුෂන්ත රොද්‍රිගු (02460) කාර්මි/සංඥා - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් මොරවකගේ නිරෝෂ් සංජය ප්‍රානන්දු (02461) කාර්මි/සංඥා - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් ජවුෆර් මොහමඩ් අමාන් (02463) පරිපාලන - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් මුජිත කුමාර හේවාපතිරණ (02464) පරිපාලන - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් දෙවුර හෙන්නදිගේ ඉෂාන් සුරංග චන්ද්‍රසිරි (02465) පරිපාලන - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් මනිමෙල් වඩු සජිත් මොහාන් තිලකරත්න (02466) පරිපාලන - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් තල්පෙ හේවගේලාගේ සුජිත් නිශාන්ත හේවගේ (02468) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් අබේදිවාකර දහම් රංගන වික්‍රමරත්න (02469) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් මැදවත්ත දුග්ගන්නාරාලලාගේ පරාක්‍රම බණ්ඩාර මැදවත්ත (02470) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් ජයසිංහ පතිරන්නැහැලාගේ සම්පත් ප්‍රියලාල් (02471) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් මාරසිංහ මුදියන්සේලාගේ ප්‍රසාත් මලින්ද මාරසිංහ (02472) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් කුලතුංග මුදියන්සේලාගේ ප්‍රසාද් සංජීව කුලතුංග (02473) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් විජේසුන්දර දසනායක මුදියන්සෙ රාලහාමිලාගේ අමල් නයනජිත් බණ්ඩාර දසනායක (02474) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් මැටිවිටිය ආචාරිලාගේ විජිත ගෝමිස් (02475) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් කරුණාමුනිගේ මංගල බණ්ඩාර මෙන්ඩිස් (02476) පරිපාලන/රෙජි - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් අලහකෝන් ආරච්චිලාගේ ගෙදර සුසන්ත අලහකෝන් (02522) නි. පො. රා. - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් මායාකඩුව ගමගේ හිරන්ත ද සිල්වා (02523) නි. පො. රා. - 2008.01.09 ;

ෆ්ලයිං ඔෆිසර් වර්ණකුලසූරිය තුසිත ශෙනෝන් රුද්‍රිගු (02445) කාර්මි/ඉංජි - 2008.02.05 ;

ෆ්ලයිං ඔෆිසර් ජයකොඩි ආරච්චිගේ දොන් ශ්‍රීනිජ නිරංග (02399) උපකරණ - 2008.02.08 ;

ෆ්ලයිං ඔෆිසර් කනකරත්න මුදියන්සේලාගේ දිල්ෂාන් බණ්ඩාර කනකරත්න (02439) කාර්මි/ඉංජී - 2008.05.07 ;

ෆ්ලයිං ඔෆිසර් දොන් සූරියආරච්චිලාගේ සුචරිත විචිත්‍ර සූරියආරච්චි (02446) උපකරණ - 2008.05.07 ;

ෆ්ලයිං ඔෆිසර් රණසිංහ ආරච්චිගේ දොන් සුදත් ජිනේන්ද්‍ර (02438) කාර්මි/ඉංජී - 2008.05.07.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

කොළඹ දී ය.

06-446/1

---

2009 අංක 212

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### ගුවන් හමුදාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන්ගේ ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට ෆ්ලයිං ඔෆිසර් නිලයට උසස් කෙරේ :

පයිලට් ඔෆිසර් වර්ණකුලසූරිය තුසිත ශෙනෝන් රොද්‍රිගු (02445) කාර්මි/ඉංජී - 2005.02.05 ;

පයිලට් ඔෆිසර් කනකරත්න මුදියන්සෙලාගේ දිල්ෂාන් බණ්ඩාර කනකරත්න (02439) කාර්මි/ඉංජී - 2005.05.07 ;

පයිලට් ඔෆිසර් දොන් සූරියආරච්චිලාගේ සුචරිත් විචිත්‍ර සූරියආරච්චි (02446) උපකරණ - 2005.05.07 ;

පයිලට් ඔෆිසර් රණසිංහ ආරච්චිගේ දොන් සුදත් ජිනේන්ද්‍ර (02438) පරිපාලන - 2005.05.07 ;

පයිලට් ඔෆිසර් සෝබන හන්දි සාරික ප්‍රභාත් ලංකා ද සිල්වා (02433) කාර්මි/ඉංජී - 2005.06.24 ;

පයිලට් ඔෆිසර් ගල්ලෙන වත්තෙ රුක්ෂාන් දනුෂ්ක ප්‍රේමචන්ද්‍ර (02443) කාර්මි/ඉංජී - 2005.06.24 ;

පයිලට් ඔෆිසර් දිසානායක මුදියන්සෙලාගේ යුද්දික නයෝම දිසානායක (02434) කාර්මි/ඉංජී - 2005.06.24 ;

පයිලට් ඔෆිසර් අමරකෝන් මුදියන්සෙලාගේ සරත් කුමාර අමරකෝන් (02431) උපකරණ - 2005.06.24 ;

පයිලට් ඔෆිසර් ජයලත් පතිරනගේ අජිත් කුමාර (02441) උපකරණ 2005.06.24 ;

පයිලට් ඔෆිසර් අඹවලගේ ප්‍රදීප් පුෂ්ප කුමාර අඹවලගේ (02444) පරිපාලන 2005.06.24 ;

පයිලට් ඔෆිසර් දොන් නිමන්ත නලලපෙරුම අබේවික්‍රම ජයතිලක (02437) උපකරණ 2005.06.24 ;

පයිලට් ඔෆිසර් හේරත් මුදියන්සෙලාගේ මදුෂාන් බානුක මංජු ශ්‍රී බණ්ඩාර (02432) පාලන/රෙජි 2005.06.24 ;

පයිලට් ඔෆිසර් හොරවල විතානගේ ගැමුණු මහානාම (02442) නි.පො.රා. 2005.06.24 ;

පයිලට් ඔෆිසර් විතානගේ දේවකුමාර් ප්‍රදීප් ප්‍රනාන්දු (02435) පරිපාලන 2005.06.24 ;

පයිලට් ඔෆිසර් කොඩිකාරගේ දොන් වර්ණ කාංචන (02440) නි.පො.රා. 2005.06.24 ;

පයිලට් ඔෆිසර් වැල්ලෙ කංකානමගේ රසික උදයකුමාර (02447) පරිපාලන 2005.06.24 ;

පයිලට් ඔෆිසර් මද්දුම දොඩංගොඩගේ අශාන් දොඩංගොඩ (02430) නි.පො.රා. 2005.06.24 ;

පයිලට් ඔෆිසර් හේරත් මුදියන්සෙලාගේ තුෂාර කැලුම් කුමාර හේරත් (02436) පාලන/රෙජි 2005.06.24 ;

පයිලට් ඔෆිසර් ගංගොඩ ගමගේ ඉරංග දිලීප විරාජ් (02448) කාර්මි/ඉංජී 2005.06.24 ;

පයිලට් ඔෆිසර් සේනාරත්න මුදියන්සේලාගේ නිසාංග දිල්ශාන් සේනාරත්න (02682) කාර්මි/ඉංජී 2005.07.09 ;

පයිලට් ඔෆිසර් නානායක්කාරගේ දොන් රංජුල චානක පෙරේරා (02564) නි. පො. රා. 2005.07.16 ;

පයිලට් ඔෆිසර් හේරත් මුදියන්සෙලාගේ මුදිත සමරකෝන් (02565) නි.පො.රා. 2005.07.16 ;

පයිලට් ඔෆිසර් අකුරැටියගේ බුද්ධික මනෝජ් ද සිල්වා (02566) නි.පො.රා. 2005.07.16 ;

පයිලට් ඔෆිසර් අබේවර්ධන මුලාචාරිගේ වසන්ත නිහාල් අබේවර්ධන (02567) නි.පො.රා. 2005.07.16 ;

පයිලට් ඔෆිසර් කුලතුංග මුදලිගේ දොන් සුධීර ප්‍රසන්න කුලතුංග (02568) නි.පො.රා. 2005.07.16 ;

පයිලට් ඔෆිසර් සාරංග දිලාන් ගෝර්ඩන් (02569) නි.පො.රා. 2005.07.16 ;

පයිලට් ඔෆිසර් කොටිගලගේ ශ්‍යාම් උපුල් ක්‍රිශාන්ත රණසිංහ (02493) නි.පො.රා. 2006.03.01 ;

පයිලට් ඔෆිසර් හබරාදුව ගොඩේලියනගේ කැලුම් හරින්ද්‍ර රූපසිංහ (02494) මෙහෙ/ගුවන් 2006.03.01 ;

පයිලට් ඔෆිසර් නානායක්කාර වසම් තෙලිකඩ පල්ලිය ගුරුගේ චමින්ද නානායක්කාර (02488) උපකරණ 2006.03.01

පයිලට් ඔෆිසර් වීරක්කොඩි මුදියන්සෙලාගේ මාදව වික්‍රමසිංහ බණ්ඩාර (02487) පාලන/රෙජි. 2006.03.01 ;

පයිලට් ඔෆිසර් දිසානායක මුදියන්සෙලාගේ කොලින් විශ්වනාත් (02497) පාලන/රෙජි. 2006.03.01 ;

පයිලට් ඔෆිසර් රූපසිංහ ආරච්චිගේ සම්පත් සඳරුවන් පෙරේරා (02491) පාලන/රෙජි. 2006.03.01 ;

පයිලට් ඔෆිසර් සවලප්පුගේ දනුෂ ලලින්ද ශ්‍රී පෙරේරා (02492) මෙහෙ/ගුවන් 2006.03.01 ;

පයිලට් ඔෆිසර් ශිහාන් ඇන්තනි ජෝන් (02489) පාලන/රෙජි. 2006.03.01 ;

පයිලට් ඔෆිසර් වෙත්තසිංහගේ දිනූක උදයංග වෙත්තසිංහ (02498) පාලන/රෙජි. 2006.03.01 ;

පයිලට් ඔෆිසර් කලුව දේවගේ හර්ෂන කෞශල්‍ය (02490) පාලන/රෙජි. 2006.03.01 ;

පයිලට් ඔෆිසර් විතාන අප්පුහාමිලාගේ අසේල ඉන්ද්‍රජිත් විතාන (02499) පාලන/රෙජි. 2006.03.01 ;

පයිලට් ඔෆිසර් කෝරලගේ ලක්මාල් නවීන් තිසේරා (02496) පාලන/රෙජි. 2006.03.01 ;

පයිලට් ඔෆිසර් චන්න අරවින්ද පේදුරුහේවා (02520) පරිපාලන 2006.07.06 ;

පයිලට් ඔෆිසර් විජේනායක ආරච්චිලාගේ බුද්ධි චින්තක රූපසිංහ (02521) පරිපාලන 2006.07.06 ;

පයිලට් ඔෆිසර් හුරිගොල්ලෙ ගෙදර නන්දික ප්‍රියදර්ශන හුරිගොල්ල (02549) පරිපාලන 2006.07.07 ;

පයිලට් ඔෆිසර් තම්මහෙට්ටි මුදලිගේ නලින් සංජීව පීරිස් (02550) පරිපාලන 2006.07.07 ;

පයිලට් ඔෆිසර් ප්‍රැන්සිස්කු හෙට්ටිගේ අමිල සුරංජන් සිල්වා (02551) පරිපාලන 2006.07.07 ;
පයිලට් ඔෆිසර් දිනේෂ් නුවන් සමීර වීරරත්න(02552) පරිපාලන 2006.07.07 ;
පයිලට් ඔෆිසර් ජයකොඩි ආරච්චිගේ සුමිත් ප්‍රියංකර (02553) පාලන/රෙජි 2006.07.07 ;
පයිලට් ඔෆිසර් ගනේගොඩගේ මංජුල චන්දිමාල් ගනේගොඩ (02555) පාලන/රෙජි 2006.07.07 ;
පයිලට් ඔෆිසර් දසනායක මුදියන්සෙලාගේ අසංක දර්ශන බණ්ඩාර දඹකොටුව (02556) පාලන/රෙජි 2006.07.07 ;
පයිලට් ඔෆිසර් පනාගොඩ ජානක හේමචන්ද්‍ර (02557) පාලන/රෙජි 2006.07.07 ;
පයිලට් ඔෆිසර් සේනානායක මොහොට්ටි මුදියන්සෙලාගේ මහේෂ් මාලිංග සේනානායක (02570) නි.පො.රා. 2006.07.07 ;
පයිලට් ඔෆිසර් මාසෙව්ගේ රුවන් බුද්ධික ප්‍රනාන්දු (02571) නි.පො.රා. 2006.07.07 ;
පයිලට් ඔෆිසර් අර්ජුන ප්‍රනාන්දුපුල්ලේ (02572) නි.පො.රා. 2006.07.07 ;
පයිලට් ඔෆිසර් චරිත චතුරංග තල්පෙ ගමගේ (02608) කර්මික/ඉංජි 2006.12.04 ;
පයිලට් ඔෆිසර් කඩවත්ගම ඇතුගලගේ නවීන් ධනුෂ්ක ගුණරත්න (02609) කර්මික/ඉංජි 2006.12.04 ;
පයිලට් ඔෆිසර් උදිත ඉෂාර අද්දර පතිරන (02573) පාලන/රෙජි. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් සිකුරාධිපතිගේ ධම්මික සංජය සිකුරාධිපතියෙ (02574) පාලන/රෙජි. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් බුලත්වත්තෙ වලව්වෙ තිලක් සුමිත් බණ්ඩාර (02575) පාලන/රෙජි. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් අමල් ප්‍රියංකර කරගොඩ පතිරනගේ (02576) පාලන/රෙජි. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් සජිත් රන්සිරි සියඹලාපිටිය (02577) පාලන/රෙජි. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් දිලූක කාවින්ද කලුආරච්චි (02578) පාලන/රෙජි. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් ලුවිස් පොන්සා ආරච්චිගේ බන්දුල ලසන්ත (02579) පාලන/රෙජි. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් මීගහගේ මොනාත් ඉරේෂ් පෙරේරා (02603) නි.පො.රා. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් තුආන් මොහොමඩ් එර්ෂාඩ් මුතාලිෆ් (02604) නි.පො.රා. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් හිටිහාමිල්ලගේ සේනක පුබුදු බණ්ඩාර කුරගමුව (02605) නි.පො.රා. 2007.01.08 ;
පයිලට් ඔෆිසර් රූපසිංහ අප්පුහාමිලාගේ තමීර නාමල් රූපසිංහ (02610) උපකරණ 2007.01.08 ;
පයිලට් ඔෆිසර් එදිරිසිංහ පතිරණගේ දිනූෂ රංගන එදිරිසිංහ (02582) කාර්මික/ඉංජි 2007.04.05 ;
පයිලට් ඔෆිසර් මුතුකුඩ ආරච්චිගේ ගයාන් රාජින්ද්‍ර කුමාරගම (02584) කාර්මි/ඉංජි 2007.04.05 ;
පයිලට් ඔෆිසර් හේරත්මුදියන්සේලාගේ දොන් අනුරුද්ධ දසරත් පෙරේරා (02589) කාර්මික/ඉංජි 2007.04.05 ;
පයිලට් ඔෆිසර් මාරසිංහ ආරච්චිලාගේ දුමිඳු දර්ශන මාරසිංහ (02588) නි.පො.රා. 2007.04.05 ;
පයිලට් ඔෆිසර් චමිල ප්‍රදීප් කුමාරසිංහ (02585) කාර්මික/ඉංජි 2007.04.05 ;
පයිලට් ඔෆිසර් එරංග රොෂාන් වඩුගේ (02591) පරිපාලන/රෙජි 2007.04.05 ;
පයිලට් ඔෆිසර් අසංක චන්දිමාල් විජේසිංහ (02592) කාර්මි/සංඥා 2007.04.05 ;
පයිලට් ඔෆිසර් විතානගේ චතුර මධුරංග (02586) කාර්මි/ඉංජි 2007.04.05 ;
පයිලට් ඔෆිසර් ඕපාත කංකානම්ගේ නුවන් චන්දන ගුණසේකර (02583) කාර්මික/සංඥා 2007.04.05 ;
පයිලට් ඔෆිසර් උදිත කැලුම් ලක්මාල් මහානාම (02587) කාර්මික/සංඥා 2007.04.05 ;
පයිලට් ඔෆිසර් ප්‍රේමනායක ගොඩකන්දගේ උපුල් නිශාන්ත ධර්මපාල (02581) මෙහෙයුම්/ගුවන් 2007.04.05 ;
පයිලට් ඔෆිසර් මෙලන්ත රසාංජන සේනානායක (02590) කාර්මි/ඉංජි 2007.07.05 ;
පයිලට් ඔෆිසර් ජයවීර මුදියන්සේලාගේ උපුල් ජානක මනනන්ද (02563) ගු.තො.නි. 2007.07.12 ;
පයිලට් ඔෆිසර් සුරාජ් චින්තක මධුවල (02606) පරිපාලන 2007.07.14 ;
පයිලට් ඔෆිසර් පොල්වත්ත වලව්වෙ ධම්මික බණ්ඩාර රත්නායක (02607) පරිපාලන/රෙජි 2007.07.14 ;
පයිලට් ඔෆිසර් පොන්නම්පෙරුම ආරච්චිගේ චාමීර ක්‍රිශාන් (02614) නි.පො.රා. 2007.07.14 ;
පයිලට් ඔෆිසර් ප්‍රසාද් චින්තක හෙට්ටිආරච්චි (02615) නි.පො.රා. 2007.07.14 ;
පයිලට් ඔෆිසර් වීරසිංහ ආරච්චිගේ සුරේෂ් රංගන වීරසිංහ (02616) පරිපාලන/රෙජි 2008.01.06 ;
පයිලට් ඔෆිසර් මනම්පේලි මහපටබැදිරාලලාගේ සුරංග නාමල් කුරේ වනිගරත්න (02617) පරිපාලන/රෙජි 2008.01.06 ;
පයිලට් ඔෆිසර් ධනුෂ්ක අගලකඩ (02600) ගු.තො.නි 2008.01.14 ;
පයිලට් ඔෆිසර් වාද්දුවගේ උපුල් පුෂ්ප කුමාර පෙරේරා (02601) ගු.තො.නි. 2008.01.14 ;

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

කොළඹ දී ය.

06-446/2

---

2009 අංක 213

පීආර්/1/4/69.

ගරු විදේශ කටයුතු ඇමතිතුමන් විසින් 2009 ජුනි මස පළමු වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ නියුතු එස්ටෝනියා ජනරජයේ නිර්වේතනික කොන්සල් වශයෙන් ඩබ්ලි ෆ්‍රැන්සිස් සුතන්තිරනායගම් තම්බිනායගම් මහතා සතුටින් පිළිගෙන ඇත.

පාලිත ටී. බී. කොහොන,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2009 ජුනි මස 02 වැනි දින,
කොළඹ 01,
ජනරජ ගොඩනැගිල්ලේ,
විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

06-569

# රජයේ නිවේදන

## පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය ක්‍රීඩා පාසලක් බවට නම් කිරීම

බස්නාහිර පළාතේ, පිළියන්දල අධ්‍යාපන කලාපයේ පිහිටා ඇති ජාතික පාසලක් වන පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය 2009.06.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා පාසලක් ලෙස නම් කරනු ලැබේ.

අධ්‍යාපන ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

06-668

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කොළඹ විශ්ව විද්‍යාලය

**2006 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය**

*(සියළු මිල ගණන් ආසන්න රුපියලට ගණනය කොට ඇත)*

| *2005* *රු.* | | *සටහන* | *රු.* | *2006* *රු.* |
|---|---|---|---|---|
| | **වත්කම්** | | | |
| | *ජංගම නොවන වත්කම්* | | | |
| 7,87,80,487 | දේපල, යන්ත්‍ර හා පිරිවිත | 1 | 7,75,21,425 | |
| 2,95,65,600 | ආයෝජන | 2 | 2,60,65,600 | |
| | වෙනත් මූල්‍ය වත්කම් | | 54,59,038 | 10,90,46,063 |
| | **ජංගම වත්කම්** | | | |
| 15,94,508 | තොග/භාණ්ඩ වට්ටෝරු | 3 | 16,05,685 | |
| 1,66,91,628 | වෙළඳ හා වෙනත් ලැබීම් | 4 | 3,51,80,052 | |
| 1,15,869 | පූර්ව ගෙවීම් | 5 | 95,137 | |
| 89,69,323 | මුදල් සහ මුදල් හා සමාන | 6 | 98,20,299 | 4,67,01,173 |
| 13,57,17,425 | මුළු වත්කම් | | | 15,57,47,236 |
| | **වගකීම්** | | | |
| | *ජංගම නොවන වගකීම්* | | | |
| | ණය පොළී | | 1,25,85,807 | |
| 90,45,562 | පාරිතෝෂිත වෙන් කිරීම් | | | |
| | **ජංගම වගකීම්** | | | |
| 27,62,654 | ගෙවීම් | 7 | 40,03,086 | |
| 49,22,944 | උපචිත වියදම් | 8 | 57,77,023 | |
| | කෙටිකාලීන ණය | | | |
| | මුළු වගකීම් | | 97,80,109 | 2,23,65,916 |
| 11,89,86,265 | මුළු ශුද්ධ වත්කම් | | | 13,33,81,320 |

| *2005* රු. | | *සටහන* | රු. | *2006* රු. |
|---|---|---|---|---|
| | ශුද්ධ වත්කම්/වරණීය කොටස්වල සහ සාමාන්‍ය කොටස්වල එකතුව | | | |
| 18,51,69,967 | සමුච්චිත අරමුදල | 9 | | 19,71,77,944 |
| (6,61,83,702) | සංචිත | 10 | | (6,37,96,624) |
| 11,89,86,265 | මුළු වත්කම්/වරණීය කොටස්වල සහ සාමාන්‍ය කොටස්වල එකතුව | | | 13,33,81,320 |

නිවැරදි බවට සහතික කරන ලදී.

ගිණුම් නිලධාරී,
(අධ්‍යක්ෂ)

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී,

**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

කොළඹ විශ්ව විද්‍යාලය

**2006 දෙසැම්බර් මස 31 වැනි දිනට ආදායම් හා වියදම් ගිණුම**

*(සියළු මිල ගණන් ආසන්න රුපියලට ගණනය කොට ඇත)*

| *2005* රු. | | *සටහන* | රු. | *2006* රු. |
|---|---|---|---|---|
| | **ආදායම** | 11 | | |
| 3,66,00,000 | රජයේ දීමනාව | | | 4,15,00,000 |
| 4,91,50,776 | වෙනත් ආදායම් | | | 6,62,39,822 |
| | ගමන් දීමනා (ඕස්ට්‍රේලියාව) | | | |
| | 25 වැනි වර්ෂ පූර්ණ සැමරුම් උත්සවය | | | |
| 31,13,643 | සහ දකුණු ආසියානු සමුළුව | | | |
| 8,88,64,419 | | | | 10,77,39,822 |
| | **වියදම්** | | | |
| | පුනරාවර්තන වියදම් | 12 | | |
| 2,45,88,571 | පුද්ගලික වැටුප් හා වේතන | | 3,21,10,659 | |
| 19,47,358 | ගමන් වියදම් | | 39,70,540 | |
| 28,79,390 | සැපයීම් | | 39,75,510 | |
| 9,28,878 | නඩත්තු | | 12,22,411 | |
| 64,18,057 | කොන්ත්‍රාත් සේවා | | 66,48,170 | |
| 2,07,78,859 | වෙනත් පුනරාවර්තන වියදම් | | 2,17,08,452 | |
| 1,81,79,162 | පශ්චාත් උපාධි පුහුණුවීම් | | 2,12,20,312 | |
| 7,57,20,275 | | | 9,08,56,054 | |
| | 25 වැනි වර්ෂ පූර්ණ සැමරුම් උත්සවය සහ දකුණු ආසියානු සමුළුව | | | |
| 35,94,111 | ක්ෂය | | | |
| 1,00,47,230 | වත්කම් හිමිකමින් බැහැර කිරීමේ දී සිදුවූ පාඩු | | 1,11,27,862 | 10,19,83,916 |
| (4,97,197) | ආදායම ඉක්මවූ අතිරික්තය හෝ හිඟය | | | (57,55,906) |
| | **විසර්ජන ගිණුම** | | | |
| (5,75,11,450) | පෙර වසරේ ඉදිරියට ගෙන ආ ශේෂය | | (6,63,15,547) | |
| | **එකතු කළා** | | | |
| 10,36,356 | වෙනත් ගැළපුම් (බැර) | 13 | 95,61,324 | (5,67,54,223) |
| (5,64,75,094) | | | | (5,09,98,317) |

| 2005 රු. | | සටහන | රු. | 2006 රු. |
|---|---|---|---|---|
| | අඩු කළා | | | |
| 5,47,873 | පසුගිය වසරට අදාළ ගෙවීම් | | 55,29,111 | |
| 87,95,383 | වෙනත් ගෙවීම් (හර) | 14 | 1,23,49,807 | 1,29,02,728 |
| (6,63,15,547) | ශේෂය ඉදිරියට ගෙන ගියා | | | (6,39,01,035) |

9. මූල්‍ය කටයුතු

9.1 *පාඨමාලා ගාස්තු*

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවයේ නියුතු වෛද්‍යවරුන්ගේ පාඨමාලා ගාස්තු ගෙවීම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් භාරගත් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පාඨමාලා ගාස්තු ගෙවීමේ වර්ධනයක් දක්නට ලැබිණි. මේ අනුව පාඨමාලා ගාස්තු ගෙවීම් ප්‍රභවයේ වෙනසක් ද දක්නට ලැබිණි. අභ්‍යාසලාභීන් ට ගෙවීමට සිදුවූයේ ලේඛන ගතවීම්, පරීක්ෂණ සහ පුස්තකාල ගාස්තු පමණි. පාඨමාලා ගාස්තු ගෙවීම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කරන ලදී. අවසන් පරීක්ෂණ සඳහා පෙනී සිටි වාර ගණන නොසලකා අභ්‍යාසලාභීන් විසින් ගෙවා තිබූ පරීක්ෂණ ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම ද සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙම වර්ෂය තුළදී සිදු කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

9.2 *විශේෂිත ගණකාධිකරණ ප්‍රතිපත්ති*

සාමාන්‍ය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම යටතේ පිළිගත් ගණකාධිකරණ න්‍යායයන්ට හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව ස්ථාවර පදනමක් යටතේ පිළියෙල කර ඇත.

හඳුනාගත් බැරකම් සියල්ල සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

9.3 *වත්කම් සහ ඒවායේ වටිනාකම් පදනම*

ඉඩම්, ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ ක්ෂයවීම්

එකතු වූ ක්ෂය පිරිවැය මගින් අඩුකිරීම් ආකාරයෙන් දෘෂ්‍ය වත්කම් දක්වා ඇත. සරල මාර්ග ක්‍රමය යටතේ පහත සඳහන් ප්‍රමාණයන්ට අනුකූලව ක්ෂයවීම් වාර්ෂිකව අඩුකර ඇත :

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 10% |
| රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 20% |
| පුස්තකාල පොත් | 20% |
| මෝටර් රථ | 20% |
| උපාධි ලෝගු | 20% |
| විදුලිය බෙදා හැරීම් | 10% |

මිලදී ගත් වර්ෂය වෙනුවෙන් ක්ෂයවීම් දක්වා නොතිබුණු අතර, වත්කම් හිමිකාරත්වයෙන් බැහැර කිරීමට වර්ෂයන් තුලදී ගත වූ කාල වකවානුව නොසලකා සම්පූර්ණ වර්ෂ සඳහාම ක්ෂයවීම් ගණනය කොට ඇත.

*තොග*

පෙර ගැණුම්, පෙර නිකුතු ක්‍රමය යටතේ තොග වත්කම් දක්වා තිබුණි.

පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

සේවකයින් සේවයට බැඳුණු මුල් වර්ෂයේ සිට බල පවත්වන පරිදි විශ්‍රාම පාරිතෝෂිත දීමනාව සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී. අදාල ප්‍රතිපාදන වෙන් කිරීම නිශ්චිත ආකාරයෙන් සිදු කොට ඇත.

2007 අගෝස්තු 14

අධ්‍යක්ෂ,
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාර පනවන ලද 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

1.2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ අගැයීම සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරිව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

02. **මූල්‍ය ප්‍රකාශන**

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2006 දෙසැම්බර් මස 31 වැනි දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් උක්ත පොත්පත්වලට එකඟව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සහ මූල්‍ය ප්‍රකාශන සමඟ දී ඇති සටහන් (අංක 1 සිට 14 දක්වා) වලට සහ උපලේඛන (ඒ සිට එන් දක්වා) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 *අනුචිත හෙළිදරව් කිරීම්*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම සඳහා 2005 වර්ෂයේ දී ලැබුණු රු. 10,00,000ක් වැයකර පරිගණක හා උපාංග මිල දී ගෙන තිබුණි. එහෙත් එම මුදල් වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදානයන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

2.2.2 *නොසැසඳූ ගිණුම්*

මූල්‍ය ප්‍රකාශන අනුව පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදනය රු. 1,25,85,807ක් වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන උපලේඛනය අනුව වටිනාකම රු. 1,25,70,132ක් වූයෙන් රු. 15,675ක වෙනසක් අනාවරණය විය.

2.2.3 *ලැබිය යුතු ගිණුම්*

(අ) වර්ෂ 03කට වැඩි කාලයක සිට පවතින සැපයීම් සේවා හා පොත් දීමනා සඳහා දෙන ලද රු. 45,66,253ක අත්තිකාරම් පියවා ගැනීමට හා රු. 44,900ක හිමිකම් නොපෑ ටෙන්ඩර් තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 10කටත් ඉහත දී සැපයීම් හා සේවා සපයන ආයතන 05ක ආයතනය විසින් තැන්පත් කර තිබුණු රු. 94,932ක් ඒ ඒ වර්ෂය අවසානයේ ආපසු ලබාගෙන ඉදිරි වර්ෂයේ දීත් එම ආයතන වලින් සැපයීම් හා සේවා තවදුරටත් ලබා ගන්නේ නම් පමණක් අදාල ආයතනවල එම මුදල නැවත තැන්පත් කිරීමට කටයුතු කළ යුතු වුවත් ඊට පටහැනිව දිගින් දිගටම එම මුදල් අදාල ආයතනවල රඳවා තැබීමට කටයුතු කර තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 21,23,069ක් වූ ආයෝජන පොළී ආදායම ගණනය කරන ලද උපලේඛන ද රු. 1,14,94,918ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් පිළිබඳ උපලේඛන ද රු. 17,54,516ක් සඳහා වූ (බැර) ගැලපුම් හා රු. 45,97,105ක් වූ (හර) ගැලපුම් සඳහා වූ උපලේඛන හා විස්තර ද විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ :

| *නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය | එක් එක් වර්ෂයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික වාර්තාව ඉක්බිතිව එළඹෙන වර්ෂය අවසාන වීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුව ද 2004 හා 2005 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. 2004 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යොමු කළ දිනය 2006 ඔක්තෝබර් 16 විය. |
| (ආ) මුදල් රෙගුලාසි 135 | මුදල් පාලනය සම්බන්ධව බලතල පවරා දීම වාර්ෂිකව සමාලෝචනය කර ප්‍රතිශෝධනයන් වෙතොත් ඒවා ඇතුළත් කර නිලධාරීන් වෙත බලතල පැවරිය යුතු වුවත් 1996 පෙබරවාරි මස 10 වැනි දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී අනුමත කර තිබුණු මුදල් පාලන බලතල පැවරීම 2006 වර්ෂයේදී ද ක්‍රියාත්මක කර තිබුණ අතර වත්මන් අධ්‍යක්ෂගේ මුදල් පාලනය සම්බන්ධ බලතල පවරාදීමද කර නොතිබුණි. |
| (ඇ) 1990 මැයි මස 18 වැනි දින හා අංක 26/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නියමයන්ට පටහැනිව ආයතනයේ අධ්‍යක්ෂවරයකුගේ සේවා කාලය නිමවීම වෙනුවෙන් 2006 මාර්තු මස 18 වැනි දින පැවති රාත්‍රී භෝජන සංග්‍රහයක් සඳහා රු. 5,220ක් වූ මත්පැන් මිලදී ගෙන තිබුණි. |
| (ඈ) 2004 ජුලි මස 29 වැනි දින හා අංක පීඊඩී 25 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | නියමයන්ට පටහැනිව ආයතනය විසින් 2006 දෙසැම්බර් මස 31 වැනි දින වන විට රු. 2,60,65,600ක් 5% සිට 15% දක්වා වූ පරාසයක් තුළ විහිදෙන පොලී ප්‍රතිශතනයන් මත ස්ථාවර තැන්පත් වල හා ඇමතුම් තැන්පතු වල ආයෝජනය කර තිබුණි. |
| (ඉ) 2005 ජනවාරි මස 27 වැනි දින හා අංක පීඊඩී/27 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව අවසන් මූල්‍ය ප්‍රකාශන සමග විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් සමලෝචිත වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් නොවීය. |

2.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

1994 ජූනි මස 14 වැනි දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛ ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් 2006 වර්ෂයේ දී රු. 229,699ක් ගෙවා තිබුණි.

2.2.7 අවිධිමත් ගණුදෙනු

ලිපිකරු, රියදුරු, හා සුළු සේවකයින්ගේ රාජකාරී ගමන් සඳහා එම සේවකයින් විසින් කුලියට ලබා ගත් බව සඳහන් කර තිබුණු ත්‍රිරෝද රථ වෙනුවෙන් එම සේවකයින්ට කුලී ගාස්තු වශයෙන් රු. 4,830ක් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 3,57,44,094 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 3,70,97,197 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු. 4,15,00,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 57,55,906 ක් දක්වා අඩු වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 3,66,00,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌනතාවය රු. 4,97,197 ක් දක්වා අඩු විය.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 *කාර්ය සාධනය*

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පශ්චාත් ඩිප්ලෝමා හා උපාධි පාඨමාලාවට සිසුන් පිළිවෙලින් 171 ක් හා 311 ක් 2006 වර්ෂයට ලියාපදිංචි වී සිට අතර පාඨමාලා කාලය වර්ෂ 01-03 අතර විය. පෙර වර්ෂවල ලියාපදිංචි වී 2006 වර්ෂයේදීත් අධ්‍යයන කටයුතු කළ සිසුන් සංඛ්‍යාව 343 ක් විය.

(ආ) වෛද්‍ය උපාධි විභාග 03 ක් බාහිර පරීක්ෂකවරුන් නොමැතිවීම නිසා 2006 වර්ෂයේ දී කල් දමා තිබුණු නමුත් 2007 මාර්තු මාසය වන විට එම විභාග පවත්වා ප්‍රතිඵල ද නිකුත් කර තිබුණි.

(ඇ) විගණනයට ලද තොරතුරු අනුව ආයතනය ආරම්භයේ සිට 2006 වර්ෂය අවසානය දක්වා ප්‍රදානය කරන ලද උපාධි හා ඩිප්ලෝමා සංඛ්‍යාවන් පහත පරිදි වේ.

| *කාලපරිච්ඡේදය* | *උපාධි* | *ඩිප්ලෝමා* |
|---|---|---|
| 1980-1985 | 195 | 69 |
| 1986-1991 | 383 | 338 |
| 1992-1997 | 653 | 498 |
| 1998-2003 | 1,045 | 747 |
| 2004 | 216 | 139 |
| 2005 | 264 | 201 |
| 2006 | 224 | 171 |
| | 2,980 | 2,163 |

ආයතනය විසින් පිරිනමුනු ලබන උපාධි හා ඩිප්ලෝමා සංඛ්‍යාව පෙර වර්ෂය සසඳන විට සමාලෝචිත වර්ෂයෙහි පිළිවෙලින් 15% ක හා 14.9% ක පිරිහීමක් දක්නට ලැබුණි.

(ඈ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2006 වර්ෂය අවසාන වන විට ආයතනය විසින් පුහුණු කරන ලද හා මණ්ඩලය විසින් සහතික කළ වෛද්‍ය විශේෂඥයින් සංඛ්‍යාව 1,504 ක් විය. එයින් 2006 වර්ෂය තුළ පමණක් ආයතනය විසින් සහතික කළ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව 137 ක් විය.

(ඉ) පශ්චාත් උපාධි පාඨමාලා සිසුන් 16 දෙදෙනකුගේ විදේශ පුහුණු කටයුතු වලට වීසා, රක්ෂණ ගාස්තු හා මාසික දීමනා වෙනුවෙන් 2006 වර්ෂයේ දී රු. 1,53,93,105ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය රු. 9,62,069ක් විය.

(ඊ) ආයතනයේ ආරම්භයේ සිට පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් සඳහා සහතික කළ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව 05 ක් හෝ ඊට අඩු මට්ටමක පැවතුණි.

| *විෂය ක්ෂේත්‍රය* | *සහතික කළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව* |
|---|---|
| (අ) ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව | 4 |
| (ආ) පිළිසකර දන්තවේදය | 4 |
| (ඇ) මුඛ ශල්‍යවේදය | 3 |
| (ඈ) වෘක්කවේදය | 5 |
| (ඉ) ස්නායු භෞතවේදය | 2 |
| (ඊ) හෘද විද්‍යුත් භෞතවේදය | 3 |
| (උ) ජයිරික ආන්ත්‍රිකවේදය | 2 |
| (ඌ) අන්තරාසර්ග වෛද්‍යවේදය | 2 |

| *විෂය ක්ෂේත්‍රය* | *සහතික කළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව* |
|---|---|
| (එ) වෛද්‍ය පරපෝෂිතවේදය | 2 |
| (ඒ) රසායනික ව්‍යාධිවේදය | 4 |
| (ඔ) සුවිකාරක ශල්‍යවේදය | 5 |
| (ඕ) වාහනීය හා පරාරෝපන ශල්‍යවේදය | 2 |
| (ක) උරස් ශල්‍යවේදය | 1 |

3.2.2 ***කළමණාකරණ අකාර්යක්ෂමතා*** :

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවයෙන් ඉවත් වූ සේවකයින් 05 දෙනෙකුගෙන් 2006 දෙසැම්බර් මස 31 දිනට අය කළ යුතුව ඇති ණය ශේෂය රු. 1,97,104 ක් විය. ආයතනය විසින් එම සේවකයින්ට ගෙවිය යුතු යම් මුදලක් ඇතොත් ඉන් අඩුකර ගැනීමට හෝ විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ එම ණය අයකර ගැනීමට හෝ ඊට වගකිවයුතු වෙනත් නිලධාරින් වෙතොත් ඔවුන්ගෙන් හෝ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. මෙසේ අයකර නොගත් ණය මුදල අවුරුදු 03 කට වඩා පැරණි ණය ශේෂයන් විය.

(ආ) ස්ථාවර තැන්පත් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. විශේෂයෙන් ස්ථාවර තැන්පත්වල පොළී ප්‍රතිශතයන් හා ඇතැම් ස්ථාවර තැන්පත් සඳහා 2006 වර්ෂයට අදාළ පොළිය එම ලේඛනයෙහි සටහන් කර නොතිබුණි.

3.2.3 ***අයවැය ලේඛනමය පාලනය*** :

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 අයවැය ලේඛනය සඳහා පාලක මණ්ඩල අනුමැතිය දී තිබුණේ 2006 පෙබරවාරි මස 11 දින දී ය.

(ආ) 2006 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් නිසිලෙස සකස් කර නොතිබුණ බැවින් සකස් කර තිබුණ අයවැය ලේඛනය වර්ෂයේ ක්‍රියාකිරීමට බලාපොරොත්තු වූ කාර්යයන්ට අනුකූලව සකස් කර තිබුණේ ද යන්න විගණනයේ දී තීරණය කළ නොහැකි විය.

**4. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) සේවක ණය
(ආ) අත්තිකාරම්

පී. ඒ. පේමතිලක,
විගණකාධිපති.

**2006.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට අදාළ කළමනාකරණ මණ්ඩලයේ නිරීක්ෂණ**

2.2.1 ***අනුචිත හෙළිදරව් කිරීම්*** :

නිරීක්ෂණ සටහන් කර ගන්නා ලදී. 2007 වර්ෂයේදී රුපියල් මිලියනයක මුදල භාවිතා කළ අතර අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලබන්නෙමි.

2.2.2 ***නොසැසඳු ගිණුම්*** :

උපලේඛනයේ සඳහන් ඌනතා නිවැරදි කර ඇත.

2.2.3 ***ලැබිය යුතු ගිණුම්*** :

පේරාදෙණියේ පිහිටි වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ශාඛා පුස්තකාලය සඳහා පොත් සහ වාර සඟරා මිලදී ගැනීමට විදේශ සැපයුම්කරුවන්ට අත්තිකාරම් ගෙවා ඇත. එම ඇණවුම් අනුව පොත් සහ වාර සඟරා සපයන ලෙස සැපයුම්කරුවන්ට දන්වා ඇත. මේ කරුණු පිළිබඳව වැඩිදුර සොයා බැලීම ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති විසින් සිදු කරනු ඇත.

පශ්චාත් උපාධි හදාරණ සිසුන් සඳහාවන පොත් මිලදී ගැනීම් පිණිස ගෙවන ලද රුපියල් මිලියන 2.3 අත්තිකාරම්

පශ්චාත් උපාධි විදේශ පුහුණුව සඳහා එතෙර ගිය අභ්‍යාසලාභීනට අදාළ ග්‍රන්ථ අත්තිකාරම් ගෙවා ඇත්තේ වසර 4-5කට පෙර ය. එයින් වැඩි දෙනෙක් සෞඛ්‍යය අමාත්‍යාංශය මගින් එතෙර යැවූ අභ්‍යාසලාභීන් වූහ. එයට නිර්දේශිත පොත් මිලදී ගැනීමට අදාළ බිල්පත්/ඉන්වොයිසි ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතිමුත් මේ දක්වා තවම එය ඔවුන් විසින් ඉදිරිපත් කර නොමැත. වර්තමානයේ උපාධි හදාරන සිසුන් සඳහා මූලිකව ඇමරිකානු ඩොලර් 700 ක අත්තිකාරමක් ලබාදීම සිදු කෙරේ. ඉතිරි මුදල ලබාගැනීම සඳහා ඔවුන් විසින් බිල්පත්/ඉන්වොයිසි ඉදිරිපත් කළ යුතුය.

අයකර නොගත් රු. 44,900ක ටෙන්ඩර් තැන්පතු

නිරීක්ෂණ සටහන් කර ගෙන ඇත. හිමිකම් නොපෑ ටෙන්ඩර් තැන්පත් මුදල්වන රු. 44,900 ක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදායමට ගැනීමට කටයුතු කර ඇත.

ඉන්ධන/දුරකථන/විදුලි බලය ආදී සේවාවන් කඩවීමකින් තොරව නොකඩවා හිමිවිය යුතු සේවාවන් වන බැවින් අදාළ තැන්පතු ආයතනයට නැවතත් ලබාගෙන තැන්පත් කිරීම ප්‍රායෝගික නොවන බව හැගේ.

(අ) විගණනය සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොවීම

පහත සඳහන් උපලේඛන හා විස්තර විගණනය සඳහා ඉදිරිපත් කළ හැකි වේ :-

* ආයෝජනය සඳහා ලැබුණු පොළී සඳහන් ස්ථාවර තැන්පතු ලේඛනය රු. 21,23,069.00
* ස්ථාවර වත්කම් උපලේඛනය රු. 1,14,94,918.00
* උපලේඛනය රු. 17,54,519.00 - (බැර) ගැලපුම්
* උපලේඛනය රු. 45,97,105.00 (හර) ගැලපුම්

2.2.5 ***නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම***

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

2004 හා 2005 වාර්ෂික වාර්තා ඉංග්‍රීසි භාෂාවෙන්, සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම දැඩි අසීරු කරුණක් වී ඇත. එයට හේතුව වන්නේ වෛද්‍ය විද්‍යාවේ සඳහන් වචන සඳහා පාරිභාෂික වචන නොතිබීමයි. ඉංග්‍රීසි භාෂාවේ සමහර වදන් සඳහා අළුතින් වචන සැකසිය යුතු නිසා විශේෂඥ වෛද්‍යවරුන්ගේ මෙන්ම භාෂා විශේෂඥයින්ගෙන් ද උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය වී තිබුණි.

නූතන බටහිර ලෝකයේ බිහිවන වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ නව වචන හේතුවෙන් ප්‍රමාදයන් සිදුවීම නොවැලැක්විය හැකි වේ. ඒ හේතුවෙන් වැඩිපුර කාලයක් සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය වේ. මෙම කටයුතු නිමකර ගැනීම සඳහා සහ පොත නිමා කර ගැනීමට සැළකිය යුතු කාලයක් ගත වන අතර මෙම කාර්යයන් ඉටුකරනු ලබන්නේ එදිනෙදා වැඩ කටයුතු අතරතුරදීම ය. කෙසේ නමුත් විගණකාධිපති උපදෙස් අනුව ඉදිරියේ දී මුද්‍රණය කර අදාළ පරිදි බැඳීම සඳහා ද කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත.

(ආ) මුදල් රෙගුලාසි - 135 :

කරුණු සටහන් කරගෙන ඇත. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් වන බැවින් මුදල් පාලන බලතල සීමාව වෙනස්කිරීම සම්බන්ධයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිගේ අනුමැතිය ලබාගෙන ඒ අනුව අදාළ වෙනස් කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු යොදනු ඇත.

(ඇ) 1990 මැයි මස 18 වැනි දින හා අංක 26/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය :

කරුණු සටහන් කරගෙන ඇත. ඉදිරියේ දී අදාළ අයුරින් කටයුතු කරනු ඇත.

(ඈ) 2004 ජූලි මස 29 වැනි දින හා අංක පීඊඩී 25 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛනය :

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජංගම ගිණුම්වල මුදල් ඉතිරිවී පවතින විට එම මුදල් රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ආයෝජනය කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. මෙමගින් ලැබෙන පොළී ප්‍රමාණයෙන් හදිසි වගකීම් පියවා ගනු ලබන අතර ඒ මගින් කොමිෂන් සභාව වෙතින් අමතර ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටීමෙන් වැලකී සිටීමට හැකිවී ඇත. මෙම ආයෝජනය සඳහා හැමවිටම මහා භාණ්ඩාගාරයේ අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ඇත. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් උපයා ගන්නා අරමුදල් අපගේ වාර්ෂික අයවැය ලේඛනයේ වැයවලින් හඳුනා නොගත් වියදම් පියවා ගැනීමට භාවිතා කරයි. ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ඉදිරියේ දී කටයුතු කරනු ඇත.

(ඉ) 2005 ජනවාරි මස 27 වැනි දින හා අංක පීඊඩී 27 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දෙපාර්මේන්තු 4 කින් සමන්විත වන අතර අධ්‍යයන හා විභාග දෙපාර්තමේන්තු 2006 වර්ෂය තුළ විභාග 84ක් පවත්වා වඩා වැඩි කාර්ය භාරයක් ඉටුකර ඇත. ඊට අමතරව අනුකමිටු පවත්වා ඇත. අධ්‍යයන දෙපාර්තමේන්තුව අධ්‍යන කමිටු 19ක මාසික රැස්වීම පැවැත්වීම, කළමණාකරණ මණ්ඩල රැස්වීම්, සිසුන් ලියාපදිංචි කිරීම තීරණ ගැනීම හා ප්‍රතිපත්ති සැදීම, වෙනස් කිරීම හා පුද්ගල දත්ත සැකසීම ආදිය කරනු ලැබේ. මෙම ආයතනය සතුව පවතින්නේ සීමිත සම්පත් හා සේවක මණ්ඩලයක්ය. දින 60ක් ඇතුළත දළ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇති අතර එම විශේෂිත කාලසීමාවකදී එය ඉදිරිපත් නොවූයේ ඉහත හේතු මත වේ. විගණකාධිපති උපදෙස් සඳහන් කර ගෙන ඇති අතර ඒ සඳහා ඉදිරියේදී අවශ්‍ය සියලුම පියවර ගනු ලබන බවද දන්වා සිටිමි.

2.2.6 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවකයින් සඳහා ගෙවනු ලබන භාෂා ප්‍රවීනතා දීමනාව මෙතෙක් ගෙවා ඇත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛ අංක 10/2001 දරන 2001.08.10 දිනැති චක්‍රලේඛ අනුවයි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ උපදෙස් ඒ අයුරින්ම ක්‍රියාත්මක කරන බව දන්වනු කැමැත්තෙමි.

විගණකාධිපති උපදෙස් ක්‍රියාවේ යොදවනු ලබන අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් මත අළුතින් බඳවා ගන්නා සේවකයන් සඳහා භාෂා ප්‍රවීණතා දීමනාව ලබා නොදේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම නිර්දේශිත ඒ අයුරින්ම ක්‍රියාවට නංවනු ඇත.

2.2.7 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වසරකට පශ්චාත් උපාධි විභාග 84ක් සහ පශ්චාත් උපාධි අධ්‍යයන පුහුණු පාඨමාලා 57ක් පවත්වයි. රියදුරන් තිදෙනෙකු සේවය කරන අතර මේ තිදෙනා අතරින් අධ්‍යක්ෂතුමා සඳහා එක් අයකු වෙන් කර ඇත. අනෙක් රියදුරන් දෙදෙනා පහත සඳහන් විභාග රාජකාරි කටයුතු වල යෙදෙති :

* විදේශීය විභාග පරීක්ෂකවරුන් ගුවන්තොටුපලේ සිට හෝටලය දක්වා හා හෝටලයේ සිට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාග මධ්‍යස්ථානය දක්වා ගෙන යාම.

* විභාග පිළිතුරු පත්‍ර බැලීම සඳහා විභාග පරීක්ෂකවරුන් වෙත පිළිතුරු පත්‍ර බෙදා හැරීම, තවද පුරප්පාඩුව පවතින රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම කර නොමැත. පේරාදෙණිය, ගාල්ල යන ස්ථානවල විභාග පැවැත්විමේදී වාහන තුනම ඒ සඳහා වෙන්කර ඇත. එම නිසා ආයතනයේ අනෙකුත් අත්‍යවශ්‍ය වැඩ කටයුතු සඳහා පෞද්ගලික ත්‍රීරෝද රථ ප්‍රයෝජනයට ගනු ඇත. ගබඩාවට අවශ්‍ය උපකරණ ගෙන ඒම, හා විභාග කටයුතු සඳහා අවශ්‍ය ඖෂධ හා අනෙකුත් ද්‍රව්‍ය ගෙන ඒම, කෙසේ නමුත් අත්‍යවශ්‍ය කටයුතු සඳහා පමණක් අංශ ප්‍රධානින්ගේ අනුමැතිය ඇතිව ඉදිරියේදී පෞද්ගලික ත්‍රීරෝද රථ යොදා ගනු ඇත.

3.1.1 මූල්‍ය ප්‍රතිඵල :

නිරීක්ෂණ සටහන් කර ගෙන ඇත.

3.2.1 *කාර්ය සාධනය*

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය සාධනය විවිධ අවශ්‍යතා (සෞඛ්‍ය අමාත්‍යාංශයේ/විශ්ව විද්‍යාලවල/හමුදාවන් සහ පෞද්ගලික අංශයේ) මත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධ සමුළුව මගින් පිළියෙල වේ. සමහර විෂයය ක්ෂේත්‍රයන් තුළ අවුරුද්දකට පුහුණුවන්නන් එක් කෙනෙකු හෝ දෙදෙනෙකු වේ. තවත් සමහර අභ්‍යාසලාභීන්ට අදාල තෝරා ගැනීමේ පරීක්ෂයෙන් අසමත් වේ. සිසුන් විභාගයෙන් සමත් වුවත් පුහුණු ආයතන සීමා සහිත වේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ රාමුව තුළ ප්‍රමාණවත් අයුරින් මෙය සිදු කරයි. මෙම කරුණු පිළිබඳ වැඩිපුර විස්තරාත්මක තොරතුරු විගණන අංශයට ඉදිරිපත් කල හැකිය.

3.2.2. (අ) අදාල සේවකයින්ගේ ආර්ථසාධක අරමුදල් තවම නිදහස් කොට නොමැත. එම අයකර ගතයුතුව ඇති ණය එම සේවකයින්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු ගෙන යනු ඇත. මෙම කරුණු ඔවුන්ගේ පෞද්ගලික ලිපි ගොනුවේ සඳහන් කර ඇත.

ස්ථාවර වත්කම් ලේඛනය විගණන කටයුතු සඳහා පිළියෙල කර ඇත.

3.2.3 *අයවැය පාලනය*

(අ) 2006 මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට අදාල උපදෙස් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් ලැබී ඇත්තේ 2005 දෙසැම්බර් මස 21 වැනි දින වේ. වැඩසටහන් අයවැය ලේඛනය පිළියෙල කර මූල්‍ය හා කළමනාකරණ කමිටුවේ හා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත. නමුත් මෙය සිදුවී ඇත්තේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, පරිපාලන දුර්වලතාවය මත වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ආදිය අප ආයතනයේ පරිපාලනය ඉක්මවා ගිය ආයතන වේ.

(ආ) 2006 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇති අතර එය කොළඹ විශ්වවිද්‍යාලයේ විගණන අධිකාරී වෙත පිටපතක් සහිතව 2006 මාර්තු මස 22 වැනි දින භාණ්ඩාගාරය වෙත යවා ඇත. 2006 වසර තුලදී පශ්චාත් උපාධි සඳහා විභාග 84ක් පමණක් පවත්වා ඇති අතර එය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වේ.

4. පද්ධති හා පාලන :

(අ) *සේවක ණය*

සේවක ණය ගෙවනු ලැබී ඇත්තේ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 664 මත පදනම්ව වන අතර එයට අදාළ ණය ලේඛණය සහ අනෙකුත් ලේඛන විගණනය සඳහා පිළියෙල කර ඇත.

(ආ) *අත්තිකාරම්*

අත්තිකාරම් ගෙවීමේදී විශේෂ අවධානය යොමු වනු ඇත.

මහාචාර්ය රිෂ්ටි ෂේරීෆ්,
අධ්‍යක්ෂ/වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (කායික විද්‍යාව),
කොළඹ විශ්වවිද්‍යාලය.

**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

කොළඹ විශ්ව විද්‍යාලය

**2007 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය**

*(සියළු මිල ගණන් ආසන්න රුපියලට ගණනය කොට ඇත)*

| *2006* | | *සටහන* | | *2006* |
|---|---|---|---|---|
| *රු.* | | | *රු.* | *රු.* |
| | වත්කම් | | | |
| | *ජංගම නොවන වත්කම් :* | | | |
| 7,75,21,425 | දේපල යන්ත්‍ර හා පිරිවිත | 1 | 9,60,26,981 | |
| 2,60,65,038 | ආයෝජන | 2 | 2,60,65,600 | |
| 54,59,038 | වෙනත් මූල්‍ය වත්කම් | | | 12,20,92,581 |
| | *ජංගම වත්කම් :* | | | |
| 16,05,685 | තොග/භාණ්ඩ වට්ටෝරු | 3 | 15,28,388 | |
| 3,51,80,052 | වෙළඳ හා වෙනත් ලැබීම් | 4 | 3,90,96,567 | |
| 95,137 | පූර්ව ගෙවීම් | 5 | 2,30,204 | |
| 98,20,299 | මුදල් සහ මුදල් හා සමාන | 6 | 1,18,67,591 | 5,27,22,750 |
| 15,57,47,236 | මුළු වත්කම් | | | 17,48,15,331 |
| | *වගකීම් :* | | | |
| | ජංගම නොවන වගකීම් | | | |
| | ණය පොළි | | 1,36,67,038 | |
| 1,25,85,807 | පාරිතෝෂික වෙන් කිරීම් | | | |
| | *ජංගම වගකීම් :* | | | |
| 40,03,086 | ගෙවීම් | 7 | 36,71,452 | |
| 57,77,023 | උපචිත වියදම් | 8 | 67,02,212 | |
| | කෙටිකාලීන ණය | | | |
| | මුළු වගකීම් | | 1,03,73,661 | 2,40,40,702 |
| 13,33,81,320 | මුළු ශුද්ධ වත්කම් | | | 15,07,74,629 |

ශුද්ධ වත්කම්/වරණීය කොටස්වල සහ සාමාන්‍ය කොටස්වල එකතුව

| 2006 රු. | | සටහන | රු. | 2006 රු. |
|---|---|---|---|---|
| 19,71,77,944 | සමුච්චිත අරමුදල | 9 | | 21,38,24,508 |
| (6,37,96,624) | සංචිත | 10 | | (6,30,49,879) |
| 13,33,81,320 | මුළු වත්කම්/වරණීය කොටස්වල සහ සාමාන්‍ය කොටස්වල එකතුව | | | 15,07,74,629 |

නිවැරදි බවට සහතික කරන ලදී.

ගිණුම් නිලධාරී,
(අධ්‍යක්ෂ)

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී,

**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

කොළඹ විශ්ව විද්‍යාලය

**2007 දෙසැම්බර් මස 31 වැනි දිනට ආදායම් හා වියදම් ගිණුම**

*(සියළු මිල ගණන් ආසන්න රුපියලට ගණනය කොට ඇත)*

| 2006 රු. | | සටහන | රු. | 2007 රු. |
|---|---|---|---|---|
| | ආදායම | 11 | | |
| 4,15,00,000 | රජයේ දීමනාව | | | 4,30,52,000 |
| 6,62,39,822 | වෙනත් ආදායම | | | 7,95,08,895 |
| - | 27 වැනි වර්ෂ පූර්ණ සැමරුම් උත්සවය | | | 9,48,700 |
| 10,77,39,822 | | | | 12,35,09,595 |
| | **වියදම්** | | | |
| | පුනරාවර්තන වියදම් | 12 | | |
| 3,21,10,659 | පුද්ගලික වැටුප් හා වේතන | | 3,53,25,161 | |
| 39,70,540 | ගමන් වියදම් | | 43,12,284 | |
| 39,75,510 | සැපයීම් | | 48,15,836 | |
| 12,22,411 | නඩත්තු | | 18,37,195 | |
| 66,48,170 | කොන්ත්‍රාත් සේවා | | 74,79,351 | |
| 2.17,08,452 | වෙනත් පුනරාවර්තන වියදම් | | 2,49,80,960 | |
| 2,18,56,054 | පශ්චාත් උපාධි පුහුණුවීම් | | 3,47,22,030 | |
| 9,08,56,054 | | | 11,34,72,817 | |
| | 25 වැනි වර්ෂ පූර්ණ සැමරුම් උත්සවය | | 9,98,204 | |
| 1,11,27,862 | ක්ෂය | | 1,27,35,489 | 12,72,06,510 |
| 57,55,906 | වත්කම් හිමිකමින් බැහැර කිරීමේදී සිදුවූ පාඩු | | | (36,96,915) |
| | **විසර්ජන ගිණුම :** | | | |
| (6,63,15,547) | පෙර වසරේ ඉදිරියට ගෙන ආ ශේෂය | | (6,39,01,035) | |
| | *එකතු කළා :* | | | |
| 95,61,324 | වෙනත් ගැළපුම් (බැර) | 13 | 1,80,38,207 | (4,58,62,828) |
| (5,09,98,317) | | | | (4,95,59,743) |
| | *අඩු කළා :* | | | |
| 5,22,911 | පසුගිය වසරට අදාළ ගෙවීම් | | 8,00,879 | |
| 1,23,49,807 | වෙනත් ගැළපුම් (හර) | 14 | 1,26,95,557 | 1,34,96,436 |
| (6,69,01,035) | ශේෂය ඉදිරියට ගෙන ගියා | | | (6,30,56,179) |

9. මූල්‍ය කටයුතු

9.1 පාඨමාලා ගාස්තු

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවයේ නියුතු වෛද්‍යවරුන්ගේ පාඨමාලා ගාස්තු ගෙවීම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් භාරගත් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පාඨමාලා ගාස්තු ගෙවීමේ වර්ධනයක් දක්නට ලැබිණ. මේ අනුව පාඨමාලා ගාස්තු ගෙවීම් ප්‍රභවයේ වෙනසක් ද දක්නට ලැබිණ. අභ්‍යාසලාභීන්හට ගෙවීමට සිදුවූයේ ලේඛන ගතවීම්, පරීක්ෂණ සහ පුස්තකාල ගාස්තු පමණි. පාඨමාලා ගාස්තු ගෙවීම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කරන ලදී. අවසන් පරීක්ෂණ සඳහා පෙනී සිටි වාර ගණන නොසලකා අභ්‍යාසලාභීන් විසින් ගෙවා තිබූ පරීක්ෂණ ගාස්තු ප්‍රතිපූරණය කිරීමද සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙම වර්ෂය තුළදී සිදු කරන ලදී.

*මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් :*

9.2 විශේෂිත ගණකාධිකරණ ප්‍රතිපත්ති

*සාමාන්‍ය*

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම යටතේ පිළිගත් ගණකාධිකරණ න්‍යායයන්ට හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව ස්ථාවර පදනමක් යටතේ පිළියෙල කර ඇත.

හඳුනාගත් බැරකම් සියල්ල සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

9.3 වත්කම් සහ ඒවායේ වටිනාකම් පදනම

ඉඩම් ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ ක්ෂයවීම්

එකතු වූ ක්ෂය පිරිවැය මගින් අඩුකිරීම ආකාරයෙන් දෘෂ්‍ය වත්කම් දක්වා ඇත. සරල මාර්ග ක්‍රමය යටතේ පහත සඳහන් ප්‍රමාණයන්ට අනුකූලව ක්ෂයවීම් වාර්ෂිකව අඩු කර ඇත :

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 10% |
| රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ | 20% |
| පුස්තකාල පොත් | 20% |
| මෝටර් රථ | 20% |
| උපාධි ලෝගු | 20% |
| විදුලිය බෙදා හැරීම් | 10% |

මිලදී ගත් වර්ෂය වෙනුවෙන් ක්ෂයවීම් දක්වා නොතිබුණු අතර, වත්කම් හිමිකාරත්වයෙන් බැහැර කිරීමට වර්ෂය තුළ දී ගත වූ කාල වකවානු නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂයවීම් ගණනය කොට ඇත.

*තොග :*

පෙර ගැණුම් පෙර නිකුතු ක්‍රමය යටතේ තොග වත්කම් දක්වා තිබුණි.

*පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම*

සේවකයින් සේවයට බැඳුණු මුල් වර්ෂයේ සිට බලපවත්වන පරිදි විශ්‍රාම පාරිතෝෂික දීමනාව සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී. අදාල ප්‍රතිපාදන වෙන් කිරීම නිශ්චිත ආකාරයෙන් සිදු කොට නැත.

අධ්‍යක්ෂ,
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2007 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය ප්‍රකාර පනවන ලද 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වගන්තිය, විශ්ව විද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත්

විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම්කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන :

2.1 *මතය*

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්විද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2007 දෙසැම්බර් මස 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම*

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03,09 හා 18ට අනුකූල නොවූ අවස්ථා හා විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ එකතුව රු. 6,97,000ක් වූ ගණකාධිකරණ අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂ වෙත යොමු කරන ලදී. එම අඩුපාඩු නිවැරදි කර නැවත සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2008 මැයි මස 09 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) සේවයෙන් ඉල්ලා අස්වූ සේවකයින්ගෙන් අයවිය යුතුව තිබුණ ආපදා ණය හා අත්තිකාරම් රු. 7,525 ක් වර්ෂයකට අධික කාලයක් තුළ අය නොකර පැවතුණු අතර 2006 වර්ෂයේ දී තනතුර අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතුව තිබුණ රු. 56,450ක ණය මුදලක් ද අය නොකර 2007 වර්ෂයේ දී මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය මුදල් යටතේ දක්වා තිබුණි ;

(ආ) මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතුව තිබුණ ණය හා විවිධ අත්තිකාරම් එකතුව රු. 93,950ක් වර්ෂ දෙකකට අධික කාලයක් ද සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය හා විවිධ අත්තිකාරම් රු. 46,015ක් වර්ෂයකට අධික කාලයක් ද අය නොකර පැවතුණි ;

(ඈ) 2007 දෙසැම්බර් මස 31 වැනි දිනට නොපියවූ පොත් අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 29,21,619.00ක් වූ අතර එයින් 79%ක් නියෝජනය වූ රු. 23,16,546.00ක් වර්ෂ 3ට වඩා පැරණි ඒවා විය.

(ඇ) වෙළඳ හා අනිකුත් ලැබීම් යටතේ දක්වා ඇති "අනිකුත් ලැබීම්" ශේෂයන්ගේ එකතුව 2007 දෙසැම්බර් මස 31 දිනට රු. 94,932 ක් වූ අතර එම ශේෂ වර්ෂ තුනකට වඩා පැරණි ශේෂ විය.

(ඉ) 2007 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ශේෂ එකතුව රු. 73,100ක් වූ අතර එයින් 23%ක් වූ රු. 17,000ක් වර්ෂ තුනකට වඩා පැරණි ශේෂ විය.

(ඊ) 2007 දෙසැම්බර් මස 31 දිනට විවිධ තැන්පතු ශේෂ එකතුව රු. 49,289ක් වූ අතර එයින් 16% ක්වූ රු. 8,125 ක් වර්ෂ තුනකට වඩා පැරණි ශේෂ විය.

(උ) 2007 දෙසැම්බර් මස 31 දිනට ගෙවිය යුතු සුපරීක්ෂණ ගාස්තු ශේෂ එකතුව රු. 3,48,105ක් වූ අතර එයින් රු. 12,500ක් වර්ෂ තුනකට වඩා පැරණි ශේෂ විය.

(ඌ) 2007 දෙසැම්බර් මස 31 දිනට සැපයුම් සේවා සඳහා වූ අත්තිකාරම් ශේෂ එකතුව රු. 66,20,208ක් වූ අතර එයින් රු. 86,777ක් වර්ෂ තුනකට අධික කාලයක් නොපියවා පැවති ශේෂ විය.

2.2.3 *විගණනය සඳහා සාක්ෂි නොවීම* :

1996 වර්ෂයේ සිට 2007 ජනවාරි දක්වා බාහිර ආයතනවලට/වෛද්‍යවරුන්ට නිකුත් කළ රු. 87,606ක් වටිනාකම වූ ආයතනය සතු ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වල භෞතික පැවැත්ම සනාථ කර නොතිබුණි.

2.2.4 *මතභේදයට තුඩුදෙන ගනුදෙනු* :

1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛ ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීණත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් 2007 වර්ෂයේදී රු. 2,51,509ක් ගෙවා තිබුණි.

2.2.5. *අවිධිමත් ගනුදෙනු* :

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුගෙන් මාසිකව වැටුපෙන් අයකළ යුතු ණය වාරික හා ණය පොළී අඛණ්ඩව අයකර නොතිබුණි.

(ආ) පදක්කම් ලබාදීමට විශේෂිත සංචිත අරමුදල් වල උපයන ලද පොළී මුදල් උපයෝගී කර ගත යුතු වුවත් උපයන ලද පොළී මුදල ඉක්මවා අරමුදලේ ශේෂයන් ද භාවිතා කළ අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) 2007 අයවැය ප්‍රකාශයට අනුව 2007 ජනවාරි 01 දින සිට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු එකතු කළ අගය මත බද්දෙන් 1/3ක් රඳවා ගෙන ඊළඟ මාසයේ පළමුවන සතිය තුළදී දේශීය ආදායම් කොමසාරිස්ට ප්‍රේෂණය කළ යුතු වුවත් මිලදී ගැනීම් 6ක් හා කොන්ත්‍රාත් ගෙවීම් 2ක් වෙනුවෙන් ගෙවූ රු. 1,79,985 කට අදාල එකතු කළ අගය මත බද්දෙන් 1/3කට සමාන රු. 59,995ක් රඳවා නොගෙන සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරුවාට ගෙවා තිබුණි.

(ඈ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සඳහා 2007 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි කළ සංශෝධනයන්ට අනුව වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදී ගෙවිය යුතු වන්නේ 5%ක එකතු කළ අගය මත බද්දක් වුවත් 15%ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණු බැවින් රු. 1,35,200ක් සැපයුම්කරුවන් වෙත වැඩිපුර ගෙවා තිබුණි.

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය :**

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 *මූල්‍ය ප්‍රතිඵල* :

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගනන් ගැනීමට පෙර රු. 45,579,584ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූප ඌණතාවය රු. 35,744,094 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු. 43,052,000ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 2,527,584ක් දක්වා අඩුවූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 41,500,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌනතාවය රු. 5,755,906ක අතිරික්තයක් බවට පත්විය.

3.2 මෙහෙයුම් සමාලෝචනය :

3.2.1 *කාර්ය සාධනය*

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පශ්චාත් ඩිප්ලෝමා හා උපාධි පාඨමාලාව සඳහා සිසුන් 311ක් ද, ඩිප්ලෝමා පාඨමාලා සඳහා සිසුන් 249ක් ද, 2007 වර්ෂයට නවක සිසුන් වශයෙන් ලියාපදිංචි වූ අතර, පෙර වර්ෂවල ලියාපදිංචි වී 2007 වර්ෂයේ දී ත් අධ්‍යයන කටයුතු කළ සිසුන් සංඛ්‍යාව 1,384ක් විය. පාඨමාලා හැර ගිය සිසුන් සංඛ්‍යාව 02ක් පමණක් විය.

(ආ) විගණනයට ලද තොරතුරු අනුව ආයතනය ආරම්භයේ සිට 2007 වර්ෂය අවසානය දක්වා ප්‍රදානය කරන ලද උපාධි හා ඩිප්ලෝමා සංඛ්‍යාවන් පහත සඳහන් පරිදි වේ.

| *කාලපරිච්ඡේදය 1980 සිට 2007 දක්වා* | *උපාධි සංඛ්‍යාව* | *ඩිප්ලෝමා සංඛ්‍යාව* |
|---|---|---|
| 1980-1985 | 195 | 69 |
| 1986-1991 | 383 | 338 |
| 1992-1997 | 653 | 498 |
| 1998-2003 | 1,045 | 747 |
| 2004 | 216 | 139 |
| 2005 | 264 | 201 |
| 2006 | 224 | 171 |
| 2007 | 287 | 218 |
| | 3,267 | 2,381 |

ආයතනය විසින් පිරිනමනු ලබන උපාධි හා ඩිප්ලෝමා සංඛ්‍යාව පෙර වර්ෂය හා සසඳන විට පිළිවෙලින් 28%ක හා 27% ක වර්ධනයක් දක්නට ලැබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2007 වර්ෂය අවසාන වන විට ආයතනය විසින් පුහුණු කරන ලද හා කළමනාකරණ මණ්ඩලය විසින් සහතික කළ වෛද්‍ය විශේෂඥයින් සංඛ්‍යාව 1,646ක් විය. එයින් 2007 වර්ෂය තුළ පමණක් කළමනාකරණ මණ්ඩලය විසින් සහතික කළ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව 142ක් විය. එය පෙර වර්ෂය හා සසඳන විට 4%ක වැඩිවීමක් විය.

(ඈ) ආයතනයේ ආරම්භයේ සිට පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් සහතික කළ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව 04ක් හෝ ඊට අඩු මට්ටමක පැවතුණි.

| *විෂය ක්ෂේත්‍රය* | *සහතික කළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව* |
|---|---|
| (අ) ස්නායු භෞතවේදය | 2 |
| (ආ) හෘද විද්‍යුත් භෞතවේදය | 3 |
| (ඇ) ජෛවරික ආන්ත්‍රිකවේදය | 2 |
| (ඈ) අන්තරාසර්ග වෛද්‍යවේදය | 2 |
| (ඉ) වෛද්‍ය පරපෝෂිතවේදය | 3 |
| (ඊ) රසායනික ව්‍යාධිවේදය | 4 |
| (උ) වාහනීය හා පරාරෝපන ශල්‍යවේදය | 2 |
| (ඌ) උරස් ශල්‍යවේදය | 1 |
| (එ) වෛද්‍ය පරිපාලන | 1 |

3.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා :

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005 ජුනි 11 වැනි දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී මාස 06 කට අර්ධකාලීනව බඳවා ගැනීමට අනුමැතිය දී තිබුණු එම්එස්සී ප්‍රජා විද්‍යා පාඨමාලා අධ්‍යක්ෂකගේ මාස 06ක සේවා කාලය 2006 පෙබරවාරි මස 24 වැනි දින අවසන් වුවත්, එදින සිට 2007 ඔක්තෝබර් දක්වා එම පාඨමාලාව වෙනුවෙන් අර්ධකාලීන අධ්‍යක්ෂවරයෙක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශීය සැපයුම්කරුවෙකුගෙන් පුස්තකාලයට පොත් මිලදී ගැනීමට 2005 හා 2006 වර්ෂවලදී ගෙවා තිබුණු පවුම් 30,965 කින් ඉතිරි මුදල වූ පවුම් 1,201ක් එම විදේශීය සැපයුම්කරුගෙන් ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු. 113,370ක් පිරිවැය වූ ප්‍රයෝජනයට ගත හැකි ගබඩා භාණ්ඩ විෂයයන් 4ක් වර්ෂ 1 සිට වර්ෂ 3 දක්වා වූ කාලයක සිට ගබඩාවේ නිකුත් නොවී පැවතුනු අතර එම ගබඩා භාණ්ඩ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.2.3 *පුස්තකාල පරිපාලනය :*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුස්තකාලයෙහි ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැතිවීම හේතුවෙන් එකවර පොත් පරිශීලනය කළ හැකි සංඛ්‍යාව 25කට සීමාවී තිබුණි.

(ආ) ගබඩා කර තැබීමට ඉඩ පහසුකම් නොවීම නිසා පුස්තකාලයෙන් බාහිර ස්ථානයක පුස්තකාල පොත් 4,000ක් ගබඩා කර තිබුණි.

3.2.4 *කොන්ත්‍රාත් පරිපාලනය :*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ නව ගොඩනැගිල්ලේ ඇතුළත හා පිටත බිත්තිවල තීන්ත ආලේප කිරීම සඳහා පිළිවෙලින් වැට් බදු ද ඇතුළත් රු. 4,07,879 කට හා රු. 1,24, 487 කට අදාල ඇස්තමේන්තු හා ප්‍රමාණපත්‍ර ආයතනයේ සුළු සේවකයෙකු විසින් පිළියෙල කර තිබුණු අතර එම ඇස්තමේන්තු වැඩ ඉංජිනේරු විසින් අනුමත කර නොතිබුණි.

(ආ) නව ගොඩනැගිල්ලේ ස්ථාන 08ක තීන්ත ආලේප කිරීමේ ඇස්තමේන්තුගත වර්ග ප්‍රමාණය හා නිමකර තිබුණු වර්ග ප්‍රමාණය අතර සැළකියයුතු අසමානතාවයක් නිරීක්ෂණය වූ අතර, එම අසාමාන්‍ය වැඩිවීම්/අඩුවීම්වලට හේතු ලිපිගොනුවේ වූ තොරතුරුවලින් අනාවරණය නොවිණි.

(ඇ) නව ගොඩනැගිල්ලේ බිත්තිවල ඇතුළත පමණක් තීන්ත ආලේප කිරීමට මුලින් තීරණය කර එම කාර්යය නිමවූ පසුව නව ගොඩනැගිල්ලේ ඉදිරිපස බිත්තියේ පිටත තීන්ත ආලේප කිරීමටත්, ඊට පසුව තරප්පු පෙළෙහි හා පොදු ස්ථානවලත් තීන්ත ආලේප කළයුතුබව අධ්‍යක්ෂවරයාගේ තීරණය වී තිබුණි. එබැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදයට 2007 ජූනි 28 දින එකතු කරන ලද අතිරේකයට අනුව රු. 500,000 ඉක්මවූ සේවාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුවීමේ අවශ්‍යතාවයන්ගෙන් වැළකී සිටීමේ හැකියාව උද්ගත වී තිබුණි.

3.2.5 *සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම :*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් සකස් කර තිබුණු සංයුක්ත සැලැස්ම 2002-2006 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා පමණක් විය. 2007 වර්ෂය හා ඉදිරි වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් 2007 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. මේ නිසා 2007 වර්ෂයේ දී ළඟාකරගැනීමට/ඉටුකර ගැනීමට බලාපොරොත්තුවූ අභිමතාර්ථ හා ඉලක්ක මොනවාද යන වග හා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

3.2.6 *ආර්ථික නොවූ ගණුදෙනු :*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාහනයක අළුත්වැඩියාව පිණිස එහි එන්ජිම ගැලවීමට හා නැවත සවි කිරීමට රු. 12,296ක් වැයකර තිබුණු නමුත් අළුත්වැඩියාව සිදුකර නොතිබුණි.

(ආ) පුස්තකාලයට පැමිණෙන වෛද්‍යවරුන්ට අවශ්‍ය කරන ඡායා පිටපත් බාහිර ආයතනයක් මාර්ගයෙන් ගාස්තු අයකර ලබාදීමට නිසි අනුමැතියකින් තොරව කටයුතු කර තිබුණ නමුත් බාහිර ආයතනය විසින් ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකර වීමේදී වැයවන විදුලිය හා සපයන ලද ඉඩකඩ වෙනුවෙන් ගාස්තුවක් ආයතනයට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2.7 *අයවැය ලේඛනමය පාලනය :*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය ලේඛනය දීර්ඝ ප්‍රමාදයකින් පසුව 2007 පෙබරවාරි මස 03 දින පාලක මණ්ඩල අනුමත කර තිබුණි.

(ආ) 2007 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණ බැවින් සකස් කර තිබුණ අයවැය ලේඛනය වර්ෂයේ ක්‍රියාකිරීමට බලාපොරොත්තු වූ කාර්යයන්ට අනුකූලව සකස් කර තිබුණේ ද යන්න විගණනයේදී තීරණය කළ නොහැකි විය.

4. පද්ධති හා පාලන ඃ

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා ඉන්වෙන්ට්‍රි ලේඛන
(ආ) උත්සව අත්තිකාරම් හා ණය ලේඛන
(ඇ) ආදායම් රැස් කිරීම
(ඈ) සුළු මුදල් අග්‍රිම

ඩබ්. ඩී. හේමරත්න,
වැඩබලන විගණකාධිපති.

**2007.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවට අදාල කළමනාකරණ මණ්ඩලයේ නිරීක්ෂණය**

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඃ

අදාල නිරීක්ෂණ සටහන් කරගෙන ඇත.

2.2.2 "ලැබිය යුතු " හා "ගෙවිය යුතු " ගිණුම්

සේවයෙන් ඉල්ලා අස් වී ඇති අයවළුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් මේ දක්වා මුදා හැර නොමැති බැවින් අයවිය යුතු ණය හා අත්තිකාරම් ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂයෙන් අයකර ගැනීමට ක්‍රියා කරනු ඇත. අදාල තොරතුරු සේවකයින්ගේ පෞද්ගලික ලිපිගොනුවල සඳහන් කර ඇත.

(අ) අයවිය යුතු ණය/අත්තිකාරම් රු. 1,02,465 රිචී මහතා රියදුරු

මොහු සේවයෙන් ඉල්ලා අස්වී ඇත. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඔහුගේ අර්ථසාධක අරමුදල් මුදා හැරීමේ අයදුම්පත්‍රය 2008 ජූලි මස 02 වැනි දින කොමිසම් සභාවේ ගණකාධිකාරී වෙත යවා ඇත.

අර්ථසාධක අරමුදලේ ඔහුට ගෙවිය යුතු මුදලින් රු. 102,465 ක් අඩුකර එම මුදල වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එවන ලෙස කොමිෂම වෙත දන්වා යවා ඇත.

(ආ) රු. 88,200 ක් දේශීය වෛද්‍ය ආයතනයෙන් 2008 ජූනි මස 10 වැනි දින ලැබී ඇත.

අනෝමා රත්නායක මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ලෙස උසස් වීමක් ලැබ කොළඹ විශ්වවිද්‍යාලයේ සේවයට ගොස් ඇත.

අයවිය යුතු ණය ශේෂ විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| ආපදා ණය | රු. 81,700 |
| පරිසනක ණය | රු. 6,500 |
| | රු. 88,200 |

තවද, මාරු වී ගිය සේවකයින්ගෙන් අයවිය යුතු ණය ශේෂ ලබාදෙන ලෙස අදාල විශ්වවද්‍යාලවල මූල්‍යාධිකාරීන්හට ලිඛිතව දන්වා ඇත.

(ඇ) මෙයට අදාල පශ්චාත් උපාධි හදාරණ අභ්‍යාසලාභීන් විසින් පොත් දීමනා අත්තිකාරම් ලබාගෙන ඇත්තේ මෙයට වසර 5-6 කට පමණ පෙරය. මෙයින් වැඩිදෙනෙක් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සේවය කරති. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අදාල අභ්‍යාසලාභීන් ගෙන් මිලදී ගැනීමට අදාල බිල්පත්/ඉන්වොයිසි ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කර ඇත. නමුත් ඒ සඳහා ප්‍රතිචාරයක් මේ දක්වා ලැබී නොමැත. දැනට මූලිකව ගෙවනුයේ ඇමරිකානු ඩොලර් 700ක අත්තිකාරමකි. මුළු මුදල ලබා ගැනීම සඳහා අභ්‍යාසලාභීන් විසින් බිල්පත්/ඉන්වොයිසි ඉදිරිපත් කළ යුතුය.

(ඇ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවාවන් බාධාවකින් තොරව පවත්වාගෙන යනු ලැබේ. එම නිසා ආයතනය අදහස් කරනුයේ තැන්පතු නැවත ලබාගැනීම ප්‍රායෝගික නොවන බවයි.

(ඉ) නිරීක්ෂණ සටහන් කර ගෙන ඇත. තැන්පතු ආපසු ලබාදෙන ලෙස ඉල්ලීමක් කර නොමැති ටෙන්ඩර් තැන්පතු වලින් ශේෂය වසර 3 කට වඩා වැඩි තැන්පතු ආයතනයේ පොදු සංචිතයට මාරු කරනු ඇත.

(ඊ) වසර 3 කට වඩා වැඩි විවිධ තැන්පතු ශේෂ ආයතනයේ පොදු සංචිත ගිණුමට මාරු කරනු ඇත.

(උ) වසර 3 කට වඩා වැඩි සුපරීක්ෂන ගාස්තු වල ශේෂ ද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පොදු සංචිත ගිණුමට මාරු කරනු ඇත.

(ඌ) 2007 දෙසැම්බර් 31 වැනි දින සැපයුම් සේවා සඳහා වූ අත්තිකාරම් ශේෂය 6,620,208 ක් විය. ඉන් 2008.06.30 දින වන විට රු. 49,53,942 ක් පියවා ඇත.

විදේශ සැපයුම්කරුවන් වෙත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයට හා පේරාදෙණියේ පිහිටි ශාඛා පුස්තකාලයට වෛද්‍ය පොත් හා වාර සඟරා ලබා ගැනීම පිණිස අත්තිකාරම් ගෙවා ඇත. වෛද්‍ය සඟරා නිසි කලට බෙදා හැරීම සිදු නොවීම නිසා අත්තිකාරම් පියවීම සඳහා කල්ගත වනු ඇත.

විදේශ සැපයුම්කරුවන් වෙතින් නිසි කලට වෛද්‍ය සඟරා ලබා ගැනීම සඳහා සහකාර පුස්තකාලයාධිපති විසින් ක්‍රියා කරනු ඇත.

2:2:3 *විගණනය සඳහා සාක්ෂි නොවීම :*

නිරීක්ෂණය සටහන් කර ගෙන ඇත. බාහිර ආයතනවලට නිකුත් කල භාණ්ඩ සම්බන්ධයෙන් භෞතික පැවැත්ම සනාථ කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ පිළිබඳ සහකාර ලේඛකාධිකාරි/පාලන ක්‍රියා කරනු ඇත.

2:2:4 *මතභේදයට තුඩුදෙන ගණුදෙනු :*

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සේවකයින් සඳහා භාෂා ප්‍රවීණතා දීමනාව ගෙවා ඇත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛ අංක 10/2001 දරන 2001.08.10 දිනැති චක්‍රලේඛයට අදාල වෙයි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ උපදෙස් ස්ථිරවම අනුගමනය කරනු ලබයි.

විගණකාධිපති උපදෙස් ක්‍රියාවේ යොදවන අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් පරිදි අළුතින් බඳවා ගන්නා සේවකයන් සඳහා භාෂා ප්‍රවීණතා දීමනා ලබා නොදේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මෙම උපදෙස් තදින්ම ක්‍රියාවට නංවනු ඇත.

2:2:5 *අවිධිමත් ගණුදෙනු :*

(අ) පහත සඳහන් සේවකයින් දෙදෙනාගේ මාසික වැටුපෙන් අයකල යුතු ණය වාරික අයකර ගෙන ඇත.

1. කේ. පී. කේ. පාලිත මයා — පරිගණක වැඩසටහන් සම්පාදක
2. තමරා ද සිල්වා මිය — දත්ත සැකසුම් ක්‍රියාකරු

මේ සම්බන්ධව සහකාර මුල්‍යාධිකාරී විසින් නිරීක්ෂණය කරනවා ඇත.

(ආ) පශ්චාත් උපාධි හදාරන අභ්‍යාසලාභීන්ට පදක්කම් ලබාදීම සඳහා විශේෂ සංචිත අරමුදල් වලින් ප්‍රමාණවත් නොවන අවස්ථාවල ද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ඉපයීම් අදාල වැය ප්‍රමාණය දරනු ලැබේ. එසේ කරනුයේ මූල්‍ය හා කළමනාකරණ කමිටුවේ අනුමැතිය මතය.

(ඇ) නිරීක්ෂණ සටහන් කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව ගෙවිය යුතු වටිනාකම මත එකතු කල අගය මත බද්දෙන් 1/3 ක් රඳවාගෙන එය දේශීය ආදායම් කොමසාරිස් හට ප්‍රේෂණය කර ඇත.

(ඈ) රඳවා ගැනීමේ අගය මත බදු 5%අඩුකර දේශීය ආදායම් කොමසාරිස් හට ප්‍රේෂණය කරනු ලැබේ.

3:2 **මෙහෙයුම් සමාලෝචනය**

3:2:1 *කාර්ය සාධනය :*

(අ) ආ සහ ඇ නිරීක්ෂණ සටහන් කර ගෙන ඇත.

(ආ) විගණන විමසුමේ සඳහන්ව ඇත්තේ ප්‍රදානය කරන ලද උපාධි හා ඩිප්ලෝමා සංඛ්‍යාවයි දක්වා ඇති විශේෂඥ වෛද්‍යවරුන්ගේ විවිධ විෂය ක්ෂේත්‍රයන් 4කට වඩා අඩුවේ. මෙම විෂයයන් සඳහා පරීක්ෂණ වලට පෙනී සිටින අයදුම්කරුවන් සංඛ්‍යාව ද අඩු

ප්‍රමාණයකි. නමුත් දිවයිනේ පවතින ඉල්ලුමට සාපේක්ෂව මෙම සංඛ්‍යා ප්‍රමාණවත් වන අතර ප්‍රායෝගික පුහුණුව සඳහා පිළිගෙන ඇති පුහුණු ඒකක ද ස්ථාන ද සීමිත වේ.

3:2:2 *කළමනාකරන අකාර්යක්ෂමතා* :

(අ) මාස 6 කට අර්ධකාලීනව බඳවා ගත් ප්‍රජා විද්‍යා පාඨමාලා අධ්‍යක්ෂකගේ සේවා කාලය එම කොන්දේසි යටතේ ම තවත් මාස 6 ක් සඳහා දීර්ඝ කිරීම 2007 ජූලි මස 12 වන දින රැස්වූ කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය උපයා ගත් ආදායමින් මේ සඳහා ගෙවීම් කරන ලදී.

(ආ) 2005 සහ 2006 වර්ෂ සඳහා විදේශ සැපයුම්කරුවන්ගෙන් පුස්තකාලයට ඇණවුම් කළ බ්‍රිතාන්‍ය පවුම් 1201 වටිනා පොත් පුස්තකාලයට මේ වන විට ලැබී ඇත. අදාල ලියකියවිලි විගණන පරීක්ෂණය සඳහා තබා ඇත.

(ඇ) "කැනන් " ඡායාපිටපත් යන්ත්‍ර සඳහා අවශ්‍ය කාට්‍රිජය ලබා ගෙන ඇත්තේ පුස්තකාලයේ හා අධ්‍යයන අංශයේ ඡායාපිටපත් යන්ත්‍ර සඳහා ය. එහෙත් මෙම යන්ත්‍ර දෙකම අබලන් තත්වයට පත්ව ඇති හෙයින් ඒවා අලුත්වැඩියා කිරීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. මෙට්රොපොලිටන් සමාගම සමග කතිකාකොට මෙම යන්ත්‍ර සඳහා ගෙන්වූ කාට්‍රිජය ආපසු යැවීමට ගබඩා භාරකරුට උපදෙස් දී ඇත.

3:2:3 *පුස්තකාල පරිපාලනය* :

නිරීක්ෂණ සටහන් කරගෙන ඇත. මෙය පුස්තකාලය සම්බන්ධයෙන් විශාල ගැටළුවක් වේ. පුස්තකාලය සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් ලැබෙන තෙක් මෙම ගැටළුව විසඳා ගැනීම අපහසු වේ.

3:2:4 *කොන්ත්‍රාත් පරිපාලනය* :

(අ) නව ගොඩනැගිල්ලේ ඇතුලත හා පිටත බිත්තිවල තීන්ත ආලේප කිරීම සඳහා ඇස්තමේන්තු හා ප්‍රමාණපත්‍ර සකසා ඇත්තේ ආයතනයේ සෞඛ්‍ය සේවා කම්කරුවෙකු වන අතර ඔහු කුඩා ප්‍රමාණයේ අලුත්වැඩියා කටයුතුවලට අදාල ප්‍රමාණපත්‍ර සැකසීමේ විශේෂ පුහුණුවක් ලබා ඇත. ඊට අමතරව ඔහු අලුත්වැඩියා කටයුතු සඳහා ප්‍රමාණපත්‍ර සැකසීම සඳහා ජාතික නිවාස හා ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ (ICTAD) සහ මරදාන ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ජාතික තාක්ෂණ සහතික පත්‍ර විභාගය සමත් වී ඇත.

කෙසේ නමුත් නිරීක්ෂණ සටහන් කර ඇති අතර ඉදිරි කාලයේ දී විවෘත විශ්ව විද්‍යාලයේ වැඩ ඉංජිනේරු මගින් අදාල වැඩ කටයුතු සඳහා අනුමැතිය ලබාගනු ඇත.

(ආ) 27 වැනි අධ්‍යයන සැසි සඳහා හදිසි කටයුතු එහි සංවිධාන කමිටුවේ අනුමැතිය ඇතිව නිමකර ඇත. ශ්‍රවණාගාරය, දේශනශාලා පිටත බිත්ති ආදිය පින්තාරු කිරීම.

(ඇ) සංවිධාන කමිටුවේ නිර්දේශ මත තීන්ත ආලේප කිරීම සිදුකරන ලදී. ඔබගේ නිරීක්ෂණ සටහන් කර ඇති අතර ඉදිරියේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:14:1 ඡේදයට අනුව ක්‍රියා කරන බව තවදුරටත් දන්වා සිටිමි.

3:2:5 *සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම* :

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා සංයුක්ත සැලැස්ම 2007-2011 දක්වා නිමකර ඇති අතර, එය දැනට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කොට ඇත.

නිරීක්ෂණ සටහන් කර ගෙන ඇත. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූලික කාර්ය වන්නේ අධ්‍යයන වැඩසටහන් හා විභාග පැවැත්වීමයි. 2007 වර්ෂය සඳහා අදාල අධ්‍යයන වැඩසටහන හා විභාග පිළිබඳ විස්තර පිටපත් ඉදිරිපත් කොට ඇත. කෙසේ නමුත් 2008 සඳහා විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර ඇත.

3:2:6 *ආර්ථික නොවූ ගනුදෙනු* :

(අ) 30/8322 දරන වෑන් රථය අලුත්වැඩියා කිරීම සඳහා එම රථයේ නියෝජිත ආයතනය වන සී/ස ඇසෝසියේටඩ් මෝටර්වේස් ආයතනයට භාර දී ඇත. ඔවුන් එහි එන්ජිම ගලවා අවශ්‍ය පරීක්ෂා කොට ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇත. එම ඇස්තමේන්තුව පිළිගත නොහැකි තත්වයේ පැවතුන හෙයින් නැවත එන්ජිම සවිකරන ලෙස දන්වා ඇත. එම එන්ජිම සවි කිරීම සඳහා ඔවුන් අදාල මුදල අයකර ගෙන ඇති අතර, එය ආයතනයේ උපයා ගත් ආදායමින් ගෙවා ඇත. තව ද මෙම වෑන් රථය පරිහරණ තත්වයේ නොමැති අතර ආයතනයේ කළමනාකාරිත්වය මෙම වාහනය භාවිතයෙන් ඉවත් කරන ලෙස දන්වා ඇත. දැනට එම වාහනය සඳහා ආදායම් බලපත්‍රය ලබාගෙන නොමැත.

(ආ) නිරීක්ෂණ සටහන් කර ගෙන ඇත.

සීමිත ඡායාපිටපත් යන්ත්‍ර සංඛ්‍යාවක් පවතින බැවින් පුස්තකාල සේවකයින්ට මේ සඳහා කාලය මිඩංගු කිරීම ආර්ථික වශයෙන් වැදගත් නොවේ. ඡායාපිටපත් සේවය පෞද්ගලික ආයතනයට පැවරීම අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය ඇතිව සිදුවී තිබේ. කෙසේ නමුත්

මේ සඳහා මූල්‍ය හා කළමනාකරණ මණ්ඩලය නිර්දේශ සහිතව මගින් කළමනාකරණ මණ්ඩලයට අනුමැතිය පතා ඉදිරිපත් කරනු ලැබේ.

3:2:7 *අයවැය ලේඛණමය පාලනය* :

(අ) 2007 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළ උපදෙස් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අප හට ලැබී ඇත්තේ 2006 දෙසැම්බර් මස 21 දින වන අතර වැඩසටහන් අයවැය ලේඛනය පිළියෙල කර මූල්‍ය හා කළමනාකරණ මණ්ඩලය මගින් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට ලබා ගෙන ඇත. නමුත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ආයතනයේ පරිපාලනය ඉක්මවා ගිය ආයතන වේ.

(ආ) 2007 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර එය රාජ්‍ය ව්‍යාපාර නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත යවා ඇත. කොළඹ විශ්ව විද්‍යාලයේ විගණන අධිකාරී වෙත පිටපත් සහිතව මහා භාණ්ඩාගාරය වෙත ද යවා ඇත. 2007 වසර තුළ දී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා විභාග 96ක් පවත්වා ඇති අතර විභාග පැවැත්වීම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන කාර්ය භාරය වේ.

4. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු වනු ඇත.

(අ) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා ඉන්වෙන්ට්‍රි ලේඛණ
(ආ) උත්සව අත්තිකාරම් හා ණය ලේඛණ
(ඇ) ආදායම් රැස් කිරීම
(ඈ) සුළු මුදල් අග්‍රිම

මහාචාර්ය රිෂ්වි ෂේරිෆ්,
අධ්‍යක්ෂ/වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (කායික විද්‍යාව)
කොළඹ විශ්ව විද්‍යාලය.

06-464

---

## ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය

වාර්ෂික වාර්තාව - 2007

**01. හැඳින්වීම**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A ඡේදය යටතේ අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 1998 ඔක්තෝබර් 21 දින කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් ලෙස ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය ස්ථාපිත කරන ලදී. ලෝක බැංකු ආධාර වලින් පිහිටුවන ලද මෙම ආයතනයේ මූලික අරමුණ වූයේ සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ පාසල් හා ගුරු පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීමය.

**02. මෙහෙවර**

ගුරු පුස්තකාලයාධිපතිත්වය සහ තොරතුරු කළමනාකරණය යන ක්ෂේත්‍ර වර්ධනය කිරීමත් පුස්තකාලයාධිපතීන් සහ අර්ධ වෘත්තිකයන් සඳහා විධිමත් අධ්‍යාපන සහ අඛණ්ඩ අධ්‍යාපනය නැතහොත් අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අතර සබඳතාව ශක්තිමත් කිරීමත් ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනයේ නිශ්චිත මෙහෙවර වේ.

**03. ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනයේ අධිකාරීත්වය**

ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනයේ අධිකාරීත්වය වන්නේ කළමනාකරණ මණ්ඩලය, අධ්‍යාපන කමිටුව යනාදියයි.

**කළමණාකරන මණ්ඩලය**

1999 අංක 01 දරන ආඥාපනතේ 9 කොටසේ වගන්ති ප්‍රකාරව කළමනාකරණ මණ්ඩලය පිහිටුවා ඇත. එය ආයතනයේ අධ්‍යයන සහ විධායක මඩුල්ල වේ. විමසුමට ලක්වන වසර තුළ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් පහත පරිදි වේ.

1. මහාචාර්ය රොහාන් රාජපක්ෂ (සභාපති/ස්කෝලිස්/වි.වි.ප්‍ර.කො.ස)
2. පී. විජේතුංග මිය. (අධ්‍යක්ෂ/ජා. පු. වි. වි. ආයතනය)

3. මහාචාර්ය එච්. ආර්. පී. ගුණවර්ධන (පීඨාධිපති/අධ්‍යාපන පීඨය, කො. වි. වි.) 2007 ජුනි මස සිට
4. මහාචාර්ය එස්. සන්දරසේගරම් (පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කො. වි. වි.) 2007 ජූලි මස සිට
5. එස්. එස්. එන් ද සිල්වා මහතා (ජ්‍යෙ. ස. ලේ/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය)
6. රූපා ඒකනායක මිය (ජ්‍යෙ. ස. ලේ./විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය)
7. මහාචාර්ය ජයදේව උයන්ගොඩ (අංශාධිපති/දේශපාලන විද්‍යාව සහ මහජන ප්‍රතිපත්ති අංශය/කො.වි.වි)
8. උපාලි අමරසිරි මහතා (අධ්‍යක්ෂ ජනරාල්/ජා. පු. ප්‍ර. සේ. ම.)
9. මහාචාර්ය රසල් බෝඩින් (ඉෆ්ලා ගරු සමාජික)
10. රුවනි කොඩිකාර මිය (පුස්තකාලයාධිපති/මොරටුව විශ්වවිද්‍යාලය)
11. ආචාර්ය ගිහාන් වික්‍රමනායක (නියෝජ්‍ය අධ්‍යක්ෂ/කො. වි. වි./පරිගණක විද්‍යායතනය)
12. ඩී. වර්ණසූරිය මිය (සභාපති/ශ්‍රී ලංකා පුස්තකාල සංගමය)
13. එස්. කුරුප්පුආරච්චි මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය - ආරාධිත)

විමර්ශනයට ලක් වූ වසර තුළ දී මහාචාර්ය රොහාන් රාජපක්ෂ මහතා පාලක මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළේය.

1999 අංක 01 දරන ආඥාපනතේ 12 කොටස යටතේ අධ්‍යයන කමිටුව ස්ථාපිත කර ඇත. විමසුමට ලක්වන වසර තුල අධ්‍යයන කමිටුවේ සාමාජිකයන් පහත දැක්වේ.

1. පී. විජේතුංග මිය (අධ්‍යක්ෂ හා කමිටු සභාපති)
2. මහාචාර්ය රසල් බෝඩින් (ඉෆ්ලා ගරු සාමාජික)
3. පී. රණසිංහ මහතා (අංශ ප්‍රධාන/පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැළණිය විශ්ව විද්‍යාලය)
4. එල්. ඒ. ජයතිස්ස මහතා (පුස්තකාලයාධිකාරී, කැළණිය විශ්වවිද්‍යාලය)
5. රුවනි කොඩිකාර මිය (පුස්තකාලයාධිපති/මොරටුව විශ්ව විද්‍යාලය)
6. ගිහාන් සෙනවිරත්න මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පරිගණක විද්‍යායතනය කොළඹ විශ්වවිද්‍යාලය)
7. ඩබ්. එස්. පුන්‍යවර්ධන මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ/ජා. පු. ප්‍ර. සේ. ම. - 2007 මාර්තු දක්වා පමණි)
8. වරුණි ගඟබඩ ආරච්චි (පුස්තකාලයාධිපති/ජා. පු. ප්‍ර. සේ. ම. - 2007 නොවැම්බර් සිට)
9. ඩී. ඩැනියෙල් මිය (පුස්තකාලයාධිකාරී/ජා.පු.ප්‍ර.සේ.ම
10. ශිවන්ති වීරසිංහ මිය (අධ්‍යාපන නිලධාරි/ශ්‍රී ලංකා පුස්තකාල සංගමය)
11. ආර්. පී. පී. රණවීර මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු.වි.වි. ආයතනය)
12. පී. ජී. පේමදාස මහතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු.වි.වි.ආයතනය)
13. යූ. පී. අලහකෝන් මහතා (සහකාර පුස්තකාලයාධිකාරී/ජා.පු.වි.වි. ආයතනය)
14. එන්. නන්දසේන මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය - ආරාධිත)

**2007 වසර සඳහා විෂයමාලා සංවර්ධන අනුකමිටුව**

2007 වසර තුළ දී විෂයමාලා සංවර්ධන අනුකමිටු වල කටයුතු කළ සාමාජිකයන් පහත දැක්වේ.

1. *තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සඳහා විෂයමාලා සංවර්ධන අනුකමිටුව*

1. ආචාර්ය සී.ඒ.එස්. අතුකෝරාල (කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය)
2. ආචාර්ය ප්‍රියන්ත හේවාගම (කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය)
3. පී. සෙනෙවිරත්න මහතා (කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය)
4. පී. විජේතුංග මිය (අධ්‍යක්ෂ/ජා.පු.වි.වි. ආයතනය)
5. ආර්. පී. පී. රණවීර මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු.වි.වි. ආයතනය)

2. *කළමනාකරණය සඳහා විෂයමාලා සංවර්ධන අනුකමිටුව*

1. පී. රන්දිවෙල මහතා (පීඨාධිපති/මූල්‍ය හා කළමණාකරණ පීඨය)
2. ගාමිණී ද අල්විස් මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/මූල්‍ය හා කළමණාකරන පීඨය)
3. පී. විජේතුංග මිය (අධ්‍යක්ෂ/ජා.පු.වි.වි. ආයතනය)
4. ආර්. පී. පී. රණවීර මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු.වි.වි. ආයතනය)

3. *අධ්‍යාපනය සඳහා විෂයමාලා සංවර්ධන අනුකමිටුව*

1. මහාචාර්ය ආර්. ගුණවර්ධන (පීඨාධිපති, අධ්‍යාපන පීඨය)
2. මහාචාර්ය එල්. එස්. පෙරේරා (හිටපු පීඨාධිපති අධ්‍යාපන පීඨය)
3. ආචාර්ය මංජුලා විතානපතිරණ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/අධ්‍යාපන පීඨය)
4. පී. විජේතුංග මිය (අධ්‍යක්ෂ/ජා.පු.වි.වි. ආයතනය)
5. පී. ජී. පේමදාස මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා. පු. වි. වි. ආයතනය)
6. ආර්. පී. පී. රණවීර මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු. වි. වි. ආයතනය)
7. සේපාල කුරුප්පුආරච්චි මහතා (අධ්‍යක්ෂ/පාසැල් පුස්තකාල සංවර්ධන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය)

4. *පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධන අනුකමිටුව*

1. පී. විජේතුංග මිය (අධ්‍යක්ෂ/ජා.පු. වි. වි. ආයතනය)
2. එස්. සී. ජයසූරිය (පුස්තකාලයාධිකාරී, කොළඹ විශ්ව විද්‍යාලය)
3. පී. රණසිංහ මහතා (අංශාධිපති පු. වි. වි. අධ්‍යයනාංශය, කැළණිය විශ්ව විද්‍යාලය)
4. එල්. ඒ. ජයතිස්ස මහතා (පුස්තකාලයාධිපති/කැළණිය විශ්වවිද්‍යාලය)
5. ඩබ්. සෙනවිරත්න මිය (පුස්තකාලයාධිපති/විවෘත විශ්ව විද්‍යාලය)
6. ආර්. පී. රණවීර මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු.වි.වි. ආයතනය)
7. පී. ජී. පේමදාස මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා. පු. වි. වි. ආයතනය)
8. ඩී. සී. කුරුප්පු මිය (ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති/වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)

5. *පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධන අනුකමිටුව*

1. පී. විජේතුංග මිය (අධ්‍යක්ෂ/ජා.පු.වි. වි. ආයතනය)
2. ආර්. පී. පී. රණවීර මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු.වි.වි. ආයතනය)
3. පී. ජී. පේමදාස මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු. වි. වි. ආයතනය)
4. යූ. පී. අලහකෝන් මහතා (සහකාර පුස්තකාලයාධිපති/ජා. පු. වි. වි. ආයතනය)

6. ප්‍රජා තොරතුරු කළමණාකරනය සඳහා විෂයමාලා සංවර්ධන අනුකමිටුව

1. පී. විජේතුංග මිය (අධ්‍යක්ෂ/ජා.පු. වි. වි. ආයතනය) කැඳවුම්කරු
2. මහාචාර්ය ඩබ්. ජී. කුලරත්න (අංශාධිපති/සමාජ විද්‍යා අධ්‍යයනාංශය, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)
3. ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම (අධ්‍යක්ෂ/මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය
4. ඩබ්. සෙනෙවිරත්න මිය (පුස්තකාලයාධිපති/විවෘත විශ්වවිද්‍යාලය)
5. ආර්. පී. පී රණවීර මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු.වි.වි. ආයතනය)
6. පී. ජී. පේමදාස මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජා.පු.වි.වි. ආයතනය)
7. එම්. ඩී. එච්. ජයවර්ධන මහතා (හිටපු පුස්තකාලයාධිපති/කොළඹ මහජන පුස්තකාලය)

04. **කාර්ය මණ්ඩල විස්තරය**

අධ්‍යක්ෂ :
විමසුමට යටත් කාලය තුළ දී පී. විජේතුංග මහත්මිය අධ්‍යක්ෂිකා ලෙස සේවය කරන ලදී.

*අධ්‍යයන කාර්ය මණ්ඩලය*

මෙම වසර තුළ පහත සඳහන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් කටයුතු කරන ලදී.

1. ආර්. පී. පී. රණවීර මහතා
2. පී. ජී. පේමදාස මහතා

*සහකාර පුස්තකාලයාධිපති*

යූ. පී. අලහකෝන් මහතා 2007 වසර තුළ සහකාර පුස්තකාලයාධිපති ලෙස සේවය කරන ලදී.

*ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී*

2007 වසර තුළ අසෝකා අබේරත්න මහත්මිය සහකාර ලේඛකාධිකාරී ලෙස කටයුතු කළාය.

*ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී*

මෙම වසර තුළ දී ජී. එච්. ගාමිණී මහතා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී ලෙස කටයුතු කළේය.

*පරිගණක යෙදවුම් සහායක*

ජීවිකා ජයමිණී මහත්මිය පරිගණක යෙදවුම් සහයක ලෙස කටයුතු කරන ලදී.

05. අධ්‍යාපනික වැඩසටහන්

*සම්මාන*

පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා සමත්ව කෙටිකාලීන පාඨමාලා පවත්වාගෙන යාම මගින් ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවාවේ සංවර්ධනය වෙනුවෙන් කළ දායකත්වය සඳහා ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 2006 ඔක්තෝබර් 30 වැනි දින ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනයට සම්මාන ප්‍රදානය කරන ලදී.

*පශ්චාත් උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා*

2007 වසර තුළ දී නව ශිෂ්‍ය ලියාපදිංචි වීම් :

| | *පාඨමාලාව* | *සංඛ්‍යාව* |
|---|---|---|
| 1. | දර්ශනපති (ph. D) පූර්ණ කාලීන | 07 |
| 2. | පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති (MLS) පූර්ණ කාලීන | 05 |
| 3. | ගුරු පුස්තකාලයාධිපති පාශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGTL) | 23 |
| 4. | පුස්තකාල සහ විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGLIS) අර්ධ කාලීන | 07 |
| 5. | පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළබඳ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව (PLIM) | 19 |
| 6. | පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ අන්තර්මාධ්‍ය සහතික පත්‍ර පාඨමාලාව (ILIM) | 14 |
| 7. | ගුරු පුස්තකාලයාධිපතිත්වය සහතික පත්‍ර පාඨමාලාව (CSL) | 03 |
| 8. | පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහිතක පත්‍ර (CTL) | 92 |
| 9. | අධ්‍යාපනවේ දී පාඨමාලාව (පුස්තකාල විද්‍යා මොඩියුලය) | 68 |
| | එකතුව | 238 |

06. **2007 පවත්වන ලද වැඩමුළු**

(i) ප්‍රජා සංවර්ධන නිලධාරින් සඳහා ප්‍රජා තොරතුරු කළමනාකරණ එක් දින වැඩමුළුව - ජනවාරි
(ii) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරින් සහ සහකාර ලේඛකාධිකාරින් සඳහා දියුණු MS Office තෙදින වැඩමුළුව - ජනවාරි
(iii) අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පුහුණුකරුවන් සඳහා සති දෙකක වැඩමුළුව - පෙබරවාරි - මාර්තු
(iv) දර්ශනපති පාඨමාලාවේ සිසුන් සඳහා සංකල්ප පත්‍රිකාවක් රචනා කරන ආකාරය පිළිබඳව එක් දින සම්මන්ත්‍රණය - අප්‍රේල්
(v) පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා සිසුන් සඳහා සවිබලකරණය 8 ඇතුළත් තෙදින දිශාභිමුඛ වැඩමුළු - සැප්තැම්බර්
(vi) දර්ශනපති පාඨමාලාවේ සිසුන් සඳහා පර්යේෂණ කටයුතු පිළිබඳ එක්දින වැඩමුළුව - ඔක්තෝබර්
(vii) විශිෂ්ඨත්වය සඳහා ඉලෙක්ට්‍රොනික සම්පත් කළමනාකරණය පිළිබඳ NILIS/ITLIS ඒකාබද්ධ දෙදින ජාත්‍යන්තර වැඩමුළුව - දෙසැම්බර් 15-16

07. **2007 වසරේ කැපී පෙනෙන වෘත්තීය දායකත්වය**

අධ්‍යක්ෂවරිය පහත සඳහන් කමිටුවල සාමාජිකයකු ලෙස සහභාගි විය.

* විද්‍යා හා තාක්ෂණ තොරතුරු පිළිබඳ විශේෂ කමිටුව - ජාතික විද්‍යා පදනම
* ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ කමිටුව - ජාතික පුස්තකාල සහ ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ පුස්තකාල සහ අධිලේඛන සේවාව
* අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධාන - වාර්ෂික සම්මන්ත්‍රණය - දකුණු අප්‍රිකාවේ ඩර්බන් නුවර

08. **කාර්යාල මණ්ඩල පුහුණුව**

* සහකාර ලේඛකාධිකාරී අසෝකා අබේරත්න මහත්මිය ජනවාරි 23, 24 සහ 25 ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනයේ පැවති ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරින් සහ සහකාර ලේඛකාධිකාරින් සඳහා වූ Ms Office තෙදින වැඩමුළුවට සහභාගි විය.
* අධ්‍යක්ෂිකා පී. විජේතුංග මහත්මිය සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. පී. පී. රණවීර මහතා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් 2007 මාර්තු 08 සහ 09 දෙදින තුළ පවත්වන ලද පුස්තකාල සහ තොරතුරු අධ්‍යයන ජාතික සම්මන්ත්‍රණයට සහභාගි වූහ.
* ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. පී. පී. රණවීර සහ සහකාර පුස්තකාලයාධිපති යූ. පී. අලහකෝන් යන මහත්වරුන් ජාතික විද්‍යා පදනම විසින් 2007 මාර්තු 21-24 පවත්වන ලද Greestone සංඛ්‍යාංක පුස්තකාල මෘදුකාංග (GSDC) පිළිබඳ වැඩමුළුවට සහභාගි වූහ.
* ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. පී. පී. රණවීර සහ සහකාර පුස්තකාලයාධිපති යූ. පී. අලහකෝන් යන මහත්වරුන් ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 2007 ජූලි 23 සහ 24 දෙදින පවත්වන ලද ශ්‍රී ලංකාවේ ලේඛන උරුමය සංරක්ෂණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගි වූහ.
* අධ්‍යක්ෂිකා පී. විජේතුංග මහත්මිය 2007 ඔක්තෝබර් මස 10 වැනි දින කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ පැවති එක් දින වැඩමුළුවට සහභාගි විය.

09. ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලදී ඉදිරිපත් කරන ලද පත්‍රිකා සහ වෙනත් ප්‍රකාශන.-

අධ්‍යක්ෂිකා පී. විජේතුංග මහත්මිය 2007 පෙබරවාරි 8-10 ඉන්දියාවේ චන්දිගාර්හි පන්ජාබ් විශ්ව විද්‍යාලයේ සහය ඇතිව අහමදාබාද්හි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ INFLIBNET මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද International CALIBER 2007 සම්මන්ත්‍රණයේදී " A strategic model for developing a national respository of Indigenous knowledge in Sri Lanka" මැයෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

10. **සම්පත්**

| මූලාශ්‍රය | ප්‍රාග්ධන (රු. මිලියන) | පුනරාවර්තන (රු. මිලියන) |
|---|---|---|
| භාණ්ඩාගාරය | 1.2.2 | 5.5 |
| එකතුව | 2.2 | 5.5 |

පී. විජේතුංග මිය,
අධ්‍යක්ෂිකා/NILIS

**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය**

2007.12.31 වැනි දිනට ශේෂ පත්‍රය

*(වටිනාකම ආසන්න රුපියලට ගලපා ඇත)*

| | | | 2007 | | 2006 | |
|---|---|---|---|---|---|---|
| | | | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| **වත්කම්** | | | | | | |
| ජංගම නොවන වත්කම : | | 4 | | 10,460,721 | | 13,891,935 |
| *ජංගම වත්කම් :* | | | | | | |
| (අ) | බඩු තොග | | 41,132 | | 45,215 | |
| (අ) | සේවක ණය හා අත්තිකාරම් | 5 | 959,613 | | 382,673 | |
| (ඊ) | බැන්ක් ගැරන්ටිස් | | 30,000 | | - | |
| (ආ) | විවිධ අත්තිකාරම් | | (2,213) | | (2,213) | |
| (ඇ) | විවිධ ණයගැතියෝ | | - | | 509,000 | |
| (ඉ) | කලින් ගෙවීම් | 6 | 43,756 | | 93,894 | |
| (ඈ) | සත් දින නිවේදන තැන්පත් | | - | | 1,928,914 | |
| (ඌ) | ස්ථාවර තැන්පත් | | 1,767,907 | | - | |
| (උ) | මුදල් සහ මුදල් හා සමාන වත්කම් | 7 | 1,761,653 | | 1,529,459 | |
| | | | - | 4,601,848 | - | 4,486,942 |
| | **මුළු වත්කම්** | | | 15,062,569 | | 18,378,876 |
| **වගකීම්** | | | | | | |
| *ජංගම වගකීම් :* | | | | | | |
| (අ) | උපචිත වියදම් | 8 | 276,733 | | 276,858 | |
| (ආ) | ගෙවිය යුතු වැටුප් | | 360 | | 360 | |
| (ඇ) | අධ්‍යයන පාඨමාලා ආදායම් | | 1,701,574 | | 1,795,116 | |
| (ඈ) | ආපසු ගෙවිය යුතු තැන්පත් | | 145,000 | | 122,500 | |
| | | | | 2,123,667 | - | 2,194,834 |
| **ජංගම නොවන වගකීම්** | | | | | | |
| පාරිතෝෂික දීමනා වෙන් කිරීම | | | | 1,750,814 | | 1,478,049 |
| **මුළු වගකීම්** | | | | 3,874,481 | | 3,672,882 |
| ශුද්ධ වත්කම් | | | | 11,188,088 | | 14,705,994 |

| | 2007 | | 2006 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| විශ්ව විද්‍යාල අරමුදල | | | | |
| *ප්‍රාග්ධනය* | | | | |
| (අ) වැය වූ මූලධන ආධාර | 2,089,952 | | 2,394,780 | |
| (ආ) වැය නොවූ මූලධන ආධාර | 9,132 | | | |
| (ඇ) ප්‍රාග්ධන සඳහා දායක වීම් අධ්‍යාපන අමාත්‍යාංශය GEPII | 23,132,739 | 25,231,823 | 23,132,739 | 25,527,519 |
| *වෙන් කිරීම්* | | | | |
| නිශ්චිත වෙන්කිරීම් | | | | |
| පොදු සංචිතය | (12,154,956) | | (8,675,829) | |
| ආදායම් සහ වියදම් ගිණුම් ශේෂය | (3,727,906) | (15,882,862) | (3,984,823) | (12,660,652) |
| *නිශ්චිත අරමුදල්* | | | | |
| (අ) සංවර්ධන අරමුදල | 1,839,127 | | 1,839,127 | |
| (ආ) පරිපාලන වියදම් | | 1,839,127 | - | 1,839,127 |
| | | **11,188,088** | | **14,705,994** |

පිළියෙල කළේ සහ සහතික කළේ ජී. එච්. ගාමිණී ජේ. ස. මුල්‍යාධිකාරී

කළමණාකාර මණ්ඩලය වෙනුවෙන්,

අශෝකා අබේරත්න,
සහකාර ලේඛකාධිකාරී.

එම්. එස්. යූ. අමරසිරි,
අධ්‍යක්ෂක

2008 මැයි මස 29 වැනි දින.

**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය**

2007.12.31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම

*(වටිනාකම ආසන්න රුපියලට ගලපා ඇත.)*

| | | 2007 | 2006 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ආදායම්** | | | |
| 01. | *රජයේ ආධාර* | | |
| | (අ) රජයේ ආධාර (පුනරාවර්ථන) | 5,515,000 | 5,927,000 |
| | (ආ) රජයේ ආධාර : වත්කම් ප්‍රතිසංස්කරණය නඩත්තු | | |
| | (ඇ) හිඟ වැටුප් ගෙවීම සඳහා වි. වි. ප්‍ර. කො. සභාවෙන් ආධාර | 45,100 | - |
| 02. | ආයෝජන පොළී | 167,497 | 81,000 |
| 03. | ණය පොළී | 30,123 | 13,758 |
| 04. | දේපළ කුලී ආදායම් | - | - |
| 05. | අබලි තොග අලෙවි ආදායම් | - | - |
| 06 | නිෂ්පාදිත අලෙවි ආදායම් | - | - |
| 07 | වියදම් ප්‍රතිපූර්ණ | - | - |
| 08 | සුළු මිශ්‍ර ආදායම් | 26,750 | |
| 09 | ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි) | - | - |
| 10 | ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | - | - |
| 11 | අධ්‍යයන ගාස්තු (සහතික පත්‍ර) | 1,325,688 | 731,693 |
| 12 | අධ්‍යයන ගාස්තු (පශ්චාත් උපාධි) | 1,431,803 | 271,737 |
| 13 | විභාග ගාස්තු (ප්‍රථම උපාධි) | - | - |
| 14 | විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | - | - |
| 15 | ප්‍රකාශන විකිණීමේ ආදායම් | 2,475 | 7,300 |
| 16 | පුස්තකාල දඩ | | 90 |
| 17 | වෛද්‍ය ගාස්තු | - | - |

| | | | 2007 රු. | 2006 රු. |
|---|---|---|---|---|
| 18 | බාහිර සේවා සැපයීම් | | 52,576 | 65,269 |
| 19 | සමාන්තර සේවා කටයුතු වලින් | | - | - |
| 20 | අත්තිකාරම් ගිණුම් හා වෙනත් කටයුතු | | - | - |
| 21 | පරිපාලන වියදම් අරමුදල | | - | - |
| 22 | බාහිර පාඨමාලා වලින් ආදායම | | - | - |
| 23 | අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබීම් | | | |
| 24 | වැඩමුළු හා සම්මන්ත්‍රණ | | 471,500 | 846,742 |
| | | | **9,068,512** | **7,944,588** |

*සටහන්*

*අඩුකලා : මෙහෙයුම් වියදම්*

| | | | | |
|---|---|---|---|---|
| 1. | පෞද්ගලික පඩිනඩි | 2 | 5,469,493 | 4,706,298 |
| 2 | ගමන් වියදම් | 2 | 279,648 | 1,856 |
| 3 | සැපයීම් | 2 | 366,682 | 390,073 |
| 4 | නඩත්තු වියදම් | 2 | 182,104 | 148,907 |
| 5 | කොන්ත්‍රාත්තුමය සේවා | 2 | 1,263,948 | 1,034,794 |
| 6 | වෙනත් පුනරාවර්තන වියදම් | 2 | 1,476,696 | 1,010,694 |
| 7 | විභාග වියදම් | | | |
| 8 | අනුශියික කටයුතු | | | |
| 9 | පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම් | 3 | 272,765 | 1,020,894 |
| 10 | ක්ෂය සඳහා වෙන් කිරීම් | 4 | 3,632,082 | 3,615,895 |
| | | | 12,943,418 | 11,929,412 |

| | | |
|---|---|---|
| මෙහෙයුම් ඌණතාවය | (3,874,906) | (3,984,824) |
| මූල්‍ය පිරිවැය | - | - |
| වත්කම් විකුණුම් ලාභ | - | - |
| මෙහෙයුම් නොවන මුළු ආදායම | - | - |
| ශුද්ධ අතිරික්තය අසාමාන්‍ය අයිතමයන්ට පෙර | (3,874,906) | (3,984,824) |
| අසාමාන්‍ය ආදායම්/වියදම් | - | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/ඌණතාවය | (3,874,906) | (3,984,824) |
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය ඉ/ගෙ/ගි | (3,984,824) | (2,755,026) |
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය | (3,874,906) | (3,984,824) |
| පොදු සංචිතයට මාරුකිරීම් | 3,984,824 | (2,755,026) |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | 147,000 | - |
| ශේෂය ශේෂ පත්‍රයට ගෙන ගියා | **(3,727,906)** | **(3,984,824)** |

**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය**

2007.12.31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය
(වටිනාකම ආසන්න රුපියලට ගලපා ඇත.)

| | 2007 රු. | 2006 රු. |
|---|---|---|
| මෙහෙයුම් කටයුතු වලින් ලැබුන අරමුදල් සාමාන්‍ය කටයුතු වලින් ඉපැයූ අතිරික්තය | (3,874,906) | (3,984,824) |
| *මූල්‍ය නොවන හුවමාරුවන් :* | | |
| ක්ෂය සඳහා වෙන්කිරීම් | 3,632,082 | (3,615,895) |

| | 2007 | 2006 |
|---|---|---|
| පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් | 272,765 | (347,439) |
| පෙර වර්ෂවල ගැලපීම් | 147,000 | 0 |
| ගෙවිය යුතු වියදම්වල අඩුවීම | (71,168) | 244,674 |
| ජංගම වත්කම්වල වැඩිවීම | 117,288 | (700,497) |
| ලැබීම්වල වැඩිවීම | 0 | |
| අසාමාන්‍ය වියදම් | 0 | |
| **මෙහෙයුම් කටයුතුවලින් ලැබූ ශුද්ධ අරමුදල්** | 223,062 | (477,313) |
| *ආයෝජනවලින් ලැබූ අරමුදල්* | | |
| ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් | (200,868) | (339,151) |
| ප්‍රාග්ධන වත්කම් අලෙවි අරමුදල් | 0 | 0 |
| ආයෝජන අලෙවි අරමුදල් | 0 | 0 |
| ආයෝජන කටයුතුවල යෙදවූ ශුද්ධ අරමුදල | (200,868) | (339,151) |
| *මූල්‍ය කටයුතු සඳහා වන අරමුදල්* | 210,000 | 292,000 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | | |
| අභ්‍යන්තර අරමුදල් වැඩිවීම | 0 | 892,599 |
| ණය අරමුදල් | | |
| මූල්‍ය කටයුතුවලින් ලැබූ ශුද්ධ අරමුදල් | 210,000 | 1,184,599 |
| මුදල් හා සමාවන දෑවල ශුද්ධ වැඩිවීම | 232,194 | 368,135 |
| මුදල් හා ආසන්න මුදල් ආරම්භක ශේෂය රු. 1, 529 459 | | |
| මුදල් හා ආසන්න මුදල් අවසාන ශේෂය රු. 1 761 653 | 232,194 | 368,135 |

**මූල්‍ය ප්‍රකාශනය සඳහා ගිණුම් සටහන්**

01 *පොදු ගිණුම් ප්‍රතිපත්ති :*

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත හා ශ්‍රී ලංකාවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව පිළියෙල කර ඇත.

සියලුම වගකීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන කර ඇත.

පාඨමාලා ආදායම් හා වියදම් මුදල් පදනම මත ගිණුම් ගත කර ඇත. අදාළ ගිණුම් වර්ෂය තුළදී කර ඇති වියදම්වලට සමාන මුදල් ප්‍රමාණයක් ආදායමට ගෙන ඇති ඉතිරි පාඨමාලා ආදායම් ජංගම බැරකම් යටතේ දක්වා ඇත

පාඨමාලාවල ශුද්ධ ප්‍රතිඵලය පාඨමාලාව අවසානයේ දී හඳුනා ගැනීම කරනු ඇත.

02. *වත්කම් සහ ඒවායේ වටිනාකම් තක්සේරු කිරීමේ පදනම :*

මිලදී ගත් වර්ෂයේදී වත්කම් සඳහා ක්ෂයවීම් කර නැත. ඉවත් කරන වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහා ම ක්ෂයවීම් කර ඇත.

ස්ථාවර වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර පෙන්වා ඇත. පහත සඳහන් ක්ෂය අනුපාතයන් මත සඵල ආයු කාලය තුළ සරල මාර්ග ක්‍රමයට ක්ෂය වත්කම්වල ගණනය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ලීබඩු සහ කාර්යාලීය උපකරණ | 10% |
| වාහන | 20% |
| පරිගණක යන්ත්‍ර | 20% |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 10% |
| වෙනත් වත්කම් | 10% |

වාහන ලේඛකාධිකාරි කොළඹ විශ්වවිද්‍යාලය යටතේ ලියාපදිංචි කර ඇත. වාහනවල වටිනාකම ගිණුම්වල අන්තර්ගත කර ඇත.

රු. 47,532,868.44 වටිනා ගොඩනැගිල්ල කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය හා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් පරිහරණය කරයි.

පාරිභෝගික ද්‍රව්‍ය තොගයේ වටිනාකම තීරණය කිරීමේ දී එම ද්‍රව්‍යවල පිරිවැය යොදාගෙන ඇත.

03. බැරකම් හා වෙන් කිරීම්

සේවයට සම්බන්ධ වූ මුල් වර්ෂයේ සිට සියලුම සේවකයන්ට අස්වීමේදී ගෙවන පාරිතෝෂික මුදල් වෙනුවෙන් ගිණුම් තබා ඇත. මෙම වෙන් කිරීම සඳහා බාහිර අරමුදලක් පිහිටුවා නැති අතර භාණ්ඩාගාරය විසින් ලබාදෙන මුදල්වලින් ගෙවීම් සිදු කිරීම කර ඇත.

සටහන් 01

**පාඨමාලා ආදායම්**

**සහතික පත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා**

| | | රු. |
|---|---|---|
| 1. | පුස්තකාල තොරතුරු කළමනාකරණය පිළිබඳ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව 06 | 7,818 |
| 2. | Mandatory Training Program 04 | 87,200 |
| 3. | ගුරු පාසල් පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 06 | 12,575 |
| 4. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 05 | 5,32,200 |
| 5. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 06 | 1,83,200 |
| 6. | ගුරු පුස්තකාලයාධිපතිවරුන් සඳහා තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව 05 | 56,000 |
| 7. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 03 | 6,000 |
| 8. | ගුරු පුස්තකාලයාධිපතිවරුන් සඳහා තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව 05 | 4,140 |
| 9. | ගුරු පුස්තකාලයාධිපතිවරුන් සඳහා තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව 06 | 2,13,704 |
| 10. | ගුරු පුස්තකාලයාධිපතිවරුන් සඳහා තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව 07 | 5,400 |
| 11. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ අන්තර් මධ්‍ය සහතික පත්‍ර පාඨමාලාව 05 | 1,32,601 |
| 12 | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව 2006 | 84,850 |
| | | 13,25,688 |

*පශ්චාත් උපාධි පාඨමාලා*

| | | |
|---|---|---|
| 1. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව 03 | 1,15,350 |
| 2. | පුස්තකාල හා තොරතුරු විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 03 | 3,05,245 |
| 3. | පුස්තකාල හා තොරතුරු විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 03 | 4,57,825 |
| 4. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 03 | 2,00,000 |
| 5. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 05 | 19,880 |
| 6. | ගුරු පුස්තකාලයාධිපතීත්ය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව 03 | 1,73,020 |
| 7. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව 05 | 81,009 |
| 8. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව සහ ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 5 | 79,475 |
| | | 14,31,804 |

සටහන් 03

පාරිතෝෂික දීමනා වෙන් කිරීම් ගණනය

| | *සේවකයාගේ නම* | *සේවය බැඳුණු දිනය* | *සේවා කාලය* | *මූලික වැටුප් රු.* | *ප්‍රතිපාදන රු.* |
|---|---|---|---|---|---|
| 1. | පී. විජේතුංග මිය. | 01 ඔක්. 86 | 21 | 66,819 | 7,01,597 |
| 2. | ජී. එච්. ගාමිණී මයා. | 01 ජුනි 91 | 16 | 37,430 | 2,99,440 |
| 3. | අශෝකා අබේරත්න මිය. | 19 ජුනි 82 | 26 | 26,900 | 3,49,700 |
| 4. | ඒ ඒ ජේ අබේසිංහ මයා. | 16 ජූලි 76 | 31 | 21,625 | 3,35,188 |
| 5. | එම්. එල්. ඒ. ජේ. ජයමිණී මිය. | 21 නොවැ. 00 | 7 | 18,540 | 64,890 |
| | එකතුව | | | | 17,50,814 |
| | | | | | 14,78,049 |
| | අඩුකළා - ආරම්භක ශේෂය | | | | |
| | 2007 සඳහා අවශ්‍ය ප්‍රතිපාදන | | | | 2,72,765 |

රු.

සටහන් 05

**සේවක ණය හා අත්තිකාරම්**

*ණය වර්ගය*

| | | |
|---|---|---|
| 1. | පරිගණක ණය | 57,000 |
| 2. | වාහන ණය | 2,62,841 |
| 3. | ආපදා ණය | 6,21,462 |
| 4. | උත්සව අත්තිකාරම් | 4,200 |
| 5. | සේවක ණය | 14,110 |
| | | 9,59,613 |

සටහන් 06

**ඉදිරි ගෙවීම්**

| | | |
|---|---|---|
| 1. | සේවා ගිවිසුම් 2008 | 9,775 |
| 2. | වාහන රක්ෂණ වියදම් 2008 | 32,384 |
| | | 42,159 |

සටහන් 07

**මුදල් ගිණුම් ශේෂයන් 2007.12.31 දිනට**

| | | |
|---|---|---|
| 1. | මහජන බැංකුව තඹිරිගස්යාය ජංගම ගිණුම් | |
| | 165-005922 -3 | |
| | 165-006296-1 | 2,51,811 |
| | | 15,09,842 |
| | | 17,61,653 |

සටහන් 08

**උපචිත වියදම්**

| | | |
|---|---|---|
| 1. | දුරකථන වියදම් - දෙසැ. 2007 | 12,700 |
| 2. | විදුලිය - 2007 | 1,31,283 |
| 3. | විශේෂ සේවා 2006-2007 - විගණන ගාස්තු | 1,13,050 |
| 4. | ආදායම් බදු | 2,000 |
| 5. | හිඟ වැටුප | 17,700 |
| | | 2,76,733 |

සටහන් 09

**පාඨමාලා ශේෂයන්**

| | | |
|---|---|---|
| 1. | Mandatory Training Program 05 | 2,000 |
| 2. | මහජන පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 07 | 5,500 |
| 3. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 07 | 56,250 |
| 4. | පාසල් පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව 06 | 17,200 |
| 5. | පාසල් පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව 07 | 72,550 |
| 7. | ගුරු පුස්තකාලයාධිපතිවරුන් සඳහා තොරතුරු හා තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 05 | 4,450 |
| 8. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ අන්තර් මධ්‍ය සහතික පත්‍ර පාඨමාලාව 05 | 7,469 |
| 9. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ අන්තර් මධ්‍ය සහතික පත්‍ර පාඨමාලාව 07 | 93,500 |
| 10. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව 05 | 4,513 |
| 11. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව 06 | 41,896 |
| 12. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව 07 | 1,37,350 |
| 13. | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව 2006 | 1,900 |
| 14. | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව 2007 | 3,450 |
| 15. | පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 05 | 11,780 |
| 16. | පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 07 | 96,000 |
| 17. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 05 | 38,268 |
| 18. | ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 06 | 1,14,275 |

| | | රු. |
|---|---|---|
| 19 | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 07 | 4,47,250 |
| 20 | ගුරු පුස්තකාල විද්‍යාපති උපාධිය 05 | 77,938 |
| 21 | ගුරු පුස්තකාල විද්‍යාපති උපාධිය 06 | 1,32,820 |
| 22 | ගුරු පුස්තකාල විද්‍යාපති උපාධිය 07 | 33,200 |
| 23 | පුස්තකාල විද්‍යාපති උපාධිය 07 | 2,991 |
| 24 | Mphill/PhD 07 | 2,63,525 |
| | | 17,01,575 |

සටහන් 04

ක්ෂය සඳහා වෙන් කිරීම්

| | වත්කම් වර්ගය | ආරම්භක ශේෂය (රු.) | මිලදී ගැනීම් (රු.) | පරිත්‍යාග (රු.) | ඉවත්කිරීම් (රු.) | අවසාන ශේෂය (රු.) |
|---|---|---|---|---|---|---|
| 1. | ඉඩම් සහ ගොඩනැගිලි | 7,21,568 | 0 | 0 | 0 | 7,21,568 |
| 2. | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 8,7,15,519 | 3,847 | 0 | 0 | 87,19,366 |
| 3. | පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර | 54,26,609 | 11,500 | 0 | 0 | 54,38,109 |
| 4. | වැද්දුම් හා සවි කිරීම් | 0 | 0 | 0 | 0 | 0 |
| 5. | පුස්තකාල පොත් හා සඟරා | 65,30,475 | 1,85,521 | 0 | 0 | 67,15,996 |
| 6. | මෝටර් රථ | 36,03,493 | 0 | 0 | 0 | 36,03,493 |
| 7. | වෙනත් | 33,290 | 0 | 0 | 0 | 33,290 |
| | **එකතුව** | **2,50,30,954** | **2,00,868** | **0** | **0** | **2,52,31,822** |

අඩුකළා : ක්ෂය කිරීම්

| | | ආරම්භක ශේෂය (රු.) | වර්ෂය සඳහා ක්ෂය වෙන් කිරීම ගැනීම් (රු.) | ක්ෂය අනුපාතිය (රු.) | ඉවත්කිරීම් (රු.) | අවසාන ශේෂය (රු.) |
|---|---|---|---|---|---|---|
| 1. | ඉඩම් සහ ගොඩනැගිලි | 1,74,681 | 36,078 | 5% | 0 | 2,10,759 |
| 2. | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 40,30,527 | 8,71,552 | 10% | 0 | 49,02,079 |
| 3. | කොම්පියුටර් හා ප්‍රින්ටර | 29,34,507 | 10,62,289 | 20% | 0 | 39,96,796 |
| 4. | වැද්දුම් හා සවිකිරීම් | 0 | 0 | 0 | 0 | 0 |
| 5. | පුස්තකාල පොත් හා සඟරා | 28,98,282 | 12,98,485 | 20% | 0 | 41,96,767 |
| 6. | මෝටර් රථ | 10,81,048 | 3,60,349 | 10% | 0 | 14,41,397 |
| 7. | වෙනත් | 19,974 | 3,329 | 10% | 0 | 23,303 |
| | **එකතුව** | **1,11,39,019** | **36,32,083** | | **0** | **1,47,71,102** |

ශුද්ධ වටිනාකම

| | | ආරම්භක ශේෂය (රු.) | (රු.) | මිලදී ගැනීම් (රු.) | | |
|---|---|---|---|---|---|---|
| 1. | ඉඩම් සහ ගොඩනැගිලි | 5,46,887 | 36,078 | 0 | 0 | 5,10,809 |
| 2. | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 46,84,992 | 8,71,552 | 3,847 | 0 | 38,17,287 |
| 3. | කොම්පියුටර් හා ප්‍රින්ටර | 24,92,102 | 10,62,289 | 11,500 | 0 | 14,41,313 |
| 4. | වැද්දුම් හා සවිකිරීම් | 0 | 0 | 0 | 0 | 0 |
| 5. | පුස්තකාල පොත් හා සඟරා | 36,32,193 | 12,98,485 | 1,85,521 | 0 | 25,19,229 |
| 6. | මෝටර් රථ | 25,22,445 | 3,60,349 | 0 | 0 | 2,1,62,096 |
| 7. | වෙනත් | 13,316 | 3,329 | 0 | 0 | 9,987 |
| | **එකතුව** | **1,38,91,935** | **36,32,083** | **2,00,868** | **0** | **1,04,60,721** |

සටහන් 02
වියදම් ලේඛනය

| CODE | විස්තරය | Ad. Exp. A/C | CPL 06 | MTP- 06 | CSL &CTL 06 | CSL 06 | CSL 07 | CTL 06 | CTL 07 | PLIM 05 | PLIM 06 | PLIM 07 | ILIM 05 | Eng.Dip 06 | PGLIS 05 | PGTL 05 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 04101 | වැටුප් හා වේතන | | | | | | | | | | | | | | | |
| 04102 | වි.අ.අ. | | | | | | | | | | | | | | | |
| 04103 | විශ්‍රාම වැටුප් | | | | | | | | | | | | | | | |
| 04104 | සේ. නි. භා. අ | | | | | | | | | | | | | | | |
| 04105 | වැඩ බැලීමේ ගෙවීම් (10%) | | | | | | | | | | | | | | | |
| 04106 | අන්තර් දීමනා | | | | | | | | | | | | | | | |
| 04107 | මා. ගැ. දි. | | | | | | | | | | | | | | | |
| 04108 | අධ්‍යයන දීමනාව | | | | | | | | | | | | | | | |
| 04109 | සම කිරීම් දීමනාව | | | | | | | | | | | | | | | |
| 04110 | වෙනත් දීමනා | | | | | | | | | | | | | | | |
| 04111 | අන්තර් දීමනා රු. 1,200 | | | | | | | | | | | | | | | |
| 04112 | පාරිතෝෂික දීමනා | | | | | | | | | | | | | | | |
| 04113 | හිඟවැටුප් | | | | | | | | | | | | | | | |
| | අන්තර් දීමනාව | | | | | | | | | | | | | | | |
| | ජීවන වියදම් දීමනාව | | | | | | | | | | | | | | | |
| 04201 | වැටුප් හා වේතන | 510,112 | | | | | | | | | | | | | | |
| 04202 | වි.අ.අ. | 61,456 | | | | | | | | | | | | | | |
| 04203 | විශ්‍රාම වැටුප් | | | | | | | | | | | | | | | |
| 04204 | සෙ. නි. භා. අ. | 11,960 | | | | | | | | | | | | | | |
| 04205 | වැඩ බැලීමේ දීමනාව | | | | | | | | | | | | | | | |
| 04206 | අන්තර් දීමනා 10% | | | | | | | | | | | | | | | |
| 04207 | මා. ගැ. දි. | | | | | | | | | | | | | | | |
| 04208 | අතිකාල දීමනා | 1,93,533 | | | | | | | | | | | | | | |
| 04209 | නිවාඩු දින වැඩ දීමනා | 1,638 | | | | | | | | | | | | | | |
| 04210 | වෙනත් දීමනා | | | | | | | | | | | | | | | |
| 04211 | භාෂා ප්‍රවීණතා දීමනා | | | | | | | | | | | | | | | |
| 04212 | පාරිතෝෂික දීමනා | | | | | | | | | | | | | | | |
| 04213 | අන්තර් දීමනා රු. 1,200 | | | | | | | | | | | | | | | |
| 04214 | සම කිරීම් දීමනාව | | | | | | | | | | | | | | | |
| 04215 | හිඟවැටුප් | | | | | | | | | | | | | | | |
| 04216 | අන්තර් ගැලපුම් දීමනා | | | | | | | | | | | | | | | |
| | ජීවන වියදම් දීමනාව | | | | | | | | | | | | | | | |
| | **ගමන් වියදම්** | | | | | | | | | | | | | | | |
| 0501 | දේශීය | 4,804 | | | | | | | | | | | | | | |
| 0502 | විදේශීය | 99,575 | | | | | | | | | | | | | | |
| | **සැපයුම්** | | | | | | | | | | | | | | | |
| 0601 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 63,526 | | | | | | | | | | | | | | |
| 0602 | ඉන්ධන හා සේවා වියදම් | 73,950 | | | | | | | | | | | | | | |
| 0603 | නිල ඇඳුම් සහ මැසුම් කුලී | 2,417 | | | | | | | | | | | | | | |
| 0604 | යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ | 558 | | | | | | | | | | | | | | |
| 0605 | රසායන හා වීදුරු භාණ්ඩ | | | | | | | | | | | | | | | |
| 0606 | වෛද්‍ය සැපයීම් | | | | | | | | | | | | | | | |
| 0607 | වෙනත් සැපයීම් | 98,047 | | | 31,300 | | | | | | | | | | | |
| | **නඩත්තු වියදම්** | | | | | | | | | | | | | | | |
| 0701 | වාහන | 42,950 | | | | | | | | | | | | | | |
| 0702 | යන්ත්‍ර හා උපකරණ | 58,823 | | | | | | | | | | | | | | |
| 0703 | ගොඩනැගිලි | | | | | | | | | | | | | | | |

| CODE | විස්තරය | Ad. Exp. A/C | CPL 06 | MTP- 06 | CSL &CTL 06 | CSL 06 | CSL 07 | CTL 06 | CTL 07 | PLIM 05 | PLIM 06 | PLIM 07 | ILIM 05 | Eng.Dip 06 | PGLIS 05 | PGTL 05 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0704 | ලී බඩු | | | | | | | | | | | | | | | |
| 0705 | වෙනත් | | | | | | | | | | | | | | | |
| | **ගිවිසුම් ගත සේවා වියදම්** | | | | | | | | | | | | | | | |
| 0801 | ප්‍රවාහන | 920 | | | | | | | | | | | | | | |
| 0802 | දුරකතන | 21,213 | | | | | | | | | | | | | | |
| 0803 | තැපැල් | 19,970 | | | | | | | | | | | | | | |
| 0804 | විදුලි | 70,143 | | | | | | | | | | | | | | |
| 0805 | ආරක්ෂක සේවා | 71,465 | | | | | | | | | | | | | | |
| 0806 | ජලය | | | | | | | | | | | | | | | |
| 0807 | සනීපාරක්ෂක සේවා | 71,465 | | | | | | | | | | | | | | |
| 0808 | කුලී වියදම් | | | | | | | | | | | | | | | |
| 0809 | වරිපනම් හා බදු ගෙවීම් | | | | | | | | | | | | | | | |
| 0810 | මුද්‍රණ හා ප්‍රචාරක | 269,936 | | | | | | | | | | | | | | |
| 0811 | වෙනත් ගිවිසුම් සේවා | | | | | | | | | | | | | | | |
| | **වෙනත් පුනරාවර්තන වියදම්** | | | | | | | | | | | | | | | |
| 0901 | පශ්චාත් උ. සඳහා ගමන් වියදම් දීමනා | | | | | | | | | | | | | | | |
| 0902 | විශේෂ සේවා - පාලක සභා හා කමිටු | 55,000 | | | | | | | | | | | | | | |
| 0903 | විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් වියදම් | | | | | | | | | | | | | | | |
| 0904 | වැඩ මුළු හා සම්මන්ත්‍රණ | | | | | | | | | | | | | | | |
| 0905 | පර්යේෂණ වියදම් | | | | | | | | | | | | | | | |
| 0906 | සේවක සංවර්ධන වියදම් | 2,000 | | | | | | | | | | | | | | |
| 0907 | වෙනත් ආයතන සඳහා ප්‍රදානයන් | | | | | | | | | | | | | | | |
| 0908 | බලපත්‍ර | 2,640 | | | | | | | | | | | | | | |
| 0909 | සංග්‍රහ වියදම් | 168,874 | | | | | | | | | | | | | | |
| 0910 | බැංකු ගාස්තු | | | | | | | | | | | | | | | |
| 0911 | ප්‍රදානය | | | | | | | | | | | | | | | |
| 0912 | සාමාජික ගාස්තු | | | | | | | | | | | | | | | |
| 0913 | උපාධි ප්‍රදාන උත්සව වියදම් | | | | | | | | | | 6,145 | | | | 7,500 | 5,805 |
| 0914 | විභාග වියදම් | | | | | | | | | 4,140 | 21,962 | | 7,000 | 6,846 | 1,850 | 4,370 |
| 0915 | වෙනත් පුනරාවර්තන වියදම් | 162,200 | 6,000 | 12,000 | | | 18,000 | | | | | | 12,000 | 6,000 | - | - |
| 0916 | බාහිර කථිකාචාර්ය ගෙවීම් (ගමන් හා යැපීම් දීමනා ඇතුළුව) | | | 20,250 | 7,800 | 7,200 | | | | | 15,597 | 5,400 | 18,601 | 42,004 | 6,000 | 44,000 |
| | | **2,066,068** | **6,000** | **32,250** | **7,800** | **7,200** | **49,300** | **-** | **-** | **4,140** | **43.704** | **5,400** | **37,601** | **54,850** | **15,350** | **55,245** |

සටහන් 02

වියදම් ලේඛනය

| Code | විස්තරය | PGTL 06 | PGTL 07 | MTL 06 | MTL 05 | MLS- 07 | Mphill/ PhD- 07 | Wo. Shop & Sem. Ex. | Treasury Funds | Sub Total | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 04101 | වැටුප් හා වේතන | | | | | | | | 1,304,570 | 1,304,570 | |
| 04102 | වි.අ.අ. | | | | | | | | 115,534 | 115,534 | |
| 04103 | විශ්‍රාම වැටුප් | | | | | | | | 129,467 | 129,467 | |
| 04104 | සේ. නි. භා. අ. | | | | | | | | 49,000 | 49,000 | |
| 04105 | වැඩ බැලීමේ ගෙවීම් (10%) | | | | | | | | - | - | |
| 04106 | අන්තර් දීමනා | | | | | | | | 35,625 | 35,625 | |

| *Code* | *විස්තරය* | *PGTL 06* | *PGTL 07* | *MTL 06* | *MTL 05* | *MLS-07* | *Mphill/ PhD- 07* | *Wo. Shop & Sem. Ex.* | *Treasury Funds* | *Sub Total* | *Total* |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 04107 | මා : ගැ : දි | | | | | | | | 491,108 | 491,108 | |
| 04108 | අධ්‍යන දීමනාව | | | | | | | | - | - | |
| 04109 | සම කිරීම් දීමනාව | | | | | | | | - | - | |
| 04110 | වෙනත් දීමනා | | | | | | | | 24,650 | 24,650 | |
| 04111 | අන්තර් දීමනා රු. 1200 | | | | | | | | - | - | |
| 04112 | පාරිතෝෂික දීමනා | | | | | | | | - | - | |
| 04113 | හිඟවැටුප් | | | | | | | | - | - | |
| | අන්තර් දීමනාව | | | | | | | | - | - | |
| | ජීවන වියදම් දීමනාව | | | | | | | | 69,750 | 69,750 | |
| 04201 | වැටුප් හා වේතන | | | | | | | | 1,861,960 | 2,372,072 | |
| 04202 | වි.අ.අ. | | | | | | | | 293,448 | 354,904 | |
| 04203 | විශ්‍රාම වැටුප් | | | | | | | | 17,818 | 17,818 | |
| 04204 | සෙ : නි : හා අ : | | | | | | | | 62,253 | 74,213 | |
| 04205 | වැඩ බැලීමේ දීමනාව | | | | | | | | - | - | |
| 04206 | අන්තර් දීමනා 10% | | | | | | | | - | - | |
| 04207 | මා : ගැ: දි. | | | | | | | | 7,500 | 7,500 | |
| 04208 | අතිකාල දීමනා | | | | | | | 2,172 | 0 | 195,705 | |
| 04209 | නිවාඩු දින වැඩ දීමනා | | | | | | | | - | 1,638 | |
| 04210 | වෙනත් දීමනා | | | | | | | | - | - | |
| 04211 | භාෂා ප්‍රවීණතා දීමනා | | | | | | | | 21,660 | 21,660 | |
| 04212 | පාරිතෝෂික දීමනා | | | | | | | | - | - | |
| 04213 | අන්තර් දීමනා රු. 1,200 | | | | | | | | 80,030 | 88,030 | |
| 04214 | සම කිරීම් දීමනාව | | | | | | | | - | - | |
| 04215 | හිඟවැටුප් | | | | | | | | - | - | |
| 04216 | අන්තර් ගැලපුම් දීමනා | | | | | | | | - | - | |
| | ජීවන වියදම් දීමනාව | | | | | | | | 116.250 | 116,250 | 5,469,493 |
| | **ගමන් වියදම්** | | | | | | | - | - | - | |
| 0501 | දේශීය | | | | | | | 460 | 642 | 5,906 | 279,648 |
| 0502 | විදේශීය | | | | | | | | 174,167 | 273,742 | |
| | **සැපයුම්** | | | | | | | | | | |
| 0601 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | | | | | | | 22,972 | 26,080 | 112,578 | |
| 0602 | ඉන්ධන හා සේවා වියදම් | | | | | | | | 40,245 | 114,195 | |
| 0603 | නිල ඇඳුම් සහ මැසුම් කුළී | | | | | | | | 0 | 2,417 | |
| | **විස්තරය** | | | | | | | | | | |
| 0604 | යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ | | | | | | | | - | 558 | |
| 0605 | රසායන හා වීදුරු භාණ්ඩ | | | | | | | | - | - | |
| 0606 | වෛද්‍ය සැපයුම් | | | | | | | | - | - | |
| 0607 | වෙනත් සැපයීම් | | | | | | | | 7,227 | 136,934 | 366,682 |
| | **නඩත්තු වියදම්** | | | | | | | | | | |
| 0701 | වාහන | | | | | | | | 55,050 | 98,000 | |
| 0702 | යන්ත්‍ර හා උපකරණ | | | | | | | | 27,281 | 84,104 | |
| 0703 | ගොඩනැගිලි | | | | | | | | - | - | |
| 0704 | ලී බඩු | | | | | | | | - | - | 182,104 |
| 0705 | වෙනත් | | | | | | | | - | - | |
| | **ගිවිසුම් ගත සේවා වියදම්** | | | | | | | | | | |
| 0801 | ප්‍රවාහන | | | | | | | | 2,900 | 3,820 | |
| 0802 | දුරකථන | | | | | | | | 100,372 | 121,585 | |
| 0803 | තැපැල් | | | | | | | | 16,425 | 36.395 | |
| 0804 | විදුලි | | | | | | | | 405,304 | 475,447 | |
| 0805 | ආරක්ෂක සේවා | | | | | | | | - | - | |
| 0806 | ජලය | | | | | | | | - | - | |

| Code | විස්තරය | PGTL 06 | PGTL 07 | MTL 06 | MTL 05 | MLS-07 | Mphill/ PhD- 07 | Wo. Shop & Sem. Ex. | Treasury Funds | Sub Total | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0807 | සනීපාරක්ෂක සේවා | | | | | | | | 146,886 | 218,351 | |
| 0808 | කුලීවියදම් | | | | | | | | - | - | |
| 0809 | වරිපනම් හා බදු ගෙවීම් | | | | | | | | - | - | |
| 0810 | මුද්‍රණ හා ප්‍රචාරක | 17,995 | | | 15,000 | | 27,313 | | 62,715 | 393,628 | |
| 0811 | වෙනත් ගිවිසුම් සේවා | | | | | | | | 14,722 | 14,722 | 1,263,948 |
| | **වෙනත් පුනරාවර්තන වියදම්** | | | | | | | | | | |
| 0901 | පශ්චාත් උ: සඳහා ගමන් වියදම් දීමනා | | | | | | | | - | - | |
| 0902 | විශේෂ සේවා - පාලක සහා හා කමිටු | | | | | | | | 34,500 | 89,500 | |
| 0903 | විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් වියදම් | | | | | | | | 42,525 | 42,525 | |
| 0904 | වැඩ මුළු හා සම්මන්ත්‍රණ | | | | | | | | 9,550 | 9,550 | |
| 0905 | පර්යේෂණ වියදම් | | | | | | | | - | - | |
| 0906 | සේවක සංවර්ද වියදම් | | | | | | | | 12,000 | 14,000 | |
| 0907 | වෙනත් ආයතන සඳහා ප්‍රදානයන් | | | | | | | | - | - | |
| 0908 | බලපත්‍ර | | | | | | | | 8,160 | 10,800 | |
| 0909 | සංග්‍රහ වියදම් | | | | | | 6,462 | 88,570 | 50,553 | 314,459 | |
| 0910 | බැංකු ගාස්තු | | | | | | | | 21,015 | 21,015 | |
| 0911 | ප්‍රදානය | | | | | | | | - | - | |
| 0912 | සාමාජික ගාස්තු | | | | | | | | - | - | |
| 0913 | උපාධි ප්‍රදාන උත්සව වියදම් | | | | | | | | 4,172 | 23,662 | |
| 0914 | විභාග වියදම් | 4,080 | | 4,142 | 13,520 | | | | - | 67,910 | |
| 0915 | වෙනත් පුනරාවර්තන වියදම් | | | | | | 45,700 | 39,020 | 180,973 | 481,892 | |
| 0916 | බාහිර කථිකාචාර්ය ගෙවීම් (ගමන් හා යැපීම් දීමනා ඇතුළුව) | 40,650 | | 15,738 | 19,500 | 81,009 | | 22,250 | 55,424 | 401,423 | 1,476,696 |
| | | **62,325** | **-** | **19,880** | **48,020** | **81,009** | **79,475** | **175,444** | **6,187,510** | **9,038,571** | **9,038,571** |

අධ්‍යක්ෂ,
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය.

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2007 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) හා 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා (7) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කෙරේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්‍ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2007 දෙසැම්බර් මස 31 දිනට ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2008 පෙබරවාරි මස 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමෙන් පසුව ගණකාධිකරණ අඩුපාඩු විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව නිවැරැදි කළ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2008 අප්‍රේල් 30 දින යළි විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

වැයවූ මූලධන ආධාර හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ජීඊපී 11 ව්‍යාපෘතිය යටතේ ලැබුණු ප්‍රාග්ධන ආධාර එකතුව රු. 25,222,691ක් වුවද එයින් ජනිත වූ වත්කම් එකතුව රු. 25,231,822ක් වූයෙන් වෙනස රු. 9,132ක් විය.

2.2.2 අක්‍රිය මුදල්

භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ රු. 1,700,000ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. කෙසේ වුවද 2007 දෙසැම්බර් මස 31 දින වන විට ස්ථාවර තැන්පතු හා බැංකු ගිණුම්වල රු. 3,529,560ක මුදල් ශේෂයක් රඳවා තිබුණි.

2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| *නීති,රීති රෙගුලාසි ආදියට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) 1990 ඔක්තෝබර් 10 දින හා අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 6කට වරක්ම වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1994 ජූනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 02 ඡේදය | අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් පාලක මණ්ඩල අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවිය හැකි වුවද, ඊට පටහැනිව පාඨමාලා ගාස්තු ආදායමෙන් රු. 18,000ක් පාඨමාලා සම්බන්ධීකරණ දීමනා වශයෙන් අධ්‍යක්ෂවරියට ගෙවා තිබුණි. |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ යූජීසී/එෆ්/ජීජ්/2002 හා 2003 ජනවාරි 13 දිනැති ලිපිය | 2004 වර්ෂයේ සිට පාඨමාලා ගාස්තු ලෙස අයකර තිබූ මුදලින් රු. 1,839,127ක සංවර්ධන අරමුදලක් පිහිටුවා තිබුණි. |

| *නීති,රීති රෙගුලාසි ආදියට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (ඈ) මුදල් රෙගුලාසි 1645 | ආයතනයේ වාහනය සඳහා ලොග් සටහන් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

2.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතාවය සඳහා වූ දීමනාව රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවලට අදාළ කර නොගතයුතු බව 2002 ඔක්තෝබර් මස 25 දින හා අංක බීඩී/පීඑෆ්/1/174/1 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්‍ෂ ජනරාල්ගේ චක්‍රලේඛයෙන් දක්වා තිබුණ ද ඊට පටහැනිව දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතාවය වෙනුවෙන් රු. 21,660ක වැටුප් හා දිරිදීමනා ගෙවා තිබුණි.

(ආ) අධ්‍යයන දීමනා සාවද්‍ය ලෙස වැටුපට එකතු කිරීම නිසා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකය ලෙස රු. 93,630ක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම අවිධිමත් ගෙවීම් වැරදි සහගත බවත් ගෙවන ලද මුදල් නැවත අයකර ගන්නා ලෙසත් ජාතික අයවැය අධ්‍යක්‍ෂ ජනරාල් විසින් ඔහුගේ අංක බීඩී/අයිඑන්එස්/සීඑල්යූඑස්-ඒ/078 හා 2003 ජූලි 18 දිනැති ලිපියෙන් උපදෙස් දී තිබුණු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 9,389,906ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 9,911,824 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 5,515,000ක් වූ රජයේ ප්‍රදානය හේතුකොටගෙන ඌනතාවය රු. 3,874,906ක් දක්වා අඩුවූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු. 5,927,000 ක්වූ රජයේ ප්‍රදානය හේතුකොට ගෙන ඒම ඌනතාවය රු. 3,984,824ක් දක්වා අඩු වී තිබුණි.

3.2 කාර්ය සාධනය

ලෝක බැංකු ආධාර මත දෙවන සාමාණ්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය ස්ථාපිත කර තිබුණි.

ව්‍යාපෘති සැලසුම අනුව පුස්තකාල වැඩි දියුණු කිරීම සඳහාත් පුස්තකාල හා විඥාපන විද්‍යා අංශවල අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ සඳහාත් විධිවිධාන සැලැස්වීම ආයතනයේ මූලික අරමුණ වී තිබුණි.

එම අරමුණු ඉටුකර ගැනීම සඳහා සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් පහත දැක්වේ.

(i) ආයතනය පිහිටුවීම
(ii) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම
(iii) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය දේශීයව හා විදේශීයව පුහුණු කිරීම
(iv) සමහර පාඨමාලා ආරම්භ කිරීම
(v) ආයතනයේ පුස්තකාල හා පරිගණක ඒකකය වැඩිදියුණු කිරීම
(vi) වාර්ෂිකව ගුරු පුස්තකාලයාධිපතින් 300-400 පුහුණු කිරීම

පහත කරුණු විගණනයේ දී පරීක්ෂණය විය.

(අ) පාඨමාලාවන් ආරම්භ කළ වර්ෂයේ සිට 2006 වර්ෂයේ අවසානය දක්වා පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් අඩුවී තිබුණ ද 2007 වර්ෂයේ ලියාපදිංචියේ සුළු වර්ධනයක් නිරීක්ෂණය විය.

(ආ) 2007 වර්ෂයේ පාඨමාලාවන් හා වැඩමුළු ආරම්භ කිරීම වෙනුවෙන් විවිධ අවස්ථාවල දී පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා රු. 63,537ක් වියදම් කර තිබුණ ද 2007/2008 අධ්‍යයන වර්ෂය සඳහා පාඨමාලාවන් සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 188ක් වූ අතර වැඩමුළු සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 153කි. ඇතැම් පාඨමාලාවන් සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි නොවන බව විගණනයට නිරීක්ෂණය විය.

3.3 පුස්තකාල පොත් මිළදී ගැනීම

(අ) ළමා පුස්තකාලයක් ආරම්භ කිරීමේ පරමාර්ථයෙන් ආයතනය විසින් 2003 වර්ෂයේ සිට රු. 82,603ක් වටිනා ළමා පොත් 598ක් ලබාගෙන තිබූ අතර, 2008 මාර්තු 31 දක්වා ළමා පුස්තකාලය ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) පසුගිය වසර තුළ පුස්තකාලය සඳහා මිළදීගත් රු. 23,910 ක් වටිනා පොත් 111ක් පුස්තකාලය සඳහා නිකුත් නොකර ළමා පුස්තකාලය තුළ ගොඩගසා තිබුණි.

3.4 අයවැය පාලනය

ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගි කරගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

4. පද්ධති හා පාලන

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ආදායම් ගිණුම්ගත කිරීම
(ආ) ලෙජර පවත්වාගැනීම
(ඇ) උපලේඛන පිළියෙල කිරීම

එස්. ස්වර්ණජෝති,
විගණකාධිපති.

මගේ අංකය : ඒබී/එෆ් එ/2007
2008 අගෝස්තු 13

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

**කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තියට සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

2008 ජූලි 31 වන දිනැති ඔබගේ අංක සීඊ/ජී/එන්අයිඑල්අයිඑස්/එෆ්ජී/07 දරන විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණයන් සඳහා මෙම ආයතනයේ පිළිතුරු පහත දැක්වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

ප්‍රාග්ධන ආධාර වල එකතුව හා වත්කම් වල අගයේ වෙනස වන රු. 9,132.00, 2008 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

2.2.2 අක්‍රිය මුදල්

පාඨමාලා සඳහා මුදල් එකවර ලැබීමත් වියදම් ඉදිරි කාලය තුළ දරන නිසා මෙම මුදල් ශේෂයන් නිර්මාණය වී ඇත.

2.2.3 නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

(අ) වාහනයේ ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකර ඇති අතර එම කාර්යය ඉදිරියට අඛණ්ඩව සිදුකිරීමට කටයුතු කරනු ඇත.

(ආ) මෙම ආයතනයේ පාඨමාලා 12 තිබෙන අතර එම සියලුම පාඨමාලා සඳහා පාඨමාලා සමායෝජකයකු පත්කර ඇත. මෙම සෑම සමායෝජකයකුටම මාසික දීමනාවක් ගෙවීම්කරන අතර මෙම සමායෝජකයන් ආයතනයේ සේවකයන් මෙන්ම ආයතනයේ පිටත පුද්ගලයන් ද වේ. මෙම සමායෝජක කාර්ය භාරය සඳහා ගෙවීමක් සියලුම විශ්ව විද්‍යාලවල කරනු ලැබේ. අධ්‍යක්ෂවරිය ද පාඨමාලා කීපයක සමායෝජක ලෙස කටයුතු කර ඇති අතර ඒ අනුව එතුමියට මෙම රු. 18,000 ගෙවීම කර ඇත.

(ඇ) මෙම ආයතනයේ පාලක මණ්ඩලයේ තීරණයක් මත මෙම අරමුදල පිහිටුවා ඇත.

(ඈ) ආයතනයේ වාහනය සඳහා ලොග් සටහන් පොත් 2008 වර්ෂයේ සිට පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

2.2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) (ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයන් ගේ උපදෙස් අනුව ගෙවීම කරයි. මෙම චක්‍රලේඛනය මේ දක්වා බලාත්මකව පවතී.

3.2 කාර්ය සාධනය

2000 වර්ෂයේ මෙම ආයතනය ආරම්භ කරන ලද අතර එහි අතුරු අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ විගණන වාර්තාව දක්වා ඇති I සිට V දක්වා වූ කාර්යයන් බොහෝ දුරට සම්පූර්ණ කර ඇත. ඒ අනුව I ආයතනය පිහිටුවීම II අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා

ගැනීම III කාර්ය මණ්ඩල සඳහා දේශීය හා විදේශීය පුහුණුව IV පාඨමාලා ආරම්භ කිරීම V පරිගනක ඒකකය වැඩි දියුණු කිරීම සාර්ථකව සිදුකර ඇත. මෙම කාර්යයන්ට අමතරව පුස්තකාල ක්ෂේත්‍රයේ දේශීය හා අන්තර් ජාතික සම්මන්ත්‍රණ පැවැත්වීම, වාර සඟරා ප්‍රකාශයට පත් කිරීම, දේශීය හා ජාත්‍යන්තර සමුළුවලදී ශ්‍රී ලංකා නියෝජනය කිරීම, පාසල් පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට සහ පළාත් සභාවලට සහාය දීම, පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ විෂයමාලා සංවර්ධනය වැනි කාර්යයන් රාශියක් මේ කාලය තුළ දී ආයතනය ඉටුකර ඇත.

(අ) වාර්ෂිකව ගුරු පුස්තකාලයාධිපතිවරුන් 300-400 ක ප්‍රමාණයක් පුහුණු කරලීමට අප ආයතනය සැලසුම් කර තිබුන ද අදාළ පුහුණුවන්නන් නිසි පරිදි අධ්‍යාපන හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ අප වෙත යොමු නොකිරීම ගැටලුවක් වී ඇත. විශේෂයෙන්ම ගුරු පුස්තකාලයාධිපතීන්ගේ පුහුණු අවශ්‍යතා පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය නිසි සේවා ව්‍යවස්ථා පිළියෙල කර නොතිබීම මෙම ගැටළුවට ප්‍රධාන හේතුව වේ. මේ පිළිබඳව අප ආයතනය අධ්‍යාපන අමාත්‍යාංශයට දීගින් දිගටම කරුණු ඉදිරිපත් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් මෙම ගැටළුව විසඳීමට අධ්‍යාපන අමාත්‍යාංශය එකඟ වී ඇත. කෙසේවුව ද අපගේ ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි වැඩ සටහන්වලට මෙන්ම අපගේ ආධාරයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් මට්ටමින් සංවිධානය කරනු ලබන පුහුණු පාඨමාලාවලට සහභාගි වන සංඛ්‍යාව ගණනයකල විට ඉහත ඉලක්කගත ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ගුරු පුස්තකාලයාධිපතීන් පුහුණු කර ඇත.

(ආ) ඒ ඒ වසරවල පාඨමාලා සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයින් ආදළ වසර තුළදීම පාඨමාලාව අවසන් කොට සහතික ලබා නොගනී. බොහෝ පාඨමාලා වසර මැද ආරම්භ වී ඊළඟ වසරේ අවසාන වේ.

(ඇ) මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව ඉහත (අ) ඡේදය යටතේ දක්වා ඇති කරුණු වේ. ඉදිරියේ දී මෙම තත්ත්වය මග හැරී යාම අපේක්ෂා කෙරේ.

(ඈ) ඇතැම් වර්ෂවල ඇතැම් පාඨමාලා සඳහා ප්‍රමාණවත් සිසුන් ලියාපදිංචි නොවීම සෑම අධ්‍යයන ආයතනයක්ම මුහුණ දෙන පොදු ගැටළුවකි. පාඨමාලා සඳහා ලබාදෙන ප්‍රචාරය සීමිත වීමත් වෙනත් ආයතනවල සමාන පාඨමාලා සමග තරඟ කිරීමට සිදුවීම. ඉහත (අ) යටතේ දක්වා ඇති අන්දමට අධ්‍යාපන අමාත්‍යාංශයේ මේ පිළිබඳ ඇති සුවිශේෂ ගැටළු මේ තත්ත්වයට බලපා ඇත. ඉදිරියේදී මේ තත්ත්වය මගහැරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3.3 පුස්තකාල පොත් මිලදී ගැනීම

(අ) සහකාර පුස්තකාලයාධිපතිවරයා දැනට අධ්‍යයන නිවාඩු ලබාදී ඇති අතර, පුස්තකාලය සඳහා අවශ්‍ය වන පිරිස් බඳවා ගැනීමෙන් පසු විවෘත කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) මෙම පොත් තොගය නිකුත් කිරීමට කටයුතු කර නොමැත්තේ මෙම ආයතනයේ සිසුන්ට ප්‍රායෝගික පුහුණුව සලසාදීම සඳහා එම පොත් අවශ්‍යවන බැවිනි. පුස්තකාලයට නිකුත් කිරීම කලේ නම් පුහුණු පාඨමාලාවල දී අවශ්‍ය වර්ගීකරණ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා පොත් සපයා ගැනීම කල නොහැකි වේ.

3.4 අයවැය පාලනය

අයවැය ලේඛනයේ ඇති වූ විචලනයන් අවම කර ඵලදායී කලමනාකරණ උපකරණයක් ලෙස භාවිතයට ගැනීමට කටයුතු කරනු ඇත.

4. පද්ධති හා පාලන

ආදායම් ගිණුම්ගත කිරීම, ලෙජරය, උළුලේඛන කෙරේ අවධානය යොමු කිරීමට කටයුතු කරනු ඇත.

එම්. එස්. යූ. අමරසිරි,
අධ්‍යක්ෂක.

06-513

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - රද්දොළුගම ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුවේ පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0620-02300087-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.16 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එම්. ගුණසිංහ විසින් සහතික කරන ලද 2007.04.10 දිනැති අංක 1962 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, රද්දොළුගම පදිංචි ඇතිගේ නිමල් රන්ජිත් සිල්වා යන අය

බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ හැටදහස් එකසිය විසිඅටයි ශත හැත්තෑඅටක (රු. 7,60,128.78) මුදලක් 2007 ඔක්තෝබර් මස 15 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 7,60,128.78 මුදල ද, 2007.10.16 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1962 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දූනගහ පත්තුවේ, අළුත්කුරු කෝරළේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කෙහෙල්ඇල්ල උප කාර්යාලය තුළ අකරගම පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද 1994.07.10 දිනැති අංක 6732ඒ දරන සැලැස්මේ සඳහන් මීගහලන්ද හෙවත් මීගහවත්ත, කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් ඩී12 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට්ස් ඩී15 සහ ඩී14 ද, නැගෙනහිරට : ලොට් ඩී13 ද, දකුණට : ගුණසාර මාවත ද, බස්නාහිරට : ලොට් ඩී 11 ද යන මායිම් තුළ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20)ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඊ 747/160 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි- අයකිරීම් නීති.

06-656

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0104400529.

ණයකරුගේ සම්පූර්ණ නම : හෙට්ටිආරච්චිගේ රංජිත් රත්නසිරි.

බූත්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. එන්. පී. විතාන විසින් ලියා සහතික කරන ලද අංක 1309 හා 1997.01.08 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූඑක්දහස් තිස්දෙකයි ශත පනස්නවයක (රු. 91,032.59) මුදලක් වර්ෂ 2007.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑහයදහස් අටසිය අනූතුනයි ශත අසූහතක (රු. 76,893.87) මුදල ද වර්ෂ 2007.09.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දාහතරදහස් එකසිය තිස්අටයි ශත හැත්තෑදෙකක (රු. 14,138.72) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූඑක්දහස් තිස්දෙකයි ශත පනස්නවයක (රු. 91,032.59) ද,

(2) එකී රුපියල් හැත්තෑහයදහස් අටසිය අනූතුනයි ශත අසූහතක (රු. 76,893.87) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොළියක් 2007.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ නොවැම්බර් මස 27 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ. අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ අංක 01 මහර උප කාර්යාලයේ පින්නමැද, අංක 01, දලුපිටිය පාරේ, වරිපනම් අංක 128/13/Bහි පිහිටි තලගහකුඹුර නොහොත් ඉඹුල්ගහකුඹුර, හොරියන්වෙල, ඉඹුල්ගහකුඹුර නොහොත් කිතුලේකුඹුර, දෙනියෙකුඹුර, කහටගහකුඹුර සහ වැටකෙයියාකුඹුර නමැති ඉඩමට 1994.04.25 දින ඒ. ඒ. පී. ජේ. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 403A පිඹුර ප්‍රකාර ලොට් 5ට මායිම්, උතුරට : පිඹුරු අංක 515/1991හි ලොට් 4Aහි ඉතිරි කොටස ද, නැගෙනහිරට : ලොට් 14 ද, දකුණට : ලොට් 6 සහ ලොට් 16 ද, බටහිරට : ලොට් 16 සහ ලොට් 4 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 13.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C437/62හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

06-626

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1908700042.

ණයකරුගේ සම්පූර්ණ නම : මාරසිංහ ආරච්චිගේ චන්ද්‍රකාන්ති මාරසිංහ සහ රණතුංග ජයසේකර කෝරළගේ ගුණසේකර.

වයික්කාල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ලේකම්ගේ විසින් ලියා සහතික කරන ලද අංක 1244 හා 2007.10.01 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දහහතර ලක්ෂ හාරසිය හැටඑක් දහස් දෙසීය පනහයි ශත තිස් එක (රු. 14,61,250.31) මුදලක් වර්ෂ 2009.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දොලොස් ලක්ෂ දෙසීය අනූනව දහස් දෙසීය හතලිස් දෙකයි ශත හතලිස් හතරක (රු. 12,99,242.44) මුදල ද වර්ෂ 2009.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ හැට දෙදහස් හතයි ශත අසූ හතක (රු. 1,62,007.87) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දහහතර ලක්ෂ හාරසිය හැටඑක් දහස් දෙසීය පනහයි ශත තිස් එක (රු. 14,61,250.31) ද,

(2) එකී රුපියල් දොලොස් ලක්ෂ දෙසීය අනූනව දහස් දෙසීය හතලිස් දෙකයි ශත හතලිස් හතරක (රු. 12,99,242.44) මුදල මත අයවිය යුතු වර්ෂයකට 24% බැගින් වන පොළියක් 2009.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ මාර්තු මස 03 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ දකුණු කටුගම්පොල කෝරළේ, කටුගම්පොල හත් පත්තුවේ, උඩුබද්දාව ප්‍රාදේශීය සභා සීමාවේ ඉලුප්පුගොමුව ග්‍රාමයේ හි පිහිටි කොස්ගහමුලවත්ත සහ කොස්ගහමුලහේන නමැති ඉඩමට 2007.03.28 දින ජේ. ඒ. රෝහිත ජයලත් මානක තැන විසින් මැන සම්පාදිත අංක 127 පිඹුර ප්‍රකාර ලොට් 01ට මායිම්, උතුරට : කුඹුක්ගහමුල්ල මධ්‍ය මහා විද්‍යාල පරිශ්‍රය ද, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් 02 ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද, බටහිරට : ප්‍රාදේශීය සභා පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් තිස් නවයයි දශම එකක (අ. 0, රූ. 1, පර්. 39.1) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේ ද මාර්ග පරවශතාවය ද සමග කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K224/26හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

06-630

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2500000671.

ණයකරුගේ සම්පූර්ණ නම : අළුත්වත්ත දිසානායකලාගේ වසන්ත දිසානායක.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 1324 හා 1998.02.21 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හැටදහස් දෙසීය පනස්අටයි ශත හැත්තෑතුනක (රු. 60,258.73) මුදලක් වර්ෂ 2005.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස්දහස් හාරසිය හතරයි ශත තිස්හතරක (රු. 50,404.34) මුදල ද වර්ෂ 2005.12.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් නවදහස් අටසිය පනස්හතරයි ශත තිස්නවයක් (රු. 9,854.39) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැටදහස් දෙසීය පනස්අටයි ශත හැත්තෑතුනක් (රු. 60,258.73) ද,

(2) එකී රුපියල් පනස්දහස් හාරසිය හතරයි ශත තිස්හතරක (රු. 50,404.34) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2006.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ පෙබරවාරි මස 23 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මැද්දෙකැටිය කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, කන්දෙගෙදර සහ මෙතන්ගරේ ග්‍රාමයන්හි පිහිටි කන්දෙගෙදර එස්ටේට් නමැති ඉඩමට 1996.10.15 දින බී. එච්. ඒ. ද සිල්වා මානක තැන විසින් මැන සම්පාදිත අංක 1651/ඒ පිඹුර ප්‍රකාර ලොට් 73ට මායිම්, උතුරට : ලොට් 70 ද, නැගෙනහිරට : ලොට් ආර් 1 ලෙස ලකුණු කරන ලද මාර්ගයට වෙන් කරන ලද කොටස ද, දකුණට : ලොට් 74 ද, බටහිරට : ලොට් 71 සහ ලොට් 72 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 86/15හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

06-629

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0104400596.

ණයකරුගේ සම්පූර්ණ නම : හේවාගමගේ දෝන ගංගා ප්‍රියංගිකා පෙරේරා සහ හෙට්ටිමුදියන්සේලාගේ උපුල් රංජිත් ජිනදාස.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. පතිරත්න විසින් ලියා සහතික කරන ලද අංක 7988 හා 1997.0310 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැට හත් දහස් එකසිය හැත්තෑහතයි ශත හතලිස් හතක (රු. 1,67,177.47) මුදලක් වර්ෂ 2008.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හයසිය පනස් දෙකයි ශත හතලිස් තුනක (රු. 1,00,652.43) මුදල ද වර්ෂ 2008.12.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හැටහය දහස් පන්සිය විසි පහයි ශත හතරක් (රු. 66,525.04) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැට හත් දහස් එකසිය හැත්තෑහතයි ශත හතලිස් හතක (රු. 1,67,177.47) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හයසිය පනස් දෙකයි ශත හතලිස් තුනක (රු. 1,00,652.43) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50% බැගින් වන පොළියක් 2009.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ ජනවාරි මස 27 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ දොම්පෙ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත දෙකටන, පනන්වෙල පිහිටි "කැටකෙලගහ වත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි විසින් සාදන ලද 2003 නොවැම්බර් 03 (එහෙත් 2000 ඔක්තෝබර් 3 ලෙස ලියාපදිංචි කොට ඇති) දාතම හා අංක 744 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කොට නිරූපිත ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව D 391/152 හි ලියාපදිංචි කර ඇති එකී අංක 744 දරන පිඹුරට අනුව උතුරට : පාර ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 2 ද, දකුණට : ආර්. ඒ. සිරිසේනට අයිති ඉඩම ද සහ බටහිරට : බලයලත් මිනින්දෝරු ටී. අමරසිංහ විසින් සාදන ලද 1960 අගෝස්තු 30 දාතම හා අංක 658 දරන පිඹුරේ නිරූපිත ලොට් B හි ඉතිරි කොටස ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිඑකයි දශම අටයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 21.80) වන බෙදා වෙන් වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොළ, වගාවන් සහ අනෙකුත් සියලුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

06-568/2

**සම්පත් බැංකුව පීඑල්සී**
(කලින් සීමාසහිත සම්පත් බැංකුව ලෙස හැඳින්වුන)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංකය : 0052 5000 0377.

2007 අගෝස්තු මස 30 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පන්නිපිටිය, කොට්ටාව, වැව්දෙනිය අංක 44 දරන ස්ථානයේ පදිංචි රණසිංහ ආරච්චිගේ දොන් ලලිත් යන අය කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 ජනවාරි 29 දාතම සහ අංක 2648 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 මැයි මස 04 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් විසි ලක්ෂ අසූ දහස් හයසිය විසිහයකුත් ශත හැත්තෑ එකක් (රු.20,80,626.71 ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් විසිලක්ෂ අසූදහස් හයසිය විසිහයකුත් ශත හැත්තෑ එකක (රු.20,80,626.71 ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දහනව ලක්ෂ එකොලොස් දහස් හාරසීය හතලිස් හතකුත් ශත අනූ තුනක (රු.19,11,447.93 ක් පමණයි) මුදල වසරකට සියයට (15.5%) බැගින් 2007 මැයි මස 05 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2648 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුළ කොට්ටාවේ පිහිටි ගලබොඩ වත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ විසින් සාදන ලද 2005 මාර්තු 17 දාතම හා අංක 2172 දරන පිඹුරේ ලොට් A ලෙස ලකුණු කොට නිරූපිත හෝමාගම ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G 1621/89 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 2172 පිඹුරට අනුව උතුරට: පාර ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් ද, දකුණට : එම ඉඩමේම ලොට් D සහ ලොට් B ද, සහ බටහිරට : බිම් කාණුව ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තිස්පහයි දශම හතරයි බිංදුවක් (අක්. 0, රූඩ්. 0, පර්. 35.40) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන් සහ ගොඩනැගිලි ද සමග සහ බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 1992 ඔක්තෝබර් 07 දාතම හා අංක 3611 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

06-568/3

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 අප්‍රේල් මස 30 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දේව මනෝහරන් ස්වාමිනාදන් විසින් ලියා සහතික කරන ලද (මෙහි මින් මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 6075 සහ 2004 සැප්තැම්බර් මස 02 දින දරන උකස් බැඳුම්කරය මගින් (මෙහි මින් මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) මීගමුව, තලාදූව පාර, අංක 68/4 දරන ස්ථානයේ පදිංචි මරුතවෙල් සරවන කුමාර් යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත සඳහන් උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව 2009.02.09 වන දිනට රුපියල් විසිපන්ලක්ෂ නවදහස් හයසිය අසූ අටකුත් ශත හැට අටක මුදලක් (රුපියල් 25,09,688.68) වර්තමානයේදී එකී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් විසිපන්ලක්ෂ නවදහස් හයසිය අසූඅටකුත් ශත හැටඅටක මුදල(රුපියල් 25,09,688.68) සහ 2009.02.09 දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වශයෙන් රුපියල් විසිතුන්ලක්ෂ හතළිස්දහස් එකසියදහසයකුත් ශත හතළිස්හයක මුදල මත (රුපියල් 23,40,116.46) 2009.02.10 වන දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 26.25% බැගින් තවදුරටත් පොලිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ට්‍රියැඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ

විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ මීගමුව මහනගර සභා සීමාව ඇතුළත බෝලවලාන පළමු කොට්ඨාසයේ පිහිටි එක් ඉඩමක් ලෙස ඒකාබද්ධ කොට උස් බිමක් ලෙස සංවර්ධනය කරන ලද දංගහකුඹුර හෙවත් කුරුවිකුඹුර අබරන්ආරච්චිගේ කුඹුර සහ මරදගහකුඹුර හෙවත් මදනගහකුඹුර තෙල්ගහකුඹුර නමැති එකිනෙකට යාබද ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ඩී. සිරිසේන විසින් මැන සාදන ලද අංක 1342 සහ 1969 ජූලි මස 26 වන දින පිඹුරට අනුව බෙදා වෙන් කළ ලොට් 19 දරන බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 33 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, නැගෙනහිරට : ලොට් 20 ද, දකුණට : ලොට් 34 (අඩි 15 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, බස්නාහිරටः ලොට් 18 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවකුත් දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 15.2) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති සියලු දේත් සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ166/130 යටතේ ලියාපදිංචි කර ඇති අතර, ඉහත කී දංගහකුඹුර හෙවත් කුරුවිකුඹුර, අබරන්ආරච්චිගේකුඹුර සහ මරදගහකුඹුර හෙවත් මදනගහකුඹුර, තෙල්ගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. කෲස් ද දාබරේරා විසින් මෑත කාලීනව මැන සාදන ලද අංක 4712/1986 (ලොට් 19) සහ 1986 සැප්තැම්බර් මස 29 දිනැති පිඹුර ප්‍රකාරව බෝලවලාන පළමු කොට්ඨාසයේ පිහිටි II වන එලිසබත් මාවතේ වරිපනම් අංක 33 දරන එකී ලොට් 19 ට මායිම් උතුරට : II වන එලිසබත් රැජින මාවතට වැටී ඇති මහ නගර සභා පාර ද, නැගෙනහිරට : ටී. පී. රැදිගුට අයිති ලොට් 20 ද, දකුණට : අඩි 15 ක් පළල පාර ද, බස්නාහිරට : බී. සී. විල්සන්ට අයිති ලොට් 18 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවකුත් දශම දෙකක (අ. 0, රූ, 0, පර්. 15.2) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති සෑම සියලු දේත් සමගය.

ඉහත කී අංක 4712/1986 දරන පිඹුරේ නිරූපිත ඉහත කී ලොට් 19 ට බලයලත් මිනින්දෝරු එච්. එල්. කෲස් දාබරේරා විසින් මෑත කාලීනව මැන සාදන ලද අංක 8612/2004 සහ 2004 ජූලි මස 19 දිනැති පිඹුර ප්‍රකාරව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව මහ නගර සභා සීමාවේ සහ මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ බෝලවලාන 1 වන කොට්ඨාසයේ පිහිටි දංගහකුඹුර හෙවත් කුරුවිකුඹුර, අබරන්ආරච්චිගේ කුඹුර සහ මරදගහකුඹුර හෙවත් මරදගහකුඹුර තෙල්ගහකුඹුර නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු එච්. එල්. කෲස් දාබරේරා විසින් මැන සාදන ලද අංක 4712/1986 සහ 1986.09.29 දිනැති පිඹුරේ) මැන සාදන ලද අංක 8612/2004 නමැති පිඹුර ප්‍රකාර II වන එලිසබෙත් රැජින මාවතේ වරිපනම් අංක 27 දරන පරිශ්‍රය එනම් ලොට් 19 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : මහ නගර සභා පාර ද, නැගෙනහිරට : ලොට් 20 ද, දකුණට : පාර ද, බස්නාහිරට : ලොට් 18 ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 8612/2004 දරන පිඹුර අනුව පර්චස් දාහතරකුත් දශම හයක (අ. 0, රූ. 0, පර්. 14.6) හෙවත් හෙක්ටයාර 0.0369 ක විශාල බිම් කැබැල්ලය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

06-554

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 30145.

2009 මාර්තු මස 24 වන දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

යාපනේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. තියාගරාජා විසින් 2005 ඔක්තෝබර් මස 06 වන දින සහතික කරන ලද අංක 8615 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී) හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වේලුපිල්ලෙයි කුලනන්තරාජා සහ බිරිඳ වන රතිමාලර් කුලනන්තරාජා ණයකරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසි දෙලක්ෂ පහළොස් දහස් දෙසීය දහතුනයි ශත හැත්තෑ නවයක (රු. 22,15,213.79) මුදලක් 2008 නොවැම්බර් මස 19 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ට අයවිය යුතුව ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසි දෙලක්ෂ පහළොස් දහස් දෙසීය දහතුනයි ශත හැත්තෑ නවයක (රු.22,15,213.79) මුදලට 2008 නොවැම්බර් මස 20 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රු. 14,80,581 ක මුදල මත 24% ක වැඩිදුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 8615 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝෆ් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක වී. මහේන්ද්‍රන් විසින් 2005 සැප්තැම්බර් මස 21 වන දින මැතකදී සාදන ලද අංක 3155 දරන පිඹුර පරිදි වරගු කල්වර් ලාච්චම් 2 - 3/4 ප්‍රමාණයෙන් යුත් උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් බටහිර වන්කානයි කොට්ඨාසයේ පාර්ශහි චූලිපුරම් වාලක්කම් පරෙයි පිහිටි වරගුකුලම් - ලාච්චම් 2 ක සහ කුලී 13.50 ප්‍රමාණයෙන් යුත් ඉඩමට සහ වගාවන්, ඉබේ වැඩුනු ගස් ඇතුළු සියළුදේත් සමග වන අතර ඊට මායිම්, නැගෙනහිරට : කන්දයියා තිලෙයින්පලම්ට සහ සින්නතම්බි තම්බිරාජාට හිමි දේපල ද, උතුරට : අම්පාලව් රාමලිංගම්ගේ උරුමක්කාරයින්ට හිමි දේපලද, බස්නාහිරට : අරියකුඩ්ඩි තාවරාජාට හිමි දේපළ ද, දකුණට : ඇල මාර්ගය ද, එහි පිහිටි කිසිවෙකුටත් අයිති නැති ළිඳද, මෙය බස්නාහිර මායිමට අනුබද්ධව ඇත. ජලය තුර්වායි ජල මාර්ගයෙන් බෙදාගනු ලැබේ.

මෙය යාපනයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ745/46 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දූනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

06-582

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1760015141
ණය ගිණුම් අංකය : 338107

2009 ජනවාරි මස 23 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

හොරණ ප්‍රසිද්ධ නොතාරිස් කේ. කන්නන්ගර විසින් 2006 දෙසැම්බර් මස 26 වන දින සහතික කරන ලද අංක 2458 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඞ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජයරම්‍යා මෙඩිකල් ස්ටෝර්ස් යන නාමය හා විලාශයෙන් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අමරසිංහ ආරච්චිගේ ගීතා මානෙල් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්පන් ලක්ෂ පනස් දෙදහස් අටසිය තුනයි ශත හැත්තෑ දෙකක (රු. 35,52,803.72) මුදලක් 2008 නොවැම්බර් මස 30 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තිස්පන් ලක්ෂ පනස් දෙදහස් අටසිය තුනයි ශත හැත්තෑ දෙකක (රු. 35,52,803.72) මුදලට 2008 දෙසැම්බර් මස 01 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,27,197.69 ක මුදල මත 21% ක වැඩිදුර වාර්ෂික පොලිය ද, සහ රු. 21,66,771.40 ක මුදල මත 28% ක වැඩිදුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 2458 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස්කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ප්ස්ඩෝර්ප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බලයලත් මානක බී. යූ. එස්. පර්නැන්ඩු විසින් 2004 ජූලි මස 17 වන දින සාදන ලද අංක 917 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තු හේවාගම් කෝරළේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝමාගම පිහිටි කැන්දලන්ද කියන ඉඩමේ භූමිය, වගාවන්, ගොඩනැගිලි සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන කොටසට මායිම්, උතුරට : හයිලෙවල් පාර ද, නැගෙනහිරට : හයිලෙවල් පාර සහ දැනට වරිපනම් අංක 191 දරන කැන්දලන්ද ද, දකුණට : හයිලෙවල් පාර සහ දැනට වරිපනම් අංක 170/1 දරන කැන්දලන්ද ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පර්චස් නවයයි දශම හයයි නවයක් (අ. 0, රූ. 0, පර්. 9.69) විශාල ඉඩම. මෙහි පහත සවිස්තරව විස්තර කර ඇති පරිදි එකී ලොට් 1 දරන කොටස කැන්දලන්ද කියන විශාල ඉඩමෙන් බෙදා වෙන්කරන ලද්දකි.

බලයලත් මානක ජී. එල්. බී. නානායක්කාර විසින් 1989 දෙසැම්බර් මස 20 වන දින සාදන ලද අංක 1806 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු හේවාගම් කෝරළේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝමාගම පිහිටි භූමිය, වගාවන්, ගොඩනැගිලි සහ සියළු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 9 දරන කොටසට මායිම්, උතුරට : හයිලෙවල් පාර සහ පාරක් සඳහා වෙන් කරන ලද කොටස ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 8 ද, දකුණට : එම ඉඩමේ ලොට් 10 ද, බස්නාහිරට : (පාරක් සඳහා වෙන් කොට ඇති) එම ඉඩමේ ලොට් 12 ද, යන මායිම් තුළ පර්චස් දහයයි දශම පහයි හයක් (අ. 0, රූ. 0, පර්.10.56) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1487/262 යටතේ ලියාපදිංචිව ඇත.

එසේම එකී අංක 1806 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 12 දරන කොටස ඔස්සේ පොදුවේ ගමන් කිරීමේ අයිතිය ද සමග වේ.

ආර්. ආර්. දූනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

06-583

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0100004368 සහ 0100005700

ණයකරුගේ සම්පූර්ණ නම : හීනටිගල බැද්දේ ලියනගේ සරත්චන්ද්‍ර ගුණසිරි.

කොළඹ, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. ජයමාන්න සහ එස්. පී. පී. එස්. කේ. සේනානායක විසින් ලියා සහතික කරන ලද අංක 7306 සහ 211 හා 1999.11.11 සහ 2001.02.26 දින දරන උකස්කර මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාර ලක්ෂ පන් දහස් අටසිය එකොළහයි ශත පනස් අටක (රු. 4,05,811.58) මුදලක් වර්ෂ 2008.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක් ලක්ෂ අනූ පන්දහස් තුන්සිය දෙකයි ශත විසි නවයක (රු. 1,95,302.29) මුදල ද වර්ෂ 2008.12.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ දහදහස් පන්සිය නවයයි ශත විසි නවයක් (රු.2,10,509.29) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාර ලක්ෂ පන් දහස් අටසිය එකොළහයි ශත පනස් අටක (රු. 4,05,811.58)

(2) එකී රුපියල් එක් ලක්ෂ අනූ පන්දහස් තුන්සිය දෙකයි ශත විසි නවයක (රු.1,95,302.29) මුදල මත අයවිය යුතු වර්ෂයකට 19.50% සහ 18.50% බැගින් වන පොළියක් 2009.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ ජනවාරි මස 27 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, උඩුගහ පත්තුවේ, සියනෑ කෝරළේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, නාබදළුව ග්‍රාමයෙහි පිහිටි ඕචාර්ඩ් එස්ටේට් හි ලොට් ආර්, ලොට් 1 ඒ, ලොට් 1 නමැති ඉඩමට 1996.11.23 දිනයන්හි කේ. ඩී. පී. වීරසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 1120 පිඹුර ප්‍රකාර ලොට් 66 ට මායිම්, උතුරට : ලොට් 67 ද, නැගෙනහිරටඃ ලොට් 65 ද, දකුණට : ලොට් 128 ද, බටහිරට : ලොට් 130 ද, යන මායිම් තුල පිහිටි පර්චස් දහයයි දශම බිංදුවයි අටක (අක්. 0, රූඩ්. 0, පර්. 10.08) හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි පහයි පහක (හෙක්. 0.0255) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 221/40 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-625

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0104401548.

ණයකරුගේ සම්පූර්ණ නම : ත්‍රිමාවිතාන රත්නසිරි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. එච්. ගමගේ විසින් ලියා සහතික කරන ලද අංක 3591 හා 2002.07.15 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්, එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතළිස් දහස් නවසිය දාහතරයි ශත දහතුනක (රු. 2,40,914.13) මුදලක් වර්ෂ 2008.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ දාහත්දහස් දෙසීය හතළිහයි ශත අසූදෙකක (රු.2,17,240.82) මුදලද වර්ෂ 2007.09.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිතුන්දහස් හයසිය හැත්තෑතුනයි ශත තිස්එකක (රු.23,673.31) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතළිස්දහස් නවසිය දාහතරයි ශත දහතුනක (රු. 2,40,914.13) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ දාහත් දහස් දෙසීය හතළිහයි ශත අසූදෙකක (රු. 2,17,240.82) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50% බැගින් වන පොළියක් 2007.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක් වූ නොවැම්බර් මස 27 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ, වැතර උප කොට්ඨාසයේ, වැතර ග්‍රාමයෙහි පිහිටි කහටගහලන්ද නමැති ඉඩමට 1999.10.21 දින එම්. ඩී. එන්. ප්‍රනාන්දු මානක තැන විසින් මැන සම්පාදිත අංක 4203A පිඹුර ප්‍රකාර ලොට් අංක 16 ට මායිම්, උතුරට : ලොට් 15 ද, නැගෙනහිරටඃ පැටිකිරිගේ දොන් විජේවර්ධනට අයත් කහටගහලන්ද නමැති ඉඩමේ පිඹුරු අංක 5058 දරන පිඹුරේ ලොට් F ද, දකුණට : කොළඹ සිට හොරණ දක්වා ප්‍රධාන පාර ද, බස්නාහිරට : ලොට් 15 ද යන මායිම් තුළ පිහිටි පර්චස් නවයයි දශම හතයි දෙකක (අක්. 0, රූඩ්. 0, පර්. 9.72) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N320/74 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියම පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-624

**මහජන බැංකුව - පූගොඩ**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරනලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2006.11.17 දිනැති අංක 11855 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මුතුතන්ත්‍රීගේ සේනක ජෝයි චන්ද්‍රල පීරිස් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ අනූපන්දහස් (රු.1,95,000) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.04.25 දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් එක්ලක්ෂ අනූපන්දහස (රු.1,95,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ අනූපන්දහස (රු.1,95,000)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 11855 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය සභා බල සීමාවේ (පූගොඩ උප කාර්යාලය) ඕවිටිගම පිහිටි, අළුබෝගහලන්ද, මුත්තෙට්ටුවේලන්ද, මුත්තෙට්ටුවේවත්ත, අළුබෝගහලන්ද, අළුබෝගහදෙනිය සහ හුන්ගන්වලදෙනිය නමැති ඉඩමට බලය ලත් මානක බී. එස්. අලහකෝන් මහතා විසින් 2005.09.30 වන දින මැන සකස් කරන ලද පිඹුරු අංක 4420ඒ හි ලොට් අංක 10 ඒ දරන කොටසට මායිම්, උතුරට : අඩි 20ක් පළල පාර සහ බලයලත් මානක වී. ඒ. එල් . සේනාරත්න මහතාගේ අංක 2588 පිඹුරේ ලොට් ඒ ද, නැගෙනහිරට : බලයලත් මානක වී. ඒ. එල්. සේනාරත්න මහතාගේ 2588 දරන පිඹුරේ ලොට් 9 ද, දකුණට : බලයලත් මානක එම්. එස්. ප්‍රනාන්දු ගේ අංක 1662 දරන පිඹුරේ ලොට් 4 සහ 3 ද, බස්නාහිරට : ලොට් 10බී ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අක්කර 0, රූඩ් 0, පර්චස් 10) ක් හෙවත් හෙක්ටයාර් 0.02529 ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 419/171 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත පිඹුරේ මාර්ගය සඳහා වෙන්කර ඇති කොටසේ මාර්ග අයිතීන්ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
131, නුවර පාර, බැලුම්මහර,
මුදුන්ගොඩ.

06-588

**මහජන බැංකුව - ඉමදූව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. සී. අරෝෂනී විසින් 2007.01.24 දින ලියා සහතික කරන ලද අංක 1739 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වනිග චින්තාමනී මොහොට්ටිගේ බන්දුල පද්මකුමාර, වීරසිංහගේ ජයවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහස් හයසිය දාහතරයි ශත පනස්හතර (රු. 3,75,614.54) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.08.10 දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහස් හයසිය දාහතරයි ශත පනස්හතර (රු. 3,75,614.54) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහස් හයසිය දාහතරයි ශත පනස්හතර (රු. 3,75,614.54) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 1739 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, ඉමදූව ප්‍රාදේශීය සභා සීමාව තුළ පරගොඩ පිහිටි මීගහකුඹුර ගොඩහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. ආර්. ජයසුන්දර විසින් 2004.11.21 දින මැන සම්පාදිත 1442 දරන පිඹුරේ අංක ඒ දරන කැබැල්ලට මායිම්, උතුරට: මෙම ඉඩමේ අංක 268 දරන කැබැල්ලද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 18 දරන කැබැල්ල ද, දකුණට : මීගහකුඹුර සහ බස්නාහිරට : මෙම ඉඩමේ අංක 20 දරන කැබැල්ල ද යන සතර මායිම් තුළ පිහිටි රූඩ් තුනයි, පර්චස් පහළොවයි දශම අටක් (අ. 0, රූ. 03, පර්. 15.8) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියලුම දේ ද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 702/35 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහල ඩික්සන් පාර, ගාල්ල.

06-587

### මහජන බැංකුව - කොග්ගල

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2008.08.29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. සී. අරෝෂනී විසින් 2006.10.09 දින ලියා සහතික කරන ලද අංක 1520 සහ 1521 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්. අජිත් ප්‍රියන්ත පුෂ්පනාත් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර යටතේ දැනට රුපියල් දහඅට ලක්ෂ හැට එක්දහස් හාරසිය පනස් අටයි ශත දෙක (1861,458.02) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.05.01 දින සිට වර්ෂයකට 17.5% බැගින් රුපියල් දහ අට ලක්ෂ හැට එක් දහස් හාරසිය පනස් අටයි ශත දෙක (1861,458.02) ක මුදලක් සහ රුපියල් හාරලක්ෂ අනූ අට දහස් පන්සිය පනස් අටයි ශත එකොලහ (498,558.11) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.08.01 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් හාරලක්ෂඅනූ අට දහස් පන්සිය පනස් අටයි ශත එකොලහ (498,558.11) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අනුව එකී රුපියල් දහ අට ලක්ෂ හැටඑක් දහස් හාරසිය පනස් අටයි ශත දෙක (1861,458.02)ක මුදල සහ රුපියල් හාරලක්ෂ අනූඅටදහස් පන්සිය පනස් අටයි ශත එකොලහ (498,558.11) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 1520 සහ 1521 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේගොඩ, තල්ගස්යාය, පිහිටි පේරගස්තුඩුව නොහොත් නෙරළුඋයනවත්ත නැමති ඉඩමේ ඒ අක්ෂරය දරන කැබැල්ල සඳහා බලයලත් මිනින්දෝරු සී. ගුණවර්ධන විසින් 2005.03.22 යන දින මැන සාදන ලද අංක 575 ඒ දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේම අංක 5ජ් ද, නැගෙනහිරට : මෙම ඉඩමේම කැබලි අංක 06 ද, දකුණට : මෙම ඉඩමේම 5ඍ, බී සහ 5 ඩී වල කොටසක් ද, බස්නාහිරට : මෙම ඉඩමේම 5බී දරන කැබැල්ලේ ඉතිරි කොටස ද යන මෙකී සතර මායිම් තුල පිහිටි අක්කර හතරක් (අක්කර 4, රූඩ් 0, පර්චස් 0) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියලු දේ ද වේ. මෙමඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 181/85 යටතේ ලියාපදිංචි කර ඇත.

575ඒ පිඹුරේ දක්වා ඇති කැබලි අංක ඩී සහ ඊ මතින් ඒ හරහා වැටී ඇති මාර්ග පරවශ්‍යතා අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්‍ෂ මන්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නො. 22, පහල ඩික්සන් පාර, ගාල්ල.

06-589

### මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2009.01.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ප්‍රසිද්ධ නොතාරිස් මානෙල් පරණවිදාන සමරදිවාකර විසින් ලියා සහතික කරනලද අංක 106 හා 1993 ඔක්තෝබර් මස 08 වන දින දරන, සහ සියල්ල කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඥානා ඒකනායක විසින් ලියා සහතික කරන ලද අංක 2518 හා 1998 සැප්තැම්බර් මස 11 වන දින දරන සහ අංක 4009 හා 2003 මාර්තු 19 වන දින දරන උකස් බැඳුම්කර සහ අංක 3755 හා 2002 අප්‍රේල් 30 වන දින දරන අතිරේක බැඳුම්කරය මත, ගෙවිය යුතු මුදල් ගෙවීමට, ෂැන්කෙම් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති බැවින්, රුපියල් හය මිලියන හැත්තෑපන් දහස් හයසිය පනස් හතරයි හත පහලොව (රු.6,075,654.15) ක මුදලක් එකී බැඳුම්කර මත පොලියද සමග මහජන බැංකුවට දැන් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇත.

එකී රුපියල් හය මිලියන හැත්තෑපන් දහස් හයසිය පනස් හතරයි ශත පහලොව (රු.6,075,654.15) ක මුදල සහ 2008 සැප්තැම්බර් 15 වන දින සිට විකුණුම් දිනය දක්වා, රුපියල් තුන් මිලියන නව ලක්ෂ පනස් හය දහස් හයයි හත හැත්තෑහත (3,956,006.77) ක මුදල මත වර්ෂයකට 17.5% (වර්ෂයකට සියයට දහ හතයි දශම පහ) අනුපාතිකයට සහ රුපියල් හත් ලක්ෂ දහනව දහස් හයසිය හතරයි ශත හතලිහ (රු.719,604.40) මත වර්ෂයකට 22% (වර්ෂයකට සියයට විසි දෙක) අනුපාතිකයට සහ රුපියල් එක් මිලියන හාර ලක්ෂ හතලිස් දෙකයි ශත අනූ අට (රු.1,400,042.98) මත වර්ෂයකට 21% (වර්ෂයකට සියයට විසි එක) අනුප්‍රමාණයට තවදුරටත් පොලියද සමග සහ විකුණුම් පිරිවැය සහ අනෙකුත් ගාස්තු, ඒ දක්වා කරන ලද ගෙවීම්, කිසිවක් වේ නම්, අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 106, 2518 සහ 4009 දරන බැඳුම්කර සහ අංක 3755 දරන අතිරේක බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍ර බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පණත මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### ඉහත සඳහන් උපලේඛනය

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ, දකුණු අලුත්කුරු කෝරලේ, පෑලියගොඩ නගර සභා සීමාව තුල පෑලියගොඩ අඛණ්ඩ සංවර්ධන යෝජනා ක්‍රමය තුල පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. එම්. කේ. බී. මාවලගෙදර විසින් මැන සාදන ලද අංක 8502 -1 හා 1985.07.08 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 18 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට සහ බස්නාහිරට : ලොට් 21, නැගෙනහිරට : ලොට් 19 දකුණට : ලොට් 4 යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් දහතුනයි දශම එකයි පහ (අක්කර 0, රූඩ් 0, පර්චස් 13.15) හෝ හෙක්ටයාර 0.03325 විශාල ඉඩම් කොටස සම්බන්ධයෙන් ඇති සියලු බඳු හිමිකම් අයිතිවාසිකම් වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 831/128 හි ලියාපදිංචි කර තිබේ.

02. ඉහත කී පැලියගොඩ පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. එම්. කේ. බී. කේ. මාවලගෙදර විසින් මැන සාදන ලද අංක 8502-1 හා 1985.07.08 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 21 (ඇල දිගට ඇති වෙන්කිරීම) වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : අංක 8502-1 දරන එකී පිඹුරේ ලොට් 22 (ඇල සඳහා වෙන් කිරීම) නැගෙනහිරට : එකී පිඹුරේ දැක්වෙන ලොට් 110 දකුණට : එකී පිඹුරේ දැක්වෙන ලොට් 1,4,8,10,14,15 එන් එස්. සහ 18 සිට 20 දක්වා කැබලි බස්නාහිරට : පාර, යන මෙකී මායිම් තුල පිහිටි අක්කර එකයි පර්චස් දශම දෙකයි දෙක (අක්කර 1, රූඩ් 0, පර්චස් 0.22) විශාල ඉඩම් කොටස සම්බන්ධයෙන් ඇති සියලු බදු හිමිකම් අයිතිවාසිකම් වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී-903/161 හි ලියාපදිංචි කර තිබේ.

03. ඉහත කී පැලියගොඩ පිහිටි, ඉහත කී අංක 8502-1 හා 1985.07.08 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 (අඩි 25 ක් පළල පාරක් සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 3,9,10,14 15 සහ 18 සිට 21 දක්වා කට්ටි, නැගෙනහිරට : ලොට් 5,8,11, 13,16 සහ 17 දරන කට්ටි, දකුණට : පාර සහ කාසි වෙට්ටිවත්ත සහ බස්නාහිරට : ලොට් 3,9,10,14,15 සහ 21 දරන කට්ටි යන මෙකී මායිම් තුල පිහිටි රූඩ් එකයි පර්චස් විසි අටක් (අක්කර 0, රූඩ් 1, පර්චස් 28) හෝ හෙක්ටයාර 0.17200ක් විශාල ඉඩම් කොටස සම්බන්ධයෙන් ඇති සියලු බදු හිමිකම් අයිතිවාසිකම් වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 903/162 හි ලියාපදිංචි කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
ආයතනික ණය 1.

06-595

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ :

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් ලියා සහතික කරන ලද අංක 11537 හා 2006 මැයි 17 දින දරන මුල් උකස් බැඳුම්කරය හා අංක 12422 හා 2007 සැප්තැම්බර් 20 දින දරන ද්විතියික උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, "ආර්. පී. රෙස්ට්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස නුවරඑළියේ ව්‍යාපාරය කරගෙන යන, සුබසිංහගේ දොන් රංජිත් පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2009 ජනවාරි 31 වන දිනට එකී අංක 11537 හා 12422 දරන උකස් බැඳුම්කර මත එකී සුබසිංහගේ දොන් රංජිත් පෙරේරා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි විසි එක් ලක්ෂ දහහත් දහස් විස්සකුත් ශත අසූ හතරක (රු.1,21,17,020.84) මුදලක් සහ 2009 පෙබරවාරි 01වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පණස් එක් ලක්ෂ හැටහය දහස් හයසිය හැටක් (රු. 5,166,660) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොළිය ද රුපියල් පණස් ලක්ෂයක් (රු. 50,00,000) සඳහා බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) හෝ රඳවා ගැනීමේ බදු අඩුකිරීමෙන් පසු (net of withholding) දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට හෝ වර්ෂයකට සියයට දහයකුත් දශම පහයි බිංදුවක් (10.50%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රියෙල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කරනු ලබන හා ඒ කිනම් අනුපාතිකයක් වුවද ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි විසි එක් ලක්ෂ දහහත් දහස් විස්සකුත් ශත අසූ හතරක (රු. 1,21,17,020.84) මුදල සහ 2009 පෙබරවාරි මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පණස් එක් ලක්ෂ හැටහය දහස් හයසිය හැටක් (රු.5,166,660) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොලිය ද රුපියල් පණස් ලක්ෂයක් (රු.50,00,000) සඳහා බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) හෝ රඳවා ගැනීමේ බදු අඩුකිරීමෙන් පසු (net of withholding tax) දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට හෝ වර්ෂයකට සියයට දහයකුත් දශම පහයි බිංදුවක් (10.50%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රියෙල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කරනු ලබන හා ඒ කිනම් අනුපාතිකයක් වුවද ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කර වල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 11537 හා 12422 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහිපහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මන්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 11537 හා 12422 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පලාත කෝරළේ, බ්ලැක්පූල් ග්‍රාමයේ පිහිටි "බ්ලැක්පූල් පතන" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් මැන සාදන ලද අංක 7263 හා 2000 අප්‍රියෙල් 23 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : අංක 7138 දරන පිඹුරේ ලොට් අංක 8 සහ 1 සහ පාර ද, නැගෙනහිරට : පාර සහ ඒ. එස්. සුනිල් චන්ද්‍රවංශ හිමිකම් කියන ඉඩම ද, දකුණට : ඒ. එස්. සුනිල් චන්ද්‍රවංශ හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : ඒ. එස්. සුනිල් චන්ද්‍රවංශ හිමිකම් කියන ඉඩම සහ අංක 7138 දරන පිඹුරේ ලොට් අංක 4 සහ 8 ද යන මායිම් ඇතුළත පර්චස් විස්සක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ

එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලුපාර,
කොළඹ 03.

06-553/4

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ආර්. තිස්කුමාර විසින් ලියා සහතික කරන ලද අංක 300 හා 2003 නොවැම්බර් 10 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද ලියාපදිංචි කාර්යාලය මාතර පිහිටා ඇත්තා වූ ද සමාගමක් වන (මෙහි මින් ඉදිරියට සමාගම යනුවෙන් සඳහන් කරනු ලබන) “ෆයිබෙලයිට් (ප්‍රයිවට්) ලිමිටඩ්” යන සමාගම විසින් සහ (මෙහි මින් ඉදිරියට “උකස්කරු” යනුවෙන් සඳහන් කරනු ලබන) මාතර, විදාන පතිරණ හිරාන් ප්‍රසන්න අබේසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 දෙසැම්බර් 31 වැනි දිනට ඉහත කී අංක 300 දරන උකස් බැඳුම්කරය මත ඉහත කී ෆයිබ්‍රෙලයිට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් සහ ඉහත කී විදාන පතිරණ හිරාන් ප්‍රසන්න අබේසිංහ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට ඉහත කී අංක 300 දරන උකස් බැඳුම්කරය මත රුපියල් විසිලක්ෂ අසූතුන් දහස් විසි දෙකකුත් ශත හැට නවයක (රු. 20,83,022.69) මුදලක් සහ 2009 ජනවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහඅට ලක්ෂ පනස් තුන් දහස් හයසිය දහතුනක් (රු. 18,53,613.00) සඳහා එක් එක් වර්ෂයේ සෑම හයමාසයෙන් හය මාසයට ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික තැන්පතු පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. ඩී. ආර්.) වර්ෂයකට සියයට නවයක් (9%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් විසිලක්ෂ අසූතුන් දහස් විසි දෙකකුත් ශත හැටනවයක (රු. 20,83,022.69) මුදල සහ 2009 ජනවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහඅට ලක්ෂ පණස් තුන් දහස් හයසිය දහතුනක් (රු. 18,53,613) සඳහා එක් එක් වර්ෂයේ සෑම හයමාසයෙන් හය මාසයට ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික තැන්පතු පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. ඩී. ආර්.) වර්ෂයකට සියයට නවයක් (9%)ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 300 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 300 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සහ නගරසභා සීමාව ඇතුළත ගබඩා වීදියේ පිහිටි, “මැදගොඩ නොහොත් කරන්කැටියේ මුලන” නමැති ඉඩමේ ලොට් ජී දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන, මාතර, අනගාරික ධර්මපාල මාවත වරිපනම් අංක 1/1 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් ජේ දරන බිම් කට්ටිය (පාර) ද නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් එෆ් දරන කට්ටිය ද, දකුණට : නිල්වලා ගඟ ද බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් එච් දරන කට්ටිය ද යන මායිම් ඇතුළත බලයලත් මිනින්දෝරු ආර්. ඩී. පෙරේරා විසින් මැන සාදන ලදුව මාතර දිසා අධිකරණයේ අංක 20644 දරන බෙදුම් නඩුවට ගොනු කර තිබෙන අංක 728 හා 1951.04.18 දින දරන පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් නවයකුත් දශම පහක් (අ. 0, රූ. 1, පර්. 9.5) බිම් ප්‍රමාණයෙන් යුත් සම්පූර්ණ ඉඩමේ බිම සහ එහි පිහිටි වැව්ලි සහ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

06-553/2

---

### මහජන බැංකුව - ඕල්කට් මාවත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ඒ. ඩී. ආර්. මෙන්ඩිස් විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2007.05.03 දිනැති අංක 3059 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, චාමර විනිවිද කෝර්නර් තනි අයිතිකරු අද්දර පතිරණ ගේ පතිරණ විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 3059 දරන උකස්කර මත රුපියල් දහසය ලක්ෂයක (රු. 1,600,000) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද, 2007.10.03 වැනි දින සිට වර්ෂයකට සියයට දහසයයි දශම හතයි පහ (16.75%) බැගින් රුපියල් දහසය ලක්ෂයක (රු. 1,600,000) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් දහසයලක්ෂයක (රු. 1,600,000) මුදල අයකරගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 3059 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල ඒකකයේ සීමාව තුළ බත්තරමුල්ලේ පිහිටි කෝන්ගහවත්ත හෙවත් අඹගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. ඩී. එස්. ගුණතිලක විසින් 1980.07.21 දින මැන සාදන ලද අංක 738 දරන පිඹුරේ නිරූපිත ලොට් 90 වඩා නිවැරදිව ලොට් 9න් බෙදා වෙන් නොකරන ලද ප්‍රමාණයෙන් පර්චස් 20ක් වන (අ. 0, රූ. 0, පර්. 20) බටහිර කොටස, එකී ලොට් 90 වඩා නිවැරදිව ලොට් 9 දරන කොටසට මායිම් උතුරට : ලොට් 7 ද, නැගෙනහිරට : කොලොන්නේ ඉඩම ද, දකුණට : සුමිත්‍රආරච්චිගේ හර්බට් ගේ ඉඩම සහ බටහිරට : ලොට් 6 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස්හතරයි දශම හතයි හතරක් (අ. 0, රූ. 0, පර්. 34.74) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1506/56 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී නොබෙදූ කොටස පහත විස්තර කරනු ලබන පරිදි අංක 1009 දරන පිඹුරට අනුව නැවත බෙදා ඇත.

ඉහත කී පරිදි බත්තරමුල්ලේ පිහිටි කෝන්ගහවත්ත හෙවත් අඹගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ආර්. ඒ. ජයසිංහ විසින් 1996 පෙබරවාරි 29 වන දින මැන සාදන ලද අංක 1009 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : මීටර් 3ක් පළල පෞද්ගලික පාර ද, නැගෙනහිරට : කෝට්ටේ පාරේ වරිපනම් අංක 89 දරන පරිශ්‍රය, සමරකෝන්ගේ ගොඩපරගහඕවිට, දකුණට: සමරකෝන්ගේ ගොඩපරගහඕවිට සහ බටහිරට : නිවාසවලට යාමට ඇති පාර යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම එකයි තුනක් (අ. 0, රූ. 0, පර්. 19.13) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ ද වේ.

අංක 738 සී දරන පිඹුරේ ලොට් ඒ සහ ලොට් බී (අඩි 10ක් පළල) මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ උතුර).

කලාප ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය - 01)
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

06-591

---

## මහජන බැංකුව - ඕල්කට් මාවත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ඒ. ඩී. ආර්. මෙන්ඩිස් විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2007.05.03 දිනැති අංක 3058 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, චාමර විනිවිද කෝර්නර් තනි අයිතිකරු අද්දර පතිරණ ගේ පතිරණ විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 3058 දරන උකස්කර මත රුපියල් හත්ලක්ෂයක (රු. 700,000) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද, 2005.02.06 වන දින සිට වර්ෂයකට සියයට දහඅටයි දශම දෙකයි පහ (18.25%) බැගින් රුපියල් හත්ලක්ෂයක (රු. 700,000) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් හත්ලක්ෂයක (රු. 700,000) මුදල අයකරගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 3058 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ දකුණ අඹතලෙන් පහළ කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ මාදින්නාගොඩ, වරිපනම් අංක 178/20ඒ දරන, කෝන්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. කපුගීකියන මහතා විසින් 1975 සැප්තැම්බර් මස 14 වන දින මැන සාදන ලද අංක 2575 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 4 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 3 ද, නැගෙනහිරට : විලියම් සිංඤෝගේ දේපළ ද, දකුණට: ලොට් 5 ද සහ බටහිරට : ලොට් 6 (පාරක් සඳහා වෙන්කර ඇත) ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 10.5) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1506/54 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත ඉඩම් කොටස මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත දක්වා ඇති පරිදි මාදින්නාගොඩ පාරේ පිහිටි මාදින්නාගොඩ, වරිපනම් අංක 178/20ඒ දරන ඉහත කී කෝන්ගහවත්ත නැමැති ඉඩමේ අංක 2575 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 6 (අඩි 6ක් පළල පාරක් සඳහා වෙන් කර ඇති) දරන ඉඩම් කොටසට මායිම්, උතුරට: ලොට් 1 සහ 3 ද, නැගෙනහිරට : ලොට් 4 ද, දකුණට : ලොට් 2 සහ 5 ද, බටහිරට : ලොට් 1 සහ 2 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තුනක් (අ. 0, රූ. 0, පර්. 3) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1506/55 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ උතුර).

කලාප ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය - 01)
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

06-592

### මහජන බැංකුව - ඒකාබද්ධ බැංකු අංශය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ ඃ

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ඉමියගේ දෝන හිමාලි ලලනි පෙරේරා විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2006 ජුනි 07 දිනැති අංක 876 දරන උකස්කරය සහ 2006.12.15 දිනැති අංක 1025 දරන උකස්කරය මත අයවියයුතු මුදල් ගෙවීම වලන එන්ටප්‍රයිසස් නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන මැදගමගේ අරුණ චාමින්ද ප්‍රනාන්දු විසින් පැහැර හැර ඇති බැවින් ද,

මැදගම අරුණ චාමින්ද ප්‍රනාන්දු විසින් පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල බන්ධනදායි වශයෙන් උකස්කර ඇති බැවින් ද, එකී අංක 875 සහ 1025 දරන උකස්කර මත පොළිය සමග රුපියල් අසූහත්ලක්ෂ අනූතුන්දහස් එකසිය එකොළහක (රු. 8,793,111.00) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද, 2008.10.30 වන දින සිට වර්ෂයකට සියයට දහනවය (19%) බැගින් රුපියල් අසූහත්ලක්ෂ හතලිස්නවදහස් හයසිය දහතුනක (රු. 8,749,613.00) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් අසූහත්ලක්ෂ අනූතුන්දහස් එකසිය එකොළහක (රු. 8,793,111.00) මුදල අයකරගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 875 සහ 1025 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල (වැලිසර උපකාර්යාලය) ප්‍රාදේශීය සභා සීමාව තුළ හොරපේ (හොරපේතුඩුව) පිහිටි රාගම හොරපේ පාරේ වරිපනම් අංක 89/31 දරන දෙල්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. වී. විජේතුංග විසින් 1997.12.28 දින මැන සාදන ලද අංක 160/97 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම් උතුරට ඃ පාර ද, නැගෙනහිරට ඃ පාර ද, දකුණට ඃ වින්සන්ට් ජයමාන්නගේ ඉඩම සහ බටහිරට ඃ ඇළ ද, යන මෙකී මායිම් තුළ පිහිටි එකී පිඹුර ප්‍රකාර පර්චස් තිස්තුනයි දශම බිංදුවයි හතරක් (අ. 0, රූ. 0, පර්. 33.04) විශාල ඉඩම. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 1011/53 යටතේ ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ නාවින්නේ පිහිටි ජයගත් පාරේ වරිපනම් අංක 65 දරන කහටගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජොයි ද සිල්වා විසින් 1975.09.20 දින මැන සාදන ලද අංක 549 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම් ඊසානට ඃ ජයගත් පාර ද, ගිනිකොනට ඃ ලොට් 6 (අඩි 12ක් පළල පාරක් සඳහා වෙන් කර ඇත) ද, නිරිතට ඃ ලොට් 2 සහ වයඹට ඃ ආර්. ඒ. පෙරේරා ගේ ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ එම් 2274/266 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරනු ලබන පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ ඃ

ඉහත කී නාවින්නේ පිහිටි කහටගහවත්ත නැමැති ඉඩමේ ඉහත කී අංක 549 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 6 (පාරක් සඳහා වෙන් කර ඇත) දරන ඉඩම් කොටසට මායිම් ඊසානට ඃ ජයගත් පාර ද, ගිණිකොනට ඃ ඒ. ඩබ්ලිව්. ලූවිස් පෙරේරාගේ ඉඩම ද, නිරිතට ඃ ලොට් 5 සහ වයඹට ඃ ලොට් 1,2,3 සහ 4 ද යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 549 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2953/220 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමනාකරු,
ඒකාබද්ධ ණය/02.

මහජන බැංකුව,
ඒකාබද්ධ බැංකු අංශය,
අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

06-593

---

### සම්පත් බැංකුව පී.එල්.සී.

(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංකය ඃ 1046 5006 4224.

2007 දෙසැම්බර් මස 27 වැනි දින සම්පත් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

